

# බොඣ්ඣග ධර්ම විභාගය

# බොධ්‍යඞ්ග ධර්ම විභාගය.

උඩුනුවර නාරංවල

විද්‍යාරත්නාකර පරිවේණාධිපති

මාරස්සන සුනන්දාභිධාන මහාස්ථවිරපාදයන් වහන්සේගේ

ශි ෂ්‍ය වූ

මුරුද්දෙනියේ

## පඤ්ඤානන්ද ස්වාමිපාදයන් විසින්

සඞ්ගෘහිතයි

ජී. ඇෆ්. මුනසිංහ

පී. බී. සෙනෙවිරත්න

යන අප විසින්

කොළඹ විද්‍යාභූෂණ යන්ත්‍රාලයෙහි

අච්චු ගස්වන ලදී,

1914

# BODDHAYANGA DHARMA VIBHAGAYA.

Edited by

M. PANNANANDA

Pupil of

M. SUNANDA MAHA STHAVIRA

Vidyaratnakara Pirivena

NARANWALA UDUNUWARA.

Published by

G. F, MUNASINGHA

— and —

P. B. SENEWIRATNA.

PRINTED AT THE VIDYABHUSANA PRESS,

Maradana (*St. Sebastian*)

COLOMBO.

1914

# සං ඥා ප න ය.

—000—

බොධියා අඞ්ගං=බොජ්ඣඞ්ගං, යි දක්වූ හෙයින් බෝධියට (නොහොත්; චතුස්සත්‍යාවබොධයට අඞ්ග (කරුණු) වූයේ බොජ්ඣඞ්ග නම් අනූනාධික්‍යයෙන් සප්තප්‍රමාණවූම ඒ බොධ්‍යඞ්ග ධර්මයන්ගේ යම් විභාග කිරීමක් (බෙදීමක්) වීනම් ඒ බොධ්‍යඞ්ග ධර්ම විභාග නම්වේ එහෙයින් බොධ්‍යඞ්ග ධර්ම විභාගයනම්වූ මේ ධර්ම ප්‍රකරණය විතාගී බොධ්‍යඞ්ග ධර්ම ඥානය ප්‍රාර්ථනාකරණ්නුවන්ගේ මනඃ ප්‍රශාදය එලවන පරිදි පාල්‍යර්ථකථා ප්‍රකරණාදීන් සාරාර්ථ ග්‍රහණයකොට සුඛාවබොධවනසේ සිපිල භාෂායෙන් සංග්‍රහකරණ ලදී එබැවින් මෙය භාවිතා කරණ්නුවන්ට බොහෝ පොත් රාශියක් බැලීමෙන් දතයුතුවූ කරුණු රැසක් මේ එකම කුඩා ධර්ම ප්‍රකරණයෙන් දතහැකිවේ.

බෞද්ධ ජනානුග්‍රහ පිණිස යොදනලද අසමත් ව්‍යාපාරය නොසිස් වනසේ සකල බෞද්ධ ජනයාම සමාදර ප්‍රතිග්‍රහණයෙන් යෙදී මෙය පරිශීලනය කරන්නාහු නම් ලෝකානුකම්පායෙහි නිරතව ක්‍රියා නිෂ්පාදනය කරන්නවුන්ට ඒ අත්‍යන්තොපකාරී බැව් කුමට කියම්ද? ශ්‍රද්ධා බුද්ධි සම්පණ්ණ සකල සජ්ජනකාය මෙය භාවිත බහුලීකෘත වශයෙන් වඩා බොධ්‍යඞ්ග ධර්මාවබොධ කරණයෙන් නිවන් පසක් කිරීමෙහි ප්‍රොත්සාහී වියයුතු බැව් මතක් කරමු.

මෙවැනි ධර්ම ප්‍රකරණයක් සංග්‍රහකොට දුන මැනවැයි ආරාධිත **ජී. ඈප්. මුනසිංහ** අප්පුහාමි හා සූරියගොඩ **පී. බී. සෙනෙවිරත්න** යන මහතුන්ගේ ආයාචනාව පිළිගත් උඩුනුවර නාරංවල විද්‍යාරත්නාකර පරිවෙණාධිපති **මාරස්සන ඤානානන්දාභිධාන** මහාස්ථවිර පාදයන්වහන්සේගේ ප්‍රව්‍රජ්‍යාන්තෙවාසිවූද විද්‍යොදය පරිවෙණාධිපති ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය **ශ්‍රී ඥානෙශ්වරාභිධාන** මහගොඩ නායක ස්ථවිර ස්වාමිපාදයන්වහන්සේගේ ධර්මාන්තෙවාසිවූද මූරුද්දෙනියේ **පඤ්ඤානන්ද** නමැති මාවිසින් ලොකශාසනානුග්‍රහ පූර්වකව සංග්‍රහ කරණ ලදී.

තවද මෙම සංඥාකෘත්‍ය කරණයෙදී අපාචාර්ය වරයෙක්වූ කොලොන්නාවේ විහාරාධිපති ගෞරවාහී **සුගුණ සාරාභිධාන** මහාස්ථවිර ස්වාමිපාදයන් වහන්සේගෙන් යථා ස්ථානයෙහි විශෙෂොපදෙශ ලැබුනු බැව් හා මුද්‍රණයෙහිදී යථාවකාශ වශයෙන් සිඩ් පත්‍ර කීපයක් බලාදුන් බවද ගෞරවයෙන් මතක් කරමි.

ඒ ඇරකොලොන්නාවේවිහාරවාසි වරකාපිටියේ **රතනපාල** ආයුෂ්මතුන්වහන්සේගෙන්ද මිටආධාරලැබුනු බවප්‍රීතියෙන් මතක්කරමි.

නොවරදින සීලි පෘථක් ජනයෙක් නැතිනිසා අපගේ මේ කෘත්‍යයෙහිද, ප්‍රමාදභ්‍රමාදීන් ජනිත දොෂ ඇතිවිය හැකියි එසේ වීනම් ඒ ශාස්ත්‍රාගමධාරී පඬිවරයෝ ක්ෂමාධි සීලිව සොධනය කෙරෙත්වා.

මීට,

**ඈම්. පඤ්ඤානන්ද භික්ෂු.**

වර්ෂ 1914 ක්වූ ජූනිමස 16 වෙනි දින
නාරන්වල විද්‍යාරත්නාකර
පිරිවෙණේදීය.

# බොධ්‍යඞ්ග ධර්ම විභාගය.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

**බොජ්ඣඞ්ගාධිගතං බුද්ධං**
**ධම්මං බොජ්ඣඞ්ගනිස්සිතං**
**බුජ්ඣකාරිය සංඝංච**
**වන්දිත්වා සුද්ධ චෙතසා**

පාලි අට්ඨකථාදීහි ගහෙත්වාන යථානයං
කරිස්සාමි සමාසෙන බොජ්ඣඞ්ගානං විභාවනං.

**ස**කලගුණමණිනිධිප්‍රතිභාග අනන්‍යසාධාරණගුණමහිමොප ලක්ෂිත තථාගතවරචක්‍රවර්ති ස්වාමිවූ භාග්‍යවතුන්වහන්සේ විසින්– "අච්ඡරාසඞ්ඝාතමත්තම්පි චෙ භික්ඛවෙ භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති ධම්මවිචය සම්බොජ්ඣඞ්ගං භාවෙති විරිය සම්බොජ්ඣඞ්ගං භාවෙති පීති සම්බොජ්ඣඞ්ගං භාවෙති පස්සද්ධි සම්බොජ්ඣඞ්ගං භාවෙති සමාධි සම්බොජ්ඣඞ්ගං භාවෙති උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගං භාවෙති"

යනාදීන් බොධ්‍යඞ්ගධර්මවිභාග කොට වදාළසේක. මෙය කවරාර්ථයකින් බොධ්‍යඞ්ග නාම්වීදයත්?

බුජ්ඣනකස්සපුග්ගලස්ස අඞ්ගාති බොජ්ඣඞ්ගා. අපිච! බොජ්ඣඞ්ගාති කෙනට්ඨෙන බොජ්ඣඞ්ගා? බොධාය සංවත්තන්තීති බොජ්ඣඞ්ගා බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා අනුබුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා පටිබුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා සම්බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

යනාදීන් ප්‍රතිසම්භිදාමාර්ගයෙහිද බොධ්‍යඞ්ගාර්ථ විභාග දක්වනලදී. මෙහිදී සාමාන්‍යවශයෙන් බුජ්ඣනක පුද්ගලයාට අවයවවූ ධර්මයෝය යන අර්ථයෙන් බොජ්ඣඞ්ගනම්වී. බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, යනාදී විශෙෂාර්ථයෙන් සොවාන් සකෘදාගාමි අනාගාමි අර්හත් යන සතරමාර්ගඥානාවබොධය කරණ ආර්ය්‍ය ශ්‍රාවකයාට අවයවවශයෙන් නොහොත් හේතුවශයෙන් පවත්නා ධර්මයෝය

යනු බොධ්‍යඞ්ගශබ්දයෙහි භාවාර්ථයයි. "බොධිවූවචති චතුසුමග්ගෙසු ඤාණං,, යනුබැවින් මාර්ගඥානයටද බොධියයි කියනු ලැබේ ඒ මාර්ගඥාන සඞ්ඛ්‍යාතබෝධිහුගේ ප්‍රතිලාභයට හේතුභූත වෙත් යන අර්ථයෙන්ද බොධ්‍යඞ්ග නම්වේ. "සුන්දරො=පසත්ථො වා= බොජ්ඣඞ්ගො සම්බොජ්ඣඞ්ගො; සුන්දරවූහෝ උත්තමවූ බොධ්‍යඞ්ගය සම්බොජ්ඣඞ්ග නමි. "සතිඑව- සම්බොජ්ඣඞ්ගො=සතිසම්බොජ්ඣඞ්ගො, සිහියම සම්බොධ්‍යඞ්ගවූයේ හෙවත් යහපත් අඞ්ගය වූයේ සතිසම්බොධ්‍යඞ්ග නම්වේ. කුමක් අරබයා අඩුහෝ වැඩිහෝ නැතිව බොධ්‍යඞ්ගහතක්ම වදාළෙස්ද යත්? ඒබව අර්ථකථාවෙහි.

කස්මා පන භගවතා සත්තෙව බොජ්ඣඞ්ගා වුත්තා අනූනා අනධිකාති? ලීනුද්ධච්චපටිපක්ඛතො සබ්බත්ථිකතො ච එත්ථ හි තයො ච බොජ්ඣඞ්ගා ලීනස්ස පටිපක්ඛා යථා යස්මිඤ්ච ඛො භික්ඛවෙ සමයෙ ලීනංචිත්තං හොති කාලො තස්මිං සමයෙ ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය කාලො විරිය සම්බොජ්ඣඞ්ගස්ස කාලො පීති සම්බොජ්ඣඞ්ගස්ස භාවනායාති, තයො උද්ධච්චස්ස යථාහ යස්මිං ච ඛො භික්ඛවෙ සමයෙ උද්ධතං චිත්තං හොති කාලො තස්මිං සමයෙ පස්සද්ධි සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය කාලො සමාධි සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය කාලො උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගස්ස භාවනායාති, එකො පනෙත්ථ සබ්බත්ථිකො යථාහ සතිඤ්ච ඛ්වාහං භික්ඛවෙ සබ්බත්ථිකං වදාමි සබ්බත්ථකන්ති පි පාඨො විනානම්පි සබ්බත්ථ ඉච්ඡිතබ්බකන්ති අත්ථො එවං ලීනුද්ධච්ච පටිපක්ඛතො සබ්බත්ථිකතො ච සත්තෙව බොජ්ඣඞ්ගා වුත්තා අනූනා අනධිකා"ති.

මෙහි භාවය නම්? ඌනාධික නොව බොධ්‍යඞ්ගධර්මහතක්ම වදාළේ ලීනඋද්ධච්චදෙකට ප්‍රතිපක්ෂවශයෙනුත් සර්වාර්ථික බැවිනුත්ය මෙහි බොධ්‍යඞ්ගයොතුන්දෙනෙක්ම ලීනභාවයට හෙවත් නීච ප්‍රවෘත්තිකවූ චිත්තයට ප්‍රතිපක්ෂයෝයි; එනම් යම්කලෙක යොගාවචර පුද්ගලයාගේ චිත්තය අලසභාවාදියෙන් පහත්වීනම් එකල්හි ධර්මවිචය සම්බොධ්‍යඞ්ගයාගේ බැවීමටකාලයවෙයි විරිය සම්බොධ්‍යඞ්ගයාගේ බැවීමටකාලයවෙයි; ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයාගේ බැවීමට කාලයවෙයි; උද්ධතභාවයට ප්‍රතිපක්ෂබොධ්‍යඞ්ගයෝ තුන්දෙනෙක්වෙත් එනම් යම්සමයක සිත නොසංසුන් වේද එසමයෙහි ප්‍රශ්‍රබ්ධිබොධ්‍යඞ්ගයාගේ වැඩීමට කාලයවෙයි; සමාධිසම්බොධ්‍යඞ්ගයාගේ වැඩීමට කාලය වෙයි උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයාගේ වැඩීමට කාලය වෙයි; හුදෙක් සතිසම්බොධ්‍යඞ්ගය සර්වාර්ථිකයෙයි හෙවත් දෙපක්ෂයටම ප්‍රයෝජනඇත්තක්වෙයි; කුමක් හෙයින්දයත්? "සතිඤ්ච ඛ්වාහං භික්ඛවෙ සබ්බත්ථිකං වදාමි"යි. වදාළ බැවිනි. "සබ්බත්ථිකං" යනු සබ්බත්ථකං"කියාද පාඨයි එකල්හි සියළුත්‍රිකයට එනම් ත්‍රිකවලට

ම කැමතිවියයුතුය යනුයි මෙසේ ලීනුද්ධච්චදෙකට නිග්‍රහකරණු
සඳහා එකිනෙකට ප්‍රතිපක්‍ෂවශයෙන් හයක්ද සියළුම තන්හි කැ
මතිවියයුතුබැවින් හුදකලාස්මෘතියදූයි කියා බොධ්‍යඞ්ග ධර්ම හතක්
ම වදාරණලදහ. මෙතෙකින් මෙහි පදාර්ථය හා අනූනාධිකත්වයද
සාර්ථිකතාවයද ප්‍රකාශකළෙහ; ඉක්බිති පළමුවෙනි සතිසම්බොධ්‍ය
ඞ්ගය කුමක් ආශ්‍රයකොට පවතීදැයි වදාරණ ලෝකස්වාමිවූ බුදුරජා
නන්වහන්සේ "විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං
වොස්සග්ගපරිනාමිං සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති" යනාදිය වදා
ළසේක; මෙහි විවෙකනිස්සිතං යන්නෙන් සතිසම්බොජ්ඣඞ්ගය වි
වික්තස්වභාව නිශ්‍රිතයයි වදාරණලදී; විවෙකය නම්, කායවිවෙක
චිත්තවිවෙක වශයෙන් දෙවැදෑරුම් නැවත තදඞ්ග විෂ්කම්භන ස
මුච්ඡෙද පටිප්පස්සද්ධි නිස්සරණ වශයෙන් පංචප්‍රකාරවේත්; සතිස
ම්බොජ්ඣඞ්ගය වනාහි පංචප්‍රකාර විවෙකයන් අතුරෙන් තදඞ්ග
සමුච්ඡෙද නිස්සරණ සඞ්ඛ්‍යාත විවෙකත්‍රය අසුරුකරණලද්දේවෙ
යි; තදඞ්ග විවෙකය නම් තත්තත් අඞ්ගයන්ගෙන් ඊට ප්‍රතිපක්‍ෂ
අඞ්ගප්‍රහාණයකොට ලබනලද විවේකයයි එනම් ලොභ ද්වෙෂ
මොහ යන අඞ්ගත්‍රය යමෙකුට යම්වේලාවක ඇතිවීද එකල්හි අලො
භ අද්වෙෂ අමොහ යන අඞ්ග මතුකොට පූර්වාඞ්ගත්‍රය නසයි එකල්හි
චිත්තය සම්බන්ධ යම් විවෙකයක් වී නම් එය තදඞ්ග විවෙක නම් ස
තිසම්බොධ්‍යඞ්ගය වූකලී මූර්ධාසන්ති! ස්වභාවයෙන් ගෞරවූ උපස්ථිත
සති ස්වභාවය ලබා එයින් ජනිත විවෙකයකද ඇසුරු කරණ
ලද්දේවෙයි; සමුච්ඡෙද විවේකය නම් නැවත නූපදිනා පරිද්දෙන්
ඒ ඒ මාර්ගඥාන වලදී ඒ ඒ ක්ලෙශධර්ම මුලිනුපුටාහැරීමෙන් ලබන
ලද විවේකයයි; සතිසම්බොධ්‍යඞ්ගය වනාහි එබඳු සමුච්ඡෙද විවේ
කයද ඇසුරු කරණ ලද්දේවෙයි; නිස්සරණ විවේකය නම් වේද
නාදි සිව්වැදෑරුම් ස්කන්ධයන් සම්බන්ධ මූර්ධසන්ති අඞ්ගයහා රූප
ස්කන්ධ සඞ්ඛ්‍යාත කයත් නැතිකොට ලබන යම් විවේකයක්
ඇත්නම් එයයි; නිර්වාණ නැමති විවේකයයි. සතිසම්බොධ්‍යඞ්ගය
වනාහි මෙබඳු නිස්සරණ විවේකයද ඇසුරු කරණලද්දේවෙයි;
විරාගනිස්සිතයනම්? රූප රාග අරූප රාග මාන උද්ධච්ච අවිජ්ජා
යන සංයොජනපස ප්‍රහාණයකිරීමෙන් ලබන අර්හත්වයයි. සතිසම්බො
ධ්‍යඞ්ගය වනාහි ඒ විරාගයද ඇසුරු කරණ ලද්දේවෙයි; නිරොධ
නිස්සිතය නම් දුක්ඛ නිරොධයයි; හෙවත් ජාත්‍යාදි දුක් නැති
කිරීමෙන් ලබන නිර්වාණයයි ඒ වනාහි මිලිඳු ප්‍රශ්නයෙහි-

"භන්තෙ නාගසෙන නිරොධො නිබ්බානන්ති? ආම මහාරාජාති
කථංභන්තෙ නිරොධො නිබ්බානන්ති. වුත්තං හෙතං මහාරාජ භග
වතා සුතවා බො මහානාම අරිය සාවකො අජ්ඣත්තිකො බාහිරෙ

ආයතනෙ නාභිනන්දති නාභිවදති නාජ්ඣොසාය තිඨති තස්ස තං අනභිනන්දතො අනභිවදතො අනජ්ඣොසාය තිඨතො තණ්හා නිරුජ්ඣති තණ්හානිරොධා උපාදානනිරොධො උපාදානනිරොධා භවනිරොධො භවනිරොධා ජාතිනිරොධො ජාතිනිරොධා ජරා මරණ සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා නිරුජ්ඣන්ති එව මෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති එවං ඛො මහානාම නිරොධො නිබ්බානන්ති, කලෙලාසි භණන්ත නාග සෙනාති!

යනුවෙන් දක්වා තිබේ; සතිසම්බොජ්ඣඞ්ගය වනාහි මෙකී නිරොධයද ඇසුරු කරණ ලද්දේවෙයි; වොස්සග්ග පරිනාමය නම් පරිච්චාග වොස්සග්ගය පක්ඛන්දන වොස්සග්ග යයි දෙවැදෑරුම්වේ; එහි පරිච්චාගවොස්සග්ගය වනාහි තදඞ්ගවශයෙන් විදර්ශනාඥානයෙහිද සමුච්ඡෙදවශයෙන් මාර්ගඥානයෙහිද ක්ලේශප්‍රහාණය කරයි; පක්ඛන්දනවොස්සග්ගයවූකලී විදර්ශනා ඥානයෙහි තන්නින්නභාවයෙන් හා මාර්ගඥානයෙහි ආරම්මණ කරණ වශයෙන්ද නිබ්බාණ පක්ඛන්දනය හෙවත් අරමුණුකිරීම් වශයෙන් චිත්තය නිර්වාණයට පැනයාමද කරයි; මේ සතිසම්බොජ්ඣඞ්ගය වනාහි උක්තප්‍රකාරයෙන් ක්ලේශපරිත්‍යාගයද නිර්වාණපක්ඛන්දනයද කරයි එහෙයින් වොස්සග්ගපරිනාමය දක්වන ඇතැම් අර්ථකථාචාරීහු සතිසම්බොජ්ඣඞ්ගය පඤ්චවිධ විවෙකයම ඇසුරුකරණලද්දැයිද කියත්; මේ ස්ථානයෙහි මෙකී පඤ්චවිධ විවෙකයෙන්ම නිර්වාණය හා "වොස්සග්ගපරිනාමි යන්නෙන් මාර්ගයද දක්වූහ; සෙසු බොජ්ඣඞ්ගයෝද යථොක්ත විවෙකාදිය ඇසුරු කරණ ලදහ; දැන් ස්මෘති සම්බොජ්ඣඞ්ගෝත්පාදයට හෙතු දක්වන්නෝ-

"චත්තාරො ධම්මා සතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්තීති වෙදිතබ්බා සතිසම්පජඤ්ඤං මුට්ඨස්සති පුග්ගලපරිවජ්ජනතා උපට්ඨිතස්සතිපුග්ගලසෙවනතා තදධිමුත්තතාති"යි ප්‍රකාශකළෝ.

මෙහි "සතිසම්පජඤ්ඤං" යනු ස්මෘතිහුගේසම්ප්‍රජානනභාවය යිහෙවත් සම්‍යක්ප්‍රඥා සහගත සිහියයි සම්‍යක්ප්‍රඥා සහගත ස්මෘතිය කොතැන්හි ඇතිවියයුතුදයත්?

"අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරීහොති ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරීහොති සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති සංඝාටිපත්තචීවර ධාරණෙ සම්පජානකාරී හොති අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති උච්චාර පස්සා

ච කම්මෙ සම්පජානකාරී හොති ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති, යි.

වදාළහෙයින් මෙකී ස්ථාන හතක සති සම්ප්‍රජාන භාවයෙන් යුක්තවියයුතුබැව් ''අභික්කන්තාදිසු'' හි සත්තසු ඨානෙසු සතිසම්පජඤ්ඤසහිතෙන'' යනුවෙන් කීහු. මෙහි භාවයනම් යොගාවචර පුද්ගලතෙමේ තමා හෝ අනිකෙක් හෝ ඉදිරියට යාමෙහිද ආපසු කරකැවීමෙහිද ප්‍රඥාවෙන් දැන පරාමර්ශනය කොට භවත් සත්ව නොවූ කායසම්මතවූ ඇටසැකිල්ලෙක් ඉදිරියට යාම් ආදී ක්‍රියා කරන්නේයයි සලකා දැන කරන්නේය. අභිමුඛය බැලීමෙහිද අනුදික් බැලීමෙහිද ප්‍රඥාවෙන් දැන මෙසේයයි බලන්නේය. හස්ත පාදයන් හැකිලීමෙහිද දිගුකිරීමෙහිද ප්‍රඥාවෙන් දැන ඒ ඒ ප්‍රයෝජනය සලකා කරන්නේය. සංඝාටි පාසිවුරු දැරීමෙහිද ධාතුසමූහයෙක් ධාතුසමූහයක්ම වැළඳ ගණී යනාදී ක්‍රමයෙන් ප්‍රඥාවෙන් දැන සැළකීමෙන් යෙදී වැළඳ ගන්නේය. අනුභව කිරීමෙහිද පානය කිරීමෙහිද ඛාද්‍යාදී විකෘතීන් කෑමෙහිද මී සකුරු ආදීන්ගේ රසවිඳීමෙහිද නුවනින් දැන සලකා ප්‍රයෝජන විඳින්නේය. ශරීරයෙන් මල මූත්‍ර පහකිරීමෙහිද ප්‍රඥාවෙන් දැන ආදීනව සලකා ශරීරකෘත්‍යය පවත්වන්නේය. යාමෙහිද සිටීමෙහිද හිඳීමෙහිද නිදීමෙහිත නිදිදුරුකිරීමෙහිද කථනය කිරීමෙහිද කථනය නොකිරීමෙහිද ප්‍රඥාවෙන් දැන ඒ ඒ කෘත්‍යය පවත්වන්නේය යනුයි; ''**මුට්ඨස්සති පුග්ගල පරිවජ්ජනතා**'' නම් හත්ථනික්ඛිත්තකාකයන් සදෘශ මුලාසිහිඇති පුද්ගලයන් හාත්පසින් දුරුකොට වාසය කරණබවයි. කවුඩෝ වනාහි බොහෝවූ ආහාර ලැබුනවිට හැකිතරම් ඔහුගේ තුඩින් ගෙණ ගොස් ඒ ඒ රුක් සිදුරුවලහා අතුපතර අතරෙහිද සඟවා තබා නැවත ඒ සොයා ගෙණ කෑමට සිහි නැත්තාහු වෙත්; මොහොතකින් මුළාවන ස්වභාවය ඇති කවුඩන් වැනි පුද්ගලයන්ගෙන් වියෝව විසීමත් සතිසම්බොජ්ඣඞ්ගයාගේ උත්පාදයට හේතුවක්වේ; **උපට්ඨිත සති පුග්ගල සෙවනතා**, යනු එළඹසිටි සිහිඇති පුද්ගලයන් සේවනය කරණබවයි, තිස්සදත්තස්ථවිර අභයස්ථවිරාදී එළඹ සිටි සිහි ඇති පුද්ගලයන් සේවනය කිරීමද සතිසම්බොජ්ඣඞ්ගොත්පාදයට හෙතුවක්වේ; "තත්‍ථ උපට්ඨිත සතී නාම චිරකතාදීනං අනුස්සරිතාරො මහාගජිම්බ අභයත්ථෙර දීඝභාණක අභයත්ථෙර චූලාභයත්ථෙරා විය" එහි එළඹසිටිසිහිඇත්තාහුනම් චිරකෘතාදීන්ගේ වශයෙන් අනුස්මරණය කරණ මහාගජිම්බ අභයස්ථවිරාදීහු වැන්

තෝයි; මහාගතිම්බනම් අභයසථවිරතෙමේ මව්කුසින් නික්මීම් සඞ්ඛ්‍යාත උත්පත්තියෙන් පස්වෙනි දවසෙහි මඞ්ගල්‍ය ක්ෂීරපායාසයෙහි තුණ්ඩප්‍රසාරණයකරන්නාවූ කවුඩෙකුදැක හූහූ යන අනුකරණ ශබ්දයක් පැවැත්තුවේය. ඊට පසු වෘද්ධිප්‍රාප්ත ඒ කුමාරතෙමේ මහණ උපසම්පදා ලැබ සථවිරයෙකුතෙක්වූ සඳ ස්වාමීන්වහන්ස නුඹවහන්සේ කවර කලක පටන් කළ කීඩේ සිහි කරණසේක්දැයි අන් කෙනෙකු විසින් විචාරණ ලද්දේ ඇවැත්නි ඉපද පස්වෙනි දවසෙහි කරණලද හූ හූ යන අනුකරණ ශබ්දය කළ තැන් පටන් සිහිකරන්ට පිළිවනැයි කීයේය; ඒ තරම් කුඩාකාලයේ පටන් කළකීඩේ සිහිකරන්ට පුළුවන් උපඝිත සති භාවයක් ඒ මහාගතිම්බ අභයසථවිරයන්වහන්සේට ඇයි වූයෙන් උන්වහන්සේද එලඹසිටි සිහිඇත්තේවිය. දීඝභාණක අභයසථවිරයන්වහන්සේ ඉපද නවවෙනි දවසෙහි පුතු ඉඹිනමියි සිතා මවු නැමෙන කල ඇයේ කොණ්ඩය ලිහීගියේය; ඒ හේතුවෙන් කොණ්ඩයි පැලඳ තුබූ තිඹක් පමණ දෑ සමන් මල් දරුවාගේ ලය මතුයෙහි වැටී දුක් උපන ඒ දරුතෙමේ වැඩිවයසට පැමිණ මහණඋපසම්පදා ලැබ මහ තෙරකෙනෙක්වූ කල්හි කෙනෙකුවිසින් ස්වාමීනි කවරකලක පටන් කළ කීඩේ සිහිකරණසේක්දැයි විචාරණ ලද්දේ උපන් නවවෙනි දිනයෙහි පටන්යයි කීයේය, මේ සථවිරතෙමේත් කුඩා කල පටන් කළදේ සිහි ඇතිවූයෙන් එලඹ සිටි සිහි ඇත්තේවිය; ති පිටක චූලාභයසථවිර තෙමේ දෙරටු සතරක් ඇති අනුරාධ පුරනගරයෙහි දෙරටු තුනක් වසා එක දෙරටුවකින්ම උදෑසනකාලයෙහි මහජනයා ඇතුල් කරවා නුඹ කිනම් ඇත්තෙක්ද නුඹ කිනම් ඇත්තෙක්දැයි නාමය විචාරයි සවස් කාලයෙහි එසා මහත් ජනයා යථොක්ත පරිදි එක දෙරටුවකින්ම බැහැර යන කල්හි මේ අසවල් නමැත්තාය මේ අසවල් නමැත්තායයි නොවිචාරාම ඔවුන්ගේ නාමයන් කියන්ට සමර්ථ සිහි ඇති කෙනෙක් විය එහෙයින් ඒ තෙරනුවෝද උපඝිත සති ඇත්තෙක් වීය. මෙබඳු උපඝිත සති පුද්ගලයන් සේවනය කිරීමද සතිසම්බොධ්‍යඞ්ගොත්පාදනට හේතුවක් වන්නේය "තදධිමුත්තතා" නම් ඊට අධිමුක්ත භාවය හෙවත් ස්ථාන නිෂද්‍යාදිය කිරීමෙහිදී ඊට නම්නාවූ හෙවත් නැමුනාවූ සිත්ඇති බවයි "ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ" යනාදී තන්හි මම දැන් මේ මේ ඉරියව් පවත්වමි මේ කටයුතුකරමියි කියා ඒ ඒ කටයුතුකෙරෙහි නැමුනු සිත් ඇතිබවයි එහෙයින් මෙකී චතුර්වධ

හෙතු ධර්මයන්ගෙන් යුත් ආදිකර්මිකකුල පුත්‍රතෙමේ සති සම්බොධ්‍යඞ්ගය උපදවා ඒම බුර කොට හෙවත් උසුලා ගෙණ අභිනිවෙසය පිහිටුවා පිළිවෙලින් අභිඥාය ගනියි ඒ යෝගාවචර පුද්ගලතෙමේ අර්හත්වයාගේ ලැබීම යම්තාක්නම් ඒතාක් සති සම්බොධ්‍යඞ්ගය වඩත්නේ වෙයි අර්හත් ඵලයෙහි පිහිටි කල්හි භාවිත නම්වෙයි හෙවත් සතිසම්බොධ්‍යඞ්ගය වඩනුලැබූ කෙනෙක් වෙයි. ඒ අර්හත්වය ලැබීමත් සෝවාන්ආදී මාර්ග පිළිවෙලින්ම ලැබියයුතුවේ සති සම්බොධ්‍යඞ්ගය මුහුකුරාගියකල නොහොත් ලෝකෝත්තරවනකල්හි එය උපදවන යෝගාවචර පුද්ගලයා සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බත පරාමාස යන සංයොජනත්‍රය සහ මක්ඛො පලාසො ඉස්සා මච්ඡරියං මායා සාඨෙය්‍යං යනාදීන් දක්වන කෙලෙස් කොටස් සඞ්කූත් සමුච්ඡෙද වසයෙන් ප්‍රහාණය කොට සෝවාන් ඵලයෙහි පිහිටියේවෙයි සක්කායදෘෂ්ටිය නම් "අත්තනො කායො=සක්කායො තස්මිං දිට්ඨි=සක්කායදිට්ඨි" යනු බැවින් සම්මුති වශයෙන් සත්ව පුද්ගල යයි ව්‍යවහාරයෙහි පවතින තමන්ගේ ශරීරය සක්කාය නම්, එහි උපදවා ගන්න ආත්ම දෘෂ්ටිය සක්කාය දෘෂ්ටිනම්වේ; ඒ සක්කාය දෘෂ්ටිය නම්·

"රූපං අත්තතොසමනුපස්සති රූපවන්තං වා අත්තානං අත්තනි වා රූපං රූපස්මිං වා අත්තානං වෙදනං අත්තතො සමනුපස්සති වෙදනාවන්තංවා අත්තානං අත්තනි වා වෙදනං වෙදනායවා අත්තානං සඤ්ඤා අත්තතො සමනුපස්සති සඤ්ඤාවන්තං වා අත්තානං අත්තනි වා සඤ්ඤං සඤ්ඤාය වා අත්තානං සඞ්ඛාරෙ අත්තතො සමනුපස්සතිසඞ්ඛාරවන්තං වා අත්තානං අත්තනි වා සඞ්ඛාරෙ සඞ්ඛාරසම්ංවා අත්තානං විඤ්ඤාණං අත්තතො සමනුපස්සති—පෙ—විපරියෙසගාහො ඉදං වුච්චති වී සති වත්ථුකා සක්කායදිට්ඨි"

යනාදී වසයෙන් එක එකසම්බන්ධයෙහි සතර සතරබැගින්මේ ආත්ම දෘෂ්ටිය විංශතිආකාරවේ; බුද්ධශාසනයෙන් බාහිර ශීල ව්‍රතය න්පරාමශීනය කිරීම හෙවත් නිවන් ලබනු සඳහා බුද්ධශාසනයෙන් පිටත්හිවූ ශීලව්‍රතයන් සමාදන්වීම සීලබ්බතපරාමාසනම්වේ; "බුද්ධෙ කඞ්ඛති ධම්මෙ කඞ්ඛති සංඝෙ කඞ්ඛති සික්ඛාය කඞ්ඛති පුබ්බන්තෙ කඞ්ඛති අපරන්තෙ කඞ්ඛති පුබ්බන්තාපරන්තෙ කඞ්ඛති ඉදප්පච්චයතා පටිච්ච සමුප්පන්නෙසු ධම්මෙසු කඞ්ඛති" නාදීන් බුදුන්හා බුදුගුණ ඇද්ද නැද්ද ධර්මය හා ධර්මයෙහිව සගුණ ඇද්ද නැද්ද යනාදී වසයෙන් එකක් නිශ්චය කරගත්

නොහැකිව බුඩාදි අට තැනක සැකකිරීම විචිකිච්ඡා නම්වේ,
මෙකී සංයොජනත්‍රය හා යථොක්ත මකු ගුණය ආදී කෙලෙස්
නසා සෝවාන්වූ පුද්ගලයා එකබීජී කොලංකොල සත්තක්ඛත්තු
පරමයයි ත්‍රිවිධවේ; ඔහු "දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා, දුක්ඛාපටි
පදා ඛිප්පාභිඤ්ඤා, සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා, සුඛා පටිපදා ඛිප්පා
භිඤ්ඤා,,යි දුක්වූ ප්‍රතිපදාවෙන් ප්‍රමාදව ෂට් අභිඥාවත් ලබත්තෝය
දුක්වූ ප්‍රතිපදාවෙන් වහාමෂට් අභිඥාවත් ලබත්තෝය යනාදී වශ
යෙන් ප්‍රතිපදාවේනැටියට දෙලොස්දෙනෙක්ද මාර්ගස්ථයන්සමග වූ
කලි දහතුන් දෙනෙක් වෙත්, ඒ දහතුන්දෙන ශ්‍රද්ධාධිකප්‍රඥාධිකවශ
යෙන් සවිස්සෙක්වෙති, මෙසේ සෝවාන් පුද්ගලයාගේ ප්‍රභෙදය
සවිසි ආකාරවේ, සොවාන් පුද්ගලයා කාමරාග ව්‍යාපාද යන සං
යොජන වය හා ක්‍රොධ පටිඝ උපනාහ පමාද යන කෙලශයන්
නැතිකිරීමෙන් ශකෘදගාමිවේ, ශකෘදගාමි පුද්ගලයා භව වශයෙන්
එනම් කාමලෝකයෙහි ශකෘදගාමි පුද්ගලයාය රූප ලෝකයෙහි
ශකෘදගාමි පුද්ගලයාය අරූපලෝකයෙහි ශකෘදගාමි පුද්ගලයායයි
ත්‍රිවිධවේ, මේතුන්දෙන යටකියනලද ප්‍රතිපදා සතර වසයෙන් දෙ
ලොස්දෙනෙකි මාර්ගස්ථයන් සමග දහතුන්දෙනෙක් වෙත් ඒ දහ
තුන්දෙන ශ්‍රද්ධාධුර ප්‍රඥාධුර වසයෙන් සවිස්සෙක මෙසේ ශකෘදගාමි
පුද්ගලයා ප්‍රභෙදවසයෙන් සවිසිදෙනෙක් වෙත් ශකෘදගාමී පුද්ග
ලයා ශකෘදගාමි වීමේදී තුනීකළ කාමරාග ව්‍යාපාද යනසංයොජන
වයහා පටිඝ ක්‍රොධ උපනාහ පමාද යන කෙලශයන් සමුච්ඡෙද වශ
යෙන් ප්‍රහාණය කොට අනාගාමිවේ; අනාගාමි පුද්ගලයා අවිහ
අතප්ප සුදස්ස සුදස්සී අකනිඨක යන ස්ථානනාමයෙන් පස්
දෙනෙක් වෙත්, එයින් අවිහ අතප්ප සුදස්ස සුදස්සී යන අනාගාමීහු
සතරදෙනඅන්තරාපරිනිබ්බායි උපහච්චපරිනිබ්බායි අසංඛාරපරිනි
බ්බායි සසංඛාරපරිනිබ්බායි උද්ධංසොතඅකනිඨගාමී,,යනාදිවසයෙන්
එක එක පුද්ගලයා පස් පස් දෙනෙක් වීමෙන් සමවිසිදෙනෙක්ද
අකනිඨක පුද්ගලයා හෙවත් අකනිට්ඨා බඹලොව උපන් අනාගාමි
පුද්ගලයා උද්ධංසොත අකනිඨගාමී භාවයක් නැති හෙයින්අන්තරාප
රිනිබ්බායි ආදීසතරදෙනහා මාර්ගස්ථයාදුයි කියා පස්විස්සෙක්වෙත්,
නැවත ශ්‍රද්ධාධුර ප්‍රඥාධුර වශයෙන් බෙදී අනාගාමි පුද්ගලයෝ
පණස්දෙනෙක් වෙත්, ඒ අනාගාමිපුද්ගලයා රූපරාග අරූපරාග
මාන උද්ධච්ච අවිජ්ජා යනසංයෝජන පසහා අභිජ්ඣා ථම්භ සාර
ම්භ මානාතිමාන මද යනකෙලශයන්ද සමුච්ඡෙද වශයෙන් නසා
රහත්වේ, අර්හත් පුද්ගලයා ශුෂ්කවිදර්ශකය සමථයානිකයයි ද්විවිධ
වූයේ මාර්ගස්ථයන් සමග ත්‍රිවිධවේ; නැවත ශ්‍රද්ධාධුර ප්‍රඥාධුර වශ

යෙන් සදෙනෙක්වේ; සෝවාන්පුද්ගලයෝ (24) සූවිසිදෙනෙක
සකෘදාගාමි පුද්ගලයෝ (26) සවිසිදෙනෙක අනාගාමීපුද්ගලයෝ
(50) සමපණසෙක අර්හත්පුද්ගලයෝ (6) සදෙනෙකැයි කියා ආර්ය
පුද්ගලයෝ (108) එකසියඅටදෙනෙකි සප්ත සම්බොධ්‍යඞ්ගය වැඩූ පුද්
ගලයාත් සෝවාන් ආදී මාර්ග පිළිවෙළින් ඒ ඒ තන්හිදී දසසං
යෝජනයන්හා සෙසුකෙලෙසුන්ද නසා අමෘතමහා නිර්වාණයට
පැමිණෙන්නේ වෙයි; ආර්ය පුද්ගල විභාගය සුත්‍රනිපාත අටුවා
වෙහි මෙසේ දක්වා තිබේ;

“එක බීජී කොලං කොලො සත්තක්ඛත්තුපරමොති තයො
සොතාපන්නා කාමරූපාරූපභවෙසු අධිගතඵලා තයො සක
දාගාමිනො තෙ සබ්බෙපි දුක්ඛාපටිපදාදීනංචතුන්නං පටිපදානං
වසෙන චතුවීසති හොන්ති; අන්තරාපරිනිබ්බායි උපහච්චපරි
නිබ්බායි අසංඛාර පරිනිබ්බායි සසංඛාරපරිනිබ්බායි උද්ධංසො
තොඅකනිට්ඨගාමීති අවිහෙසු පඤ්ච තථා අතප්පෙසු සුදස්සෙසු සු
දස්සීසු අකනිට්ඨෙසු පන උද්ධංසොතවජ්ජා චත්තාරොති චතුවී
සති අනාගාමිනො සුක්ඛවිපස්සකො සමථයානිකොති ද්වෙ අරහ
න්තා චත්තාරො මග්ගට්ඨාති චතුපඤ්ඤාස හොන්ති තෙ ස
බ්බෙපි සද්ධාධුර පඤ්ඤාධුරානං වසෙන දිගුණා හුත්වා අට්ඨසතං
හොන්ති

මේ සම්බන්ධ විස්තරවිභාගය පුග්ගලප්‍රකරණ අටුවාවෙහි මෙසේ
දක්වාතිබේ. ධම්මවිචය සම්බොජ්ඣඞ්ගං භාවෙති, ධම්මං විචිනා
තීති=ධම්මවිචයො, චතුරාර්ය සත්‍යධර්මයන් රුස්කෙරේනුයි විචී
නයකෙරෙනුයි ධම්මවිචය නම්. නොහොත් චතුරාර්ය සත්‍ය ධර්මය
න් කොටස්කෙරේනුයි ධම්මවිචය නම් වේ; බොධාය සංවත්තතීති-බො
ජ්ඣඞ්ගො,, චතුරාර්යසත්‍යාවබෝධය පිණිස පවතීනුයි, බොජ්ඣ
ඞ්ගනම්වේ; සුන්දරො පසත්ථො වා බොජ්ඣඞ්ගො-සම්බොජ්ඣඞ්ගො;
සුන්දරවූ හෝ ප්‍රශස්තවූ බොධ්‍යඞ්ගය සම්බොජ්ඣඞ්ග නම්;“ධම්මවිච
යොඑවසම්බොජ්ඣඞ්ගො-ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො. ධර්මවිච
යම සුන්දරවූ බෝධ්‍යඞ්ගයක් වේනුයි ධම්මවිචය සම්බොධ්‍යඞ්ග නම්,
චතුරාර්ය සත්‍ය ධර්මයන් රුස්කිරීම හෝ කොටස්කරබැලීම එම
චතුරාර්ය සත්‍යාව බොධයට හෝ මාර්ගඥානාවබෝධයට සුන්ද
රවූ අඞ්ගයක්වේනුයි යන අර්ථයෙන් ධම්මවිචය සම්බොධ්‍යඞ්ග නම්
වේ යනු භාවයි, මේ ධම්මවිචය සම්බොධ්‍යඞ්ගයාගේ උත්පාදයට
හේතු ධර්ම හෙවත් කාරණයෝ සතක් වෙත්. ඒ බව අර්ථක
ථාවෙහි-

සත්තධම්මා ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති පරිපුච්ඡකතා වත්ථුවිසදකිරියතා ඉන්ද්‍රිය සමත්ත පටිපාදනා දුප්පඤ්ඤපුග්ගල පරිවජ්ජනා පඤ්ඤවන්ත පුග්ගලසෙවනා ගම්භීර ඤාණචරිය පච්චවෙක්ඛනා තදධිමුත්තතාති"

යනුවෙන් දක්වාතිබේ; **පරිපුච්ඡකතා නම්** මේ මේ ධර්මයන්ගේ අර්ථ කවරේදැයි පිළිවිසීම් බහුලබවයි කිනම් ධර්මයන්ගේද යත්? "තත්ථ පරිපුච්ඡකතාති ඛන්ධ ධාතු ආයතන ඉන්ද්‍රිය බල බොජ්ඣඞ්ග මග්ගඞ්ග ඣාන සමථ විපස්සනානං අත්ථ සන්නිස්සිත පරිපුච්ඡා බහුලතා"යි දැක්වූ හෙයින් රූප වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ සංඛ්‍යාත පඤ්චස්කන්ධය සම්බන්ධ පරිපුච්ඡාබාහුල්‍යයයි හෙවත් අර්ථසන්නිශ්‍රිතව බහුල වශයෙන් විචාරීම් ඇති බවයි; මෙහි රූපස්කන්ධය කවරාර්ථයෙන් රූපස්කන්ධවීදයත්? රුප්පනාර්ථයෙන් රූපද සමූහාර්ථයෙන් ස්කන්ධද වේත්, "කෙන රුප්පති? සීතෙනපි රුප්පති උණ්හෙනපි රුප්පති ජිඝච්ඡායපි රුප්පති පිපාසායපි ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙනපි රුප්පතීති ඛො භික්ඛවෙ තස්මා රූපන්ති වුච්චතීති" යනුවෙන් රුප්පනාකාරදක්වයි සත්වයාගේ ශරීරය වනාහි සීතලෙන් නැසීම හෙවත් විනාශවීම ලොකාන්තරිකනම් නරකයෙහි ප්‍රකට වශයෙන් පැණෙයි, එනම් චක්‍රවාට තුනක් තුනක් අතර එක එක ලොකාන්තරික නිරයක් ඇත්තේ වෙයි එහි ප්‍රමාණ වශයෙන් යොදුන් (8000) අටදහසක් පමණ ප්‍රදෙශය වෙයි ඒ නරකයාගේ යටභාගයෙන් පෘථිවියක්ද ඇත්තේ නොවෙයි, මතුභාගයෙන් චන්ද්‍ර සූර්‍ය ප්‍රදීප මාණික්‍යාලෝකයක්ද ඇත්තේ නොවෙයි, නිත්‍යයෙන් අන්ධකාරවූ ලෝකයෙක් වෙයි, එහි උපන් සත්වයින්ගේ ශරීරප්‍රමාණය තුන් ගව් පමණවෙයි, ඒ නිරිසත්තු වවුලෝ මෙන් චක්‍රවාටපර්වත පාදයෙහි දිගපලල නියවලින් ලග්නව හිස් යටිකුරුවූවෝ එල්බ වෙසෙත් යම්කලක යැපෙන්නාහු ඔවුනොවුන්ගේ අත්පසට පැමිණියාහු වෙත්ද එකල්හි අප විසින් අහරක් ලබනලදැයි සිතමින් එහි ව්‍යාවෘතවූවාහු හෙවත් උත්සාහවත්වූවාහු පෙරලී ලෝක සන්ධාරක ජලයෙහි පතිතය වෙත්, යලිදු සීතවූ වාතය හමණයවූ කල්හිද එම වාතවේගයෙන් පක්වමධූක ඵලයක්මෙන් ගිලිහී ජලයෙහි වැටෙත්, එකණෙහිම අත්‍යන්ත ක්ෂාරවූ සීතල් ජලය හේතුකොටගෙණ සුන්වූ සම් නහර මස් ඇට බිඳීමෙන් යුක්තව කකාරණලද තෙලෙහි බහාලූ පිටි පිඩක්මෙන් පටපටයන අනුකරණයෙන් විලීයෙත්, මෙසේ සත්වයක්ගේ ශරීරය සීතලහේතුකොටගෙණ රුප්පනාර්ථයෙන්ද රූපනම්විය, එහෙයින් "සීතෙන තාව රුප්පනං ලොකන්තරික

නිරයෙ පාකටං තිණ්ණං තිණ්ණං හි චක්කවාළානං අන්තරෙ එකෙ
කො ලොකන්තරිකනිරයො නාම හොති අට්ඨ යොජන සහස්සප්ප
මාණො යස්ස නෙව හෙට්ඨා පඨවි අත්ථි න උපරි චන්දිම සූරිය දීප
මණි ආලොකො නිච්චන්ධකාරො තත්ථ නිබ්බත්තසත්තානං තිගා
වුතො අත්තභාවො හොති තෙ වග්ගුලියො විය පබ්බතපාදෙ දීඝ
පුථුලෙහි නඛෙහි ලග්ගිත්වා අවංසිරා ඔලම්බන්ති යදා සංසප්පන්තා
අඤ්ඤමඤ්ඤස්ස හත්ථපාසං ගතා හොන්ති අථ භක්ඛො නො ල
ද්ධොති මඤ්ඤමානා තත්ථ වාවටා විපරිවත්තිත්වා ලොකසන්ධාරක
උදකෙ පතන්ති සීතවාතෙ පහරන්තෙපි පක්කමධුක ඵලානි විය
ඡිජ්ජිත්වා උදකෙ පතන්ති පතිතමත්තාව අච්චන්ත ඛාරෙන සීතො
දකෙන ඡින්නචම්මන්හාරුමංස අට්ඨීනි භිජ්ජමානෙහි තත්ත තෙලෙ
පතිත පිට්ඨපිණ්ඩං විය පටපටායමානා විලීයන්ති"යි කීහු,

උණ්හගත රුප්පනං අවීචිමහානිරයෙ පාකටං තත්ථ හි තත්තාය
ලොහපඨවියා නිපජ්ජාපෙත්වා පඤ්චවිධ වධ බන්ධනාදි කාරණකාලෙ
සත්තා මහාදුක්ඛං අනුභවන්ති"

යනුවෙන් උෂ්ණයෙන් නැසීම අවීචි මහානරකයෙහි ප්‍රකට
වශයෙන් පෙණෙයි, එහි උපන් නිරිසත්තු රත්වූ ලොහෝ
පොළොවෙහි උඩුකුරුව සයනයකරවා රත්වූ ලොහොගුලි අත
ගැන්වීම් ආදීවූ පඤ්චවිධ වධබන්ධනයන් කාරණකළ්හි මහත්වූ
දුකක් අනුභවකෙරෙත්; ඒ දුක් හෙතුකොටගෙණද නැසෙන
බැවින් රුප්පනාර්ථයෙන් රූපනම්විය; බඩගින්නෙන් නැසීම ප්‍රේත
ලෝකයෙහිහා දුර්භික්ෂකාලයෙහිද ප්‍රකටවශයෙන් පෙණේ ඒ බව-

"පෙත්තිවිසයස්මිං හි සත්තා ද්වෙ තීනි බුද්ධන්තරානි කිඤ්චි
දෙව ආමිසං හත්ථෙන ගහෙත්වා මුඛෙ පක්ඛිපන්තානාම න හො
න්ති අන්තොඋදරං ආදිත්ත සුසිර රුක්ඛො විය හොති දුබ්භික්ඛෙ
කජ්ජකමත්තම්පි අලභිත්වා මරණප්පත්තානං පමාණං නාම නත්ථි,

යනුවෙන් දක්වාතිබේ, මෙහි භාවය නම්? ප්‍රේතලෝකයෙහි
වාසය කරණ සත්වයෝ වනාහි බුද්ධාන්තර දෙකක් තුනක් මුළුල්
ලෙහි කැසුතු කිසියම් ආමිසාංශයක් හස්තයෙන් ගෙණ මුඛයෙහි
ප්‍රක්ෂෙප කරන්නාහුනම් නොවෙත් උදරාභ්‍යන්තරය ගිනිගත් රුක්
සිදුරක්මෙන් වෙයි; දුර්භික්ෂ කාලයෙහි කැඳපමණවත් නොලැබ
මරණ ප්‍රාප්තවූවන්ගේ ප්‍රමාණයක් නම් නැත්තේය යනුයි; මෙ
යින් බඩගින්නෙන් නැසීම හේතුකොටගෙණද සත්වයාගේ ශරීර
යට රූපයන ව්‍යවහාරයවේ; පිපාසය හෙතුකොටගෙණ නැසීම
කාලකඤ්ජකාදී අසුරලෝකයන්හි ප්‍රකටවශයෙන් පෙණේ එහි උප
න්නාවූ අසුරයෝ වනාහී බුද්ධාන්තර දෙකක් තුනක් ගතවුනත්

හෘදය තෙමාගන්න පමණටවත් දිව තෙමාගන්න පමණටවත් දිය බිඳුවක් ලබන්ට නොහැකිවූවෝ වෙත්; පැන් පානය කරන්ට ඕනෑය යන අපිසෙන් ගඟාවකට පැමුනුණොත් ඒ ගඟාව වැලිතලාබවටයේ; මහාසාගරයට පැමිණියවුන්ට පවා ඒ මහා සමුද්‍රය කුඩුගලක්හා සදෘශ වෙයි එබැවින් ඒ සත්වයෝ පිපාසයෙන් වියලෙන්නාහු බලවත් දුකින් පෙළෙමින් හැසිරෙන්නෝ වෙත් ඒ බව–

"පිපාසාය රුප්පතං කාලකඤ්ජාදිසු පාකටං තස්ස හි සත්තා වෙ තීනි බුද්ධන්තරානි හදය තෙමන මත්තං වා ජිව්හා තෙමන මත්තං වා උදක බින්දුං ලද්ධුං නාසක්කොන්ති පානීයං පිවිස්සාමාති නදිගතානම්පි නදී වාළිකාතලං සම්පජ්ජති මහාසමුද්දං පක්ඛන්තානම්පි මහාසමුද්දො පිට්ඨිපාසාණො විය හොති තෙ සුස්සන්තා බලව දුක්ඛ පීළිතා විචරන්ති"

යනුවෙන් දක්වා තිබේ; එක්තරා කාලකඤ්ජක අසුරයෙක් පිපාසය ඉවසාගත නොහැකි වන්තේ ගැඹුරෙන් හා පුළුලින් යොදුනක් පමණඇති මහත්වූ ගඟාවකට බැස්සේය ඔහු ගිය ගිය තැන ජලය සිඳීයයි දුම නගියි ගිනියම්වූ කුඩුගලක සක්මන් කරණ කාලයක්හා සමාන වෙයි මාරුත වේගයෙන් ජලයාගේ එහෙමෙහෙ ගමන්කරණ ශබ්දය අසා ඔබමොබ හැසිරෙන්නාවූ ඔහට රාත්‍රියද පහන්ව ගියේය එසේ එළිවූ කල්හි උදෑසනම භික්ෂාචාරයෙහි හැසිරෙන්නාවූ තිස්නමක් පමණ පිණ්ඩචාරික භික්ෂූන්වහන්සේ ඒ අසුරයාව දැක සත්පුරුෂය! තුඹ කිනම් ඇත්තෙක්දැයි විචාළෝය ස්වාමීන්වහන්ස මම ප්‍රෙතයෙක් වෙමියි උත්තරදුන්නේය ඒ භික්ෂූන්වහන්සේලා තුඹ කුමක් සොයන්නෙහි දැයි විචාළාහ; ස්වාමීනි මම පැන් පානය කරණු කැමැත්තෙන් සොයමියි කී කල්හි එම්බල පුරුෂය මේ ගඟ පිරී තිබෙනවා නොපෙනේද කිම තොපට ඒ නොපෙණෙන්නෙහි දැයි ඇසූහ එකල්හි ඔහු කියනුයේ ස්වාමීන්වහන්ස ඒ මාවෙත නොපැමිණෙයි හෙවත් ඒ මට නොපෙණේයයි කීය; එසේනම් තොප ගඟා මතුයෙහිනිෂද්‍යයකරව එකල තොපගේ මුඛයෙහි පැන් වත්කරන්නෙමුයි හෙතම වැලි තලාවෙහි උඩුකුරුව හොත්තේය භික්ෂූන්වහන්සේලා තිසක් ප්‍රමාණ පාත්‍රාවලින් ජලය ගෙණ ඔහුගේ මුඛයෙහි වත්කළාහුය; එසේ පැන් වත්කරද්දීම උන්වහන්සේලාට පිණ්ඩපාත කාලය එළඹසිටියේය ඒ හේතුකොටගෙණ භික්ෂූන්වහන්සේලා ඔහට කථාකොට කියන්නාහු සත්පුරුෂය අපට දැන් භික්ෂාචාර වේලාවත් සම්ප්‍රාපත විය කිමෙක්ද තුඹ ආශ්වාස මාත්‍රයෙක්වත් ලැබූයෙහිදැයි කීහ කාලකඤ්ජකනම් අසුරනිකායික

ප්‍රේතතෙම කියනුයේ ඉදින් ස්වාමීනි තිස්තමක් පමණ ආයුෂ්මතුන්වහන්සේ විසින් තිහක් පමණ පාත්‍රාවලින් වත් කරණලද ජලයෙන් අඩපතක්පමණකුදු යටිළගුරව ගියේනම් ප්‍රේතාත්ම භාවයෙන් මිදීමක් නොවේවායි කීය පිපාසයෙන් නැසීම යථොක්ත අසුරනිකායෙහි මෙසේ ප්‍රකටයි; මැසි මදුරු ආදීන්ගෙන් නැසීම ඒ ඒ සත්වයෝ බහුල ප්‍රදෙශවල ප්‍රකටවේ; වාතයෙන් නැසීම ෂට්විධ වාතය කෝප වීමෙන් බැව් ප්‍රකටයි; අව්වෙන් නැසීම මරුකාන්තාරාදියෙහි ප්‍රකටව පෙණේ, ඒ බව-

"එකා කිර ඉත්ථි මරුකන්තාරෙ රත්ති සබ්බතො ඔහීනා දිවා සූරියෙ උග්ගච්ඡන්තෙ වාලිකාය තපපමානාය පාදෙ ඨපෙතුං අසක්කොන්ති සීසතො පච්ඡිං ඔතාරෙත්වා අක්කමි කමෙන පච්ඡියා උණ්හාභිතත්තාය ඨාතුං අසක්කොන්ති තස්සා උපරි සාටකං ඨපෙත්වා අක්කමි තස්මිංපි සන්තත්තෙ අංකෙන ගහිතං පුත්තකං අධොමුඛං නිපජ්ජාපෙත්වා කන්දන්තං කන්දන්තං යෙව අක්කමිත්වා සද්ධිං තෙන තස්මිං යෙව ඨානෙ උණ්හාභිතත්තා කාලමකාසි"

යනුවෙන් දක්වනලදී, සර්පයින්ගෙන් නැසීම දීඝජාතික සර්පයන් දෂ්ටකලවිට ප්‍රකටව පෙණේ; මෙතෙක් කාරණයෙන් රූපප්‍රාණියෙන් රූප යන වචනය හෙවත් නාමය සත්වයින්ගේ ශරීරයට ව්‍යවහාර කරණුලැබේ, දැන් එනාහි ඒ රූප ශබ්දයෙන් ගම්‍යමාන අර්ථරාශිය හෙවත් ගනුලබන අටවිසිරූප කොට්ඨාස යන් සැකෙවින් දක්වනු ලැබේ; එනම්?

භූතප්පසාද විසයා භාවො හදය මිච්චපි
ජීවිතාහාර රූපෙහි අට්ඨාරස විධං තථා
පරිච්ඡෙදො ච විඤ්ඤත්ති විකාරො ලක්ඛණන්ති ච
අනිප්ඵන්නා දසචෙති අට්ඨවීස විධං භවෙ——

පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු චක්ඛුසොත ඝාන ජිව්හා කාය රූප ශබ්ද ගන්ධ රස ඵොට්ඨබ්බ ඉත්ථත්තං පුරිසත්තං හදයවත්ථු ජීවිතින්ද්‍රිය ආකාසධාතු කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති ලහුතා මුදුතා කම්මඤ්ඤතා උපචය සන්තති ජරතා අනිච්චතා යයි, අටවිසි ආකාරවේ; හිසකේ ලොම් නිය දත් සම් මස් නහර ඇට ඇටමිදුළු වකුගඩු හෘදයවස්තු අක්මාව දලබුව බඩදිව පපු බඩවැල අතුනුබහන උදරය අසූචිය හිස්මුල්ය යන ස්ථබ්ධ ලක්ෂණවූ විංශති කොට්ඨාසය පඨවිධාතු නම්වේ; පිත් සෙම් සැරව ලේ ඩහදිය මේදතෙල් කඳුළු වුරුණුතෙල් කෙල සොඹු සඳමිදුළු මූත්‍ර යන ද්‍රව හෙවත් වැගිරීම ලක්ෂණ කොට ඇති ඉතිරි කොටස් දොළස ආපො ධාතුනම්; යම්කිසි මස්වගී

යක් කුණුවෙන්ට නොදී ඒ ආරක්‍ෂාකරගැණිමට බහාලන එණක්
මෙන් හිසකෙස් ආදීකොට ඇති දෙතිස් කොඨාසය කුණුනො
කර පවත්නා යම් උෂ්ණත්වයක් ඇත්නම් එය හෙවත් “යෙ
නච සන්තපපති යෙනච ජීරති යෙනච පරි ඩය්හති යෙනච
අසිත පීත ඛායිත සායිතං සම්මා පරිනාමං ගච්ඡති” යනාදීන් දක්
වන යම්තෙජෝ ගුණයක්වේද එය තෙජෝධාතු නම්වේ; මේ
ශරිරය දර කඩක් මෙන් එක තැනක සිටිය නොදී ඒ ඒ ඉරියව්
පැවැත්විමට හේතුවූ යම් වායො ගුණයක් ඇද්ද හෙවත් දෙප
තුල පටන් හිස දක්වා පවත්නාවූ උද්ධංගම නම් වාතයද හිස
පටන් දෙපතුල දක්වා පවත්නා අධොගම නම් වාතයද කුසතුල
බඩවැල පිටපැත්තේ ගමන් කරණ කුච්ඡිසයා නම් වාතයද බඩ
වැල ඇතුලත ගමන්කරණ කොඨාසයා නම් වාතයද අත්පා ආ
දීවූ අව යව යන් අ සුරු කොට පවත්නා අඟමඟානුසාරී නම් වාත
යද පිටින් ඇතුලටද ඇතුලෙන් පිටතටද ගමන්කරණ ආශ්වාස
ප්‍රශ්වාස නම් වාතයද යන ෂට්විධ වායුව වායොධාතු නම්වේ;
නීල පිතාදී රූප දර්ශනයට හේතුවූ චක්‍ෂුප්‍රසාදය ආදිකොට ඇති
ප්‍රසාද රූප පසද චක්‍ෂු ශ්‍රොතාදියට ගොචරවූ රූපාදි විසයරූප
පසද ස්ත්‍රීභාවය පුරුෂභාවය මනොවිඥ්ඥණධාතුන්ට ආධාරව පව
ත්නා හෘදය වස්තුවය ශරිරයාගේ ස්ථිතියට හේතුවූ රූපජීවිතෙ
න්ද්‍රියද කන්සිදුරුදෙකය නාසාබිලය මුඛද්වාරය උගුරය මලමූත්‍රමාර්ගී
යෝය කනබොනද් පිහිටා සිටින උදරපටලය යන නවය ආකාශ
ධාතු නම්වේ; කයින් අභිප්‍රාය අඟවන කායවිඥ්ඥප්තියහා වචන
යෙන් ඒ ඒ අදහස් අඟවන වාක්විඥ්ඥප්තියද ශරිරයාගේ සැ
හැල්ලුභාවයයි කියනලද කායලහුතාවයද මොනවට මදිනලද සම
ක්මෙන් දූඩිනාවූ ස්වභාවයයි කියනලද කායමෘදුතාවයද යහපත්
කොට තැවීම කලාවූ ස්වර්ණයක් මෙන් ශරීරයෙන් කටයුතු
ක්‍රියාවට අනුකූලභාවයයි කියනලද කායකර්මන්‍යතාවයද ගංඉවු
රෙහි සෑරූ කූපයාගේ අපරිපූර්ණ ජලොද්ගමනය මෙන් ද්‍රරසනාති
කාදීවූ එකාදශ රූපායතනයන්ගේ මතුමත්තෙහි උත්පත්ති වශ
යෙන් අභිවෘද්ධියෙකැයි කියනලද උපචයද උපචිත රූපයන්ගේ
ප්‍රවෘත්තියයි කියනලද සන්තතියද දිරීම්සඞ්ඛ්‍යාත ජරතාවද රූප
යන්ගේ පරිභෙද ස්වභාවවූ අනිත්‍යතාවද්‍යයි යන මේ අටවිසිරූප
ය යටකියනලද සීතාදියෙන් රූප්පනාර්ථයෙන් රූපනම්වේ;
රාශ්‍යර්ථයෙන් සකන්ධ නම්වේ; ඉෂ්ටානිෂ්ට මධ්‍යමාරම්මන වශයෙන්
උපදනා සුඛදුඛ උපෙක්‍ෂා සඞ්ඛ්‍යාත ත්‍රිවිධ වේදනාව වෙදනාස්
කන්ධනම්වේ; ඇසින් දුටු නීලපීතාදි රූපයන් මේ අසවල්රූපය
යනාදි හැඳිනීමය කණින් ඇසූ භෙරිවීනාදි ශබ්දයන් මේ අසවල්

ශබ්දයයි කියා වෙන් වෙන් කොට හැඳිනීමය නාසයට දැනෙන් ගඳ සුවඳ වෙන් වෙන් වශයෙන් හැඳිනීමය දිවෙන් විඳනය කළ රසය මේ එනුරසය මේ ඇඹුල්රසය යනාදී වශයෙන් හැඳිනීමය කයටවූ ස්පර්ශය මේ සුඛස්පර්ශය මේ දුඃඛස්පර්ශය යනාදී වශයෙන් හැඳිනීමය මනසින් යමක් සිතා මේ අසවල්දේය යනාදි වශයෙන් චෛතසිකයන්ගේ හැඳිනීමය යන මේ ෂට්විධවූ සංඥව සංඥස්කන්ධ නම්වේ;

සංඛාරෝ චෙතනා ඵස්සො මනසිකාරෝ සුසණ්ඨිති
ඵකෙකා චාරෝ ච වායාමො පීති ඡන්ද'ධි මොක්ඛතා

සද්ධා සති හිරෝත්තප්පං චාගො මෙත්තා මතී පුන
මජ්ඣත්තතාච පස්සද්ධි කාය චිත්ත වසා දුවෙ

මානො ඉස්සා ච මච්ඡෙරො කුක්කුච්චං ථීන මිද්ධකං
ඉති එතානි පඤ්ඤාස සඞ්ඛාරක්ඛන්ධ සඤ්ඤිතා

යන මේ දෙපණස් චෛතසිකයෝ සංඛාරස්කන්ධ නම්වේ.

චතුමග්ගප්පභෙදෙන චතුධා කුසලං තථා
පාකං තස්ස ඵලත්තානි අඬ්ඪානුත්තරං මතං

ද්වාදසාකුසලා නෙවං කුසලානෙක වීසති
ඡත්තිංසෙව විපාකානි ක්‍රියාචිත්තානි වීසති

චතුපඤ්ඤාසධා කාමෙ රූපෙ පණ්ණරසීරයෙ
චිත්තානි ද්වාදසා රූප්පෙ අඬ්ඪානුත්තරෙ තථා

ඉත්ථමෙකූන නවුතිප්ප භෙදං පන මානසං
එකවීසසතං චාථ විභජන්ති විචක්ඛනා

මෙයින් දක්වන කාමාවචර රූපාවචර අරූපාවචර ලෝකෝත්තර කුසලාකුසල විපාකාදී එකුන් අනූවක් පමණවූ හෝ එකසිය විස්සක් චිත්තයෝ විඤ්ඤාණ ස්කන්ධ නම්වේ; උක්තප්‍රකාර පචස්කන්ධය සම්බන්ධ අභිධ්‍යානනිශ්‍රිත පරිපූර්ණ බහුලත්වය ඇතිවීමත් ධම්මවිචය සම්බොජ්ඣඞ්ගෝත්පාදයට හේතුවේ; එබැවින් ඒ ස්කන්ධයන් සම්බන්ධවූද ධාතූන් සම්බන්ධවූද හෙවත් "චක්ඛුධාතු සොතධාතු ඝානධාතු ජිව්හාධාතු කායධාතු මනොධාතු රූපධාතු ශබ්දධාතු ගන්ධධාතු රසධාතු ඵොට්ඨබ්බධාතු ධම්මධාතු චක්ඛුවිඤ්ඤාණධාතු සොතවිඤ්ඤාණධාතු ඝානවිඤ්ඤාණධාතු ජිව්හාවිඤ්ඤාණධාතු කායවිඤ්ඤාණධාතු මනොවිඤ්ඤාණධාතු යන මේ අටළොස්ධාතූන් සම්බන්ධවූද

චක්ඛායතන සොතායතන ඝානායතන ජිව්හායතන කායායතන මනායතන රූපායතන සද්දායතන ගන්ධායතන රසායතන

ඵොට්ඨබ්බායතන ධම්මායතන යන මෙකී ද්වාදශායතනයන් සම්
බන්ධවූද ඉන්ද්‍රියයන් සම්බන්ධවූද හෙවත් ශ්‍රද්ධෙන්ද්‍රිය වීර්‍ය්‍යෙන්ද්‍රිය
සමෘතින්ද්‍රිය සමාධින්ද්‍රිය ප්‍රඥෙන්ද්‍රිය යන පඤ්චෙන්ද්‍රියයන් සම්බන්ධවූද
බලයන් සම්බන්ධවූද හෙවත් අකම්පනාර්ථයෙන් බලනම්වූ ශ්‍රද්ධා
බලය වීර්‍ය්‍යබලය සමෘතිබලය සමාධිබලය ප්‍රඥාබලය යන පඤ්චප්‍ර
කාරබලය සම්බන්ධවූද බෝධ්‍යඞ්ගයන් සම්බන්ධවූද හෙවත් සමෘති
සම්බොධ්‍යඞ්ගය ධර්‍මවිචය සම්බොධ්‍යඞ්ගය වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය ප්‍රීති
සම්බොධ්‍යඞ්ගය ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය සමාධිසම්බොධ්‍යඞ්ගය උපෙ
ක්‍ෂාසම්බොධ්‍යඞ්ගය යන සප්තබොධ්‍යඞ්ගධර්‍මයන් සම්බන්ධවූද මාර්‍ගා
ඞ්ගයන් සම්බන්ධවූද හෙවත්

"යං ඛො භික්ඛවෙ දුක්ඛෙ ඤාණං දුක්ඛසමුදයෙ ඤාණං දුක්ඛ
නිරොධෙ ඤාණං දුක්ඛනිරොධගාමිනී පටිපදාය ඤාණං" යනු
වෙන් දක්වනලද සම්‍යක්දෘෂ්ටිය, "යො ඛො භික්ඛවෙ නෙක්ඛම්ම
සංකප්පො අව්‍යාපාද සංකප්පො අවිහිංසා සංකප්පො"

යනුවෙන් දක්වනලද සම්‍යක් සංකල්පනාවය සම්‍යක් වච
නය සම්‍යක් කර්මාන්තය සම්‍යක් ආජීවය සම්‍යක් ව්‍යායාමය
සම්‍යක් සමෘතිය සම්‍යක් සමාධිය යන මාර්ගාඞ්ග අට සම්බන්ධවූද
ප්‍රථමධ්‍යානාදි ධ්‍යානයන් සම්බන්ධවූද උපචාරසමාධි අර්පනා සමා
ධිය යන සමථයන් සම්බන්ධවූද අනිත්‍ය දුක්ඛ අනාත්ම වශ
යෙන් සලකන විදර්ශනාව සම්බන්ධවූද අභිඥානනිශ්‍රිත පරිපුච්ඡා
බහුලභාවය යම් යොගාවචර පුද්ගලයෙකුට ඇත්නම් එය ධම්ම
විචය සම්බොධ්‍යඞ්ගොත්පාදයට කරුණුවශයෙන් පවතියි; යථො
ක්ත ධර්මයන් සම්බන්ධ පරිපුච්ඡා බහුලත්වය ධම්මවිචය සම්බොධ්‍ය
ඞ්ගයාගේ උත්පත්තියට හෙතුවන පළමුවෙනි කාරණය වේ; දෙ
වෙනි කරුණනම්? වත්ථුවිසද කරණයයි, මෙහි වස්තුනම් යො
ගාවචරයා සම්බන්ධ ආධ්‍යාත්මික කේශාදියහා ඔහු සම්බන්ධ බා
හිර චීවරාදියයි, මොවුන්ගේ විසද භාව කරණය නම් හෙවත්
පිරිසිදුබැව් කරණ ස්වභාව නම් අටුවාවෙහි-

"වත්ථු විසද කිරියාති අජ්ඣත්තික බාහිරානං වත්ථූනං විසද
භාව කරණං යදා හිස්ස කෙස නඛ ලොමානි දීඝානි හොන්ති
සරීරං වා උස්සන්න දෙසං චෙව සෙදමලමක්ඛිතඤ්ච තදා අජ්ඣත්ති
කං වත්ථු අවිසදං හොති අපිරිසුද්ධං යදාපන චීවරං ජිණ්ණං කිලි
ට්ඨං දුග්ගන්ධං හොති සෙනාසනං වා උක්ලාපං තදා බාහිරං වත්ථු
අවිසදං හොති අපරිසුද්ධා තස්මා කෙසාදිච්ඡෙදනෙන උද්ධවිරෙ
චන අධොවිරෙචනාදීහි සරීරසල්ලහුක භාවකරණෙන උච්ඡාදන

නහාපෙතනව අජ්ඣත්තිකං වත්ථුවිසදං කාතබ්බං සූචිකම්ම ධොවන රජන පරිභණ්ඩ කරණාදීහි බාහිරං වත්ථුවිසදං කාතබ්බං එතස්මිං හි අජ්ඣත්තිකබාහිරෙ වත්ථුම්හි අවිසදෙ උප්පන්නෙසු චිත්ත චෙතසිකෙසු ඤාණම්පි අවිසදං හොති අපරිසුද්ධං අපරිසුද්ධානි දීප කපල්ලක වට්ටිතෙලාදීනි නිස්සාය උප්පන්න දීපසිඛාය ඔභාසො විය විසදෙ පන අජ්ඣත්තික බාහිරෙ වත්ථුම්හි උප්පන්නෙසු චිත්ත චෙතසිකෙසු ඤාණම්පි විසදං හොති පරිසුද්ධං පරිසුද්ධානි දීපකපල්ලක වට්ටි තෙලාදීනි නිස්සාය උප්පන්න දීපසිඛාය ඔභාසො විය තෙන වුත්තං වත්ථුවිසදකිරියා ධම්ම විචය සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය සංවත්තතීති”යි දක්වා තිබේ; මෙහි භාවාර්ථය. වස්තුවිසද කරණය නම්, ආධ්‍යාත්මික බාහිර වස්තුන් සම්බන්ධ පාරිසුද්ධියයි. යම් කලෙක වනාහි ඒ යොගාවචර පුද්ගලයාගේ කෙස් ලොම් නිය දික්වූවාහු වෙත්ද ශරීරය හෝ උත්සන්නවූ වාතපිත්තාදී දොෂයන්ගෙන් හා ඩහමලින් වැකුණේත් වේද එකල්හි අධ්‍යාත්මික වස්තුව අපිරිසිදුවෙයි, යම් කාලෙක වනාහි තමා පෙරවන සිවුර ජරාපත්වූයේ හෝ කිළුටුවූයේ හෝ දුගඳවූයේ හෝ වේද, තමා හිඳිනා සෙනසුන හෝ කසල සහිත වේද එකල්හි බාහිර වස්තු සඞ්ඛ්‍යාත සෙනසුනද, පිරිසිදු නොවෙයි එබැවින් කේශාදිය කැපීමෙන්ද ලයවිරේචන මල විරේචනාදීන් ශරීරය සැහැල්ලු කිරීමෙන්ද ඇඟවැතුරුනු ඩහ ඇමල උලාහැරීමෙන් හා නැහැවීමෙන්ද ආධ්‍යාත්මික වස්තුව විසදී කටයුතුයි හෙවත් පිරිසිදු කළයුත්තේයි; මැහීම් සේදීම් රැදීම් පිරිඛඩ කිරීම් ආදියෙන් බාහිරවූ ඒ චීවරාදී වස්තුව පිරිසිදුකටයුතුයි, මෙසේ මේ ආධ්‍යාත්මිකවූද බාහිරවූද වස්තූන් අපිරිසිදුකල්හි උපන් චිත්ත චෛතසික විෂයෙහි පවත්නා ඤාණයද අපිරිසිදු වෙයි, ඒ කෙසේද කියනහොත්? අපිරිසිදුවූ ප්‍රදීප කපලු වැටිතෙල් ආදීන් නිසා උපන් පහන්සිළුවෙහි ආලෝකයමෙනි, ඒ හැර ආධ්‍යාත්මික බාහිරවස්තූන් පිරිසිදුකල්හී උපන් චිත්ත චෛතසික විෂයෙහි පවත්නා ඤාණයද පිරිසිදුවෙයි, හේද පිරිසිදුවූ පහන්කපළු වැටිතෙල් ආදිය හේතුකොටගෙණ උපන් පහන්සිළුවෙහි ආලෝකයමෙනි එහෙයින් වස්තුවිසද භාවකරණය ධම්මවිචය සම්බොධ්‍යඞ්ගොත්පාදය පිණිස පවත්නේයයි කියනලදී. **ඉන්ද්‍රිය සමත්තපටිපාදනා** නම් ශ්‍රද්ධාදී පඤ්චෙන්ද්‍රිය යන්ගේ සමභාවකරණයයි, ඒ බව.“ඉන්ද්‍රිය සමත්තපටිපාදනා නාම සද්ධාදීනං ඉන්ද්‍රියානං සමභාවකරණං,, යනුවෙන් දක්වනලදී ඉදින් යම් විටෙක ඒ භාවනානුයොගී පුද්ගලයාහට ශ්‍රද්ධේන්ද්‍රිය බලවත්වේ නම්

එවිට සෙසු ඉන්ද්‍රියයෝ හෙවත් අධිපතිකරණාර්ථයෙන් ඉන්ද්‍රිය නම්වූ වීර්‍ය්‍යස්මෘතිසමාධි ප්‍රඥයන මොහු දුබලවෙත් නැවත ඒ හේතු කොට ගෙණ වීර්‍ය්‍යෙන්ද්‍රිය ප්‍රකර්ෂග්‍රහණ කෘත්‍යයද හෙවත් අරමුණකරා එලඹ සිටීමද සමාධීන්ද්‍රිය අවික්ෂේප කෘත්‍යයද හෙවත් විසිරයාම් සංඛ්‍යාත චිත්තවික්ෂේපයෙන් තුරන්වීමද ප්‍රඥෙන්ද්‍රිය දර්ශණකෘත්‍යයද කරන්ට නොහැකිවූයේ වෙයි හෙවත් ඒ ඒ ඉන්ද්‍රියයන්ට අයිති අධිපතිභාවය පවත්වන්ට අපොහොසත් වෙයි මෙසේම එකක් එකක් අධිකවූවහොත් සෙසු ඉන්ද්‍රියයෝ ඔවුනොවුන්ගේ කෘත්‍යයෙහි දුබලවූවෝ වෙත්; එබැවින් ඒ බලවත්වූ ඉන්ද්‍රියධර්මයන්ගේ ස්වභාව නුවනින් ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන්ද ඒ හැර යම්සේ මෙනෙහි කිරීමෙන් බලවත්වූවක් එසේම මෙනෙහි නොකිරීමෙන්ද බලවත් භාවය හැරිය යුතුයි හෙවත් අඩුකලයුතුයි වක්කලිස්ථවිර වස්තුව නාහි මෙහිදී ඊට නිදර්ශන කටයුතුයි, උන්වහන්සේගේ ශ්‍රද්ධාධිකබව "අඤ්ඤස්සං හි සද්ධා වඩ්ඪිතබ්බා හොති ථේරස්ස පන හාපෙතබ්බා ජාතා තස්මා සො සද්ධාධිමුත්තානං අග්ගොති වුත්තො,, යනුවෙන් දක්වනලදී මේ වක්කලි නමැති තෙරණුවෝ වනාහි යටගිය දවස-

තස්ස පටිවිද්ධ සබ්බඤ්ඤුත ඤාණස්ස මහාබොධි පල්ලඞ්කතො උට්ඨහන්තස්ස මහාපථවියං ඨපිත පාදෙ උක්ඛිත්තමත්තෙ පාදසම්පටිච්ඡනත්ථං මහන්තං පදුමපුප්ඵං උග්ගඤ්ජි තස්ස ධුරපත්තානි නවුතිහත්ථානි හොන්ති කෙසරං තිංසහත්ථං කණ්ණිකා ද්වාදසහත්ථං පාදෙන පතිට්ඨිතට්ඨානං එකාදසහත්ථං තස්ස පන භගවතො සරීරං අට්ඨපණ්ණාස හත්ථුබ්බෙධං අහොසි තස්ස පදුමකණ්ණිකාය දක්ඛිණපාදෙ පතිට්ඨහන්තෙ මහාතුම්බමත්තා රේණු උග්ගන්ත්වා සරීරං ඔකිරමානා ඔතරි වාමපාදෙ පතිට්ඨපන කාලෙපි තථා රූපං යෙව පදුමං උග්ගන්ත්වා පාදං සම්පටිච්ඡි තතොපි උග්ගතා වුත්තප්පමාණාව රේණු සරීරං ඔකිරි තං පන රේණුං අභිභවමානා තස්ස භගවතො සරීරප්පභා නික්ඛමිත්වා යන්ත නාලිකාය විස්සට්ඨසුවණ්ණරසධාරා විය සමන්තා ද්වාදස යොජනට්ඨානං ඒකොභාසං අකාසි තතිය පාදුද්ධරණ කාලෙ පඨමුග්ගතං පදුමං අන්තරධායි පාදසම්පටිච්ඡනත්ථං අඤ්ඤං නවං පදුමං උග්ගච්ඡි ඉමිනාව නියාමෙන යත්ථ යත්ථ ගන්තුකාමො හොති පාදෙ පාදෙ මහාපදුමං උග්ගච්ඡති තෙනෙවස්ස පදුමුත්තරො සම්බුද්ධොති නාමං අහොසි,

යනුවෙන් දක්වනලද ලක්ෂණයන්ගෙන් උපලක්ෂිතවූ හෙයින් පියුමතුරා නම් බුදුරජානන් වහන්සේගේ කාලයෙහි උන්වහන්සේ දැක වැඳපුදා බණ ඇසීම පිණිස සුවඳමල්ආදිය ගත්අත් ඇති

ව ගමන්කරණ මහජනයා සමග විහාරයට ගොස් ධර්ම්ය අසමින් පිරිස්කෙළවර සිටියේ ශාස්තෘන්වහන්සේ ශ්‍රද්ධාධිමුක්ත භික්ෂූන් අතුරෙන් අගතනතුරෙහි තබන්නාවූ එක්තරා භික්ෂුවක් දැක මා විසින්ද අනාගතකාලයෙහි මෙබඳුවූවෙකු ශ්‍රද්ධාවන්ට වටනේයයි සිතා බණ අසා භාග්‍යවතුන් වහන්සේට ආරාධනාකොට සත්දව සක්මහදන්දී සත්වෙනි දවසේ සුපිරිසිදු ශ්‍රද්ධාචිත්තයෙන් යුක්තව,

ඨානා ඨානං විපාකොච මග්ගං සබ්බත්‍ථ ගාමිනං
නානාධාතුයො ලොකෙ අධිමුත්තිංච පාණිනං
ජානාති ඉන්ද්‍රියානංච පරොපරියතං මුනි
ඣානාදි සංකිලෙසාදි ඤාණං විජ්ජාත්තයං තථානි

මෙසේ ඨානාඨාන ඤාණාදි දසබල ඤාණයක් ඇති බුදුරජාණන් වහන්සේට වැඳ එකත්පස්ව හිඳ ස්වාමීන් වහන්ස මමද මේ කෘතාධිකාර කර්ම්ය හේතුකොට ගෙණ තුඹවහන්සේ විසින් ශ්‍රද්ධාධිමුක්ත භික්ෂූන් අතුරෙන් මීට දවස්හතකට පෙර ඒ තදග්‍ර තනතුරෙහි තබනලද භික්ෂුවමෙන් අනාගත කාලයෙහි එක්බුදුකෙනකුගේ ශාසනයෙහිදී ශ්‍රද්ධාධිමුක්ත භික්ෂූන් අතුරෙන් අග්‍රවන්නෙම්වායි ප්‍රාර්ථනාකෙළේය ශාස්තෘන් වහන්සේද ඔහුගේ ප්‍රාර්ථනාවට අන්තරායක් නොවන බව දැක ඕහට විවරණ දී වැඩිසේක හෙතෙමේද දිවිහිම්කොට දානාදි කුසල් රැස්කොට දෙව්මිනිසුන් අතුරෙහි සැරිසරමින් අවුත් අපබුදුරජාණන් වහන්සේගේ කාලයෙහි සැවැත්නුවර බමුණු කුලයක ප්‍රතිසන්ධිග්‍රහණය කෙළේය ඕහට වක්කලි යන නාමය කළාහ. ඒ වක්කලි කුමාර තෙමේ වැඩියට පැමිණියේ වේදත්‍රය ඉගෙණගෙණ සැවැත්නුවර භික්ෂුසංඝයා විසින් පිරිවරණ ලදුව පිඩු පිණිස හැසිරෙන්නාවූ දසබලධාරීන්වහන්සේ දැක උන්වහන්සේගේ ඒ ශරීරසම්පත්ති දර්ශනයෙන් අතෘප්තවූයෙ හෙවත් තෘප්තියකට නොපැමිණුනේ දසබලධාරීන් වහන්සේ සමගම උන්වහන්සේ පසුපස්සෙහිම හැසිරෙයි උන්වහන්සේ විහාරයට වැඩමවන කල්හි ඒ සමගම ගොස් ශරීරනිෂ්පත්තිය බලමින්ම සිටියි දම්සභාමණ්ඩපයෙහිද දම් දෙසද්දී බුදුරජාණන් වහන්සේගේ අභිමුඛයෙහිම සිටියේ ධර්ම්ය අසයි ඒවක්කලිතෙමේ ශ්‍රද්ධාප්‍රතිලාභය කොට හෙවත් ශ්‍රද්ධාධිමුක්තව ගිහිගෙයි වසන්නේ නිතරම දසබලධාරීන් වහන්සේ දකිනු කැමතිව මහණ දම් ඉල්වා බුදුරජාණන් වහන්සේ සමීපයෙහි පැවිදිවිය එතැන්පටන් ආහර අනුභව කරණ වේලාව හැර සෙසු කාලයෙහි යම්තැනක සිට ශාස්තෘන් වහන්සේ දකින්ට හැකිනම් එ

බද්ධ තැනක සිට උපාය මනස්කාරය හැර හෙවත් සංස්කාර නුවනීන් නොසලකා දසබල ධාරීන් වහන්සේම බලමින් වසනසේක ශාස්තෘන් වහන්සේත් ඔහුගේ ඥාණපරිපාකය බලා පොරොත්තුවෙමින් බොහෝකලක් ඔහුට කිසිවක් නොකියා හිඳ සිතාවදාරණසේක් දැන් වනාහි ඔහුගේ නුවන මුහුකිරීමට ගියේය හෙවත් විදර්ශනා ප්‍රඥාව උපන මෙතෙමේ අවබෝධ කරවන්ට හැක්කේයයි දැන මෙසේ වදාළේය-

"කිං තෙ වකකලි ඉමිනා පූතිකායෙන දිඨෙන යො ඛො වකකලි ධමමං පසසති සො මං පසසති යො මං පසසති සො ධමමං පසසති ධමමංහි වකකලි පසසනෙතා මං පසසති මං පසසනෙතා ධමමං පසසතීති ආහ" ශාස්තෘන් වහන්සේ මෙසේ අවවාද කරණ කල්හිද ඒතෙරණුවෝ දසබලධාරී බුදුරජාණන් වහන්සේගේ දර්ශණය හැර අන්තැනක යන්ට නොහැකිවූයේ වෙයි නැවතත් ශාස්තෘන් වහන්සේ මේ මහණතෙමේ සංවේගයක් නොලැබ චතුරාර්‍ය්‍යසත්‍යාව බෝධය කරන්ට හැකිවූවෙක් නොවේයයි සිතනසේක් වස්එලඹෙන කාලය පැමිණී කල්හි රජගහනුවරට වැඩ මවා වස්වසනදවස්හී වක්කලිය පහව යවයි කියා තෙරුන් වහන්සේව පහකෙළේය එකල්හි තෙරුන් වහන්සේ සිතනුයේ බුදුවරයෝ නම් ඇදහියයුතු වචන ඇත්තෝ වෙත් එහෙයින්ම ශාස්තෘන් වහන්සේගේ වචනයට පිටිපා සිටින්ට නොහැකිවන්නේ තෙමසක් දසබලධාරීන් වහන්සේගේ සම්මුඛයට එන්ට උත්සාහ නොකරන්නේ හෙවත් නොපොහොසත් වන්නේ දැන්කුමක්කළ හැක්කෙම්ද තථාගතයන් වහන්සේ විසිනුදු පහකරණ ලද්දෙක් වෙමි එහෙයින්ම සම්මුඛී භාවයද නොලබමි දැන් ජීවත්වීමෙන් මට කවරප්‍රයෝජනයක් දැයි ගිජ්ඣකුළපව්වෙහි ප්‍රපාත ස්ථානයකට නැගේය ශාස්තෘන්වහන්සේද ඔහු කලාත්තවන බව දැන මේ මහණතෙම මා සමීපයෙන් ආශ්වාසයක් නොලබන්නේ හෙවත් මගෙන් පිහිටක් නොලැබුනොත් මතුලබන්ට තිබෙන මාර්ගඵලයන්ගේ හේතුසම්පත්තිය නසා ගන්නේයයි තමන් වහන්සේ ඔහට පෙන්වන අටියෙන් ආලෝකයක් විසුරුවා හැරියේය ඉක්බිති බුදුරජානන්වහන්සේගේ දර්ශනයෙන් මහත්වූ සොකසල්ලයන් ප්‍රහීනවිය ශාස්තෘන් වහන්සේ වියලි විලකට ඕඝාහරණය කරන්නාක්මෙන් සොකයෙන් වියලි ළය ඇති වක්කලි ස්ථවිරයන් වහන්සේට බලවත් ප්‍රීතිසෞම්නස උපදවනු පිණිස,

පාමුජජබහුලොභිකඛුපසනෙනා බුඩශාසනෙ
අධිගචෙඡ පදං සනතං සංඛාරූපසමං සුඛනති,

යන මේගය වදාළසේක, ඉක්බිත්තෙන් තථාගතයන් වහන්සේ චකසාලිය මෙහෙ එවයි ශ්‍රීහස්තය දිගුකල කල්හි සථවිරතෙමේ මා විසින් බුදුනුත් දක්නා ලද්දේය එවයි යන ආමන්ත්‍රණයකුත් ලබන ලද්දේයයි බලවත් ප්‍රීතිඋපදවා ගෙන තමන් වැටෙන බව නොදු නම දසබලධාරීන් වහන්සේගේ ඉදිරියට යන අපියෙන් අහසටපැණ ප්‍රථමපාදය පර්වතයෙහි පිහිටියදීම ශාස්තෘන්වහන්සේ විසින් වදාරණ ලද ගාථාව ආවර්ජනා කරමින් අහසේදීම ප්‍රීතිය විශ්බ මහනය කොට අර්ථධර්ම නිරුක්ති ප්‍රතිභාණයන චතුර්විධ ප්‍රතිසම්භිදාවන් සමගම අර්හත්වයට පැමිණ තථාගතයන් වහන්සේ වදිමින්ම බිමටපාත්විය ඉඳින් වීර්යෙන්ද්‍රිය බලවත් වීනම් එකල්හී ශ්‍රද්ධෙන්ද්‍රිය අධිමොක්ෂකෘත්‍යය කරන්ට අපොහොසත් වෙයි සෙසු ඉන්ද්‍රියයෝද එකක් එකක් අධිකව පවත්නාකල්හී කෘත්‍යයන්හි හීනවූවෝ වෙත් එහෙයින් අනික් අනික් කෙනෙක් ඒ ඒ අධික වීර්යය ප්‍රශ්‍රබ්ධාදී භාවනායෙන් හාපනය කටයුතුයි එවීර්යාධිකභාවයට සොණතෙරනුවන්ගේ වස්තුව මෙහිදී නිදර්ශණ කටයුතුයි, ඒබව.

“සචෙපන විරියින්ද්‍රියං බලවං හොති අථෙතව සද්ධින්ද්‍රියං අධිමොක්ඛකිච්චං කාතුං සක්කොති න ඉතරානි ඉතරකිච්චභෙදං තස්මා තං පස්සද්ධාදි භාවනාය හාපෙතබ්බං තත්‍රාපි සොණ ථෙරස්ස වත්ථුදස්සෙතබ්බං

යනුවෙන් දක්වන ලදී ඒ තෙරුන්ගේ වීර්යාධික භාවය “ය සමාපන අඤ්ඤසං භික්ඛූනං විරියං නාම වඩ්ඪනබ්බං හොති ථෙරස්ස හාපෙතබ්බමෙව අහොසි තස්මා එස ආරද්ධවිරියානං අග්ගොනාම ජාතො,, යනුවෙන් දක්වන ලදී මේසොණස්ථවිරතෙම වනාහි යටගිය දවස පියුමතුරානම් බුදුන්ගේ කාලයෙහි සිටුකුලයක උපන්නේය සිටුකුලනම් සාමාන්‍යයෙන්ම ධනයෙන් අග්‍රකුල වේ ඔහුගේ ශ්‍රීවර්ධනය වන බැවින් සිරිවඩ්ඪකුමාරයයි නම් කළාහ තරුණ වයසට පැමිණි මහතෙම එක්දවසක් බණ ඇසීම පිණිස විහාරයට ගොස් පිරිස්කෙළවර සිට ධර්මයඅසන්නේ පටන්ගත් වීර්ය ඇති භික්ෂූන් අතුරෙන් මෙතෙම අග්‍රයයි එක්භික්ෂුවක් අග තනතුරෙහි තබන බුදුන් දැක සිතනුයේ මාවිසින්ද අනාගත කාලයෙහි මෙබඳුවූවෙකු සදෘශවන්ට වටනේයයි දෙශනාව සානයෙහි දසබලධාරීන්වහන්සේට ආරාධනා කොට සත්දවසක් මුළුල්ලෙහි මහදන් පවත්වා ආරබ්ධවීර්ය ඇත්තවුන් අතුරෙන් අග්‍රකෙනෙක්වෙම්වායි ප්‍රණිධිකෙළේය ශාස්තෘන් වහන්සේ ඔහුගේ ප්‍රාර්ථනාව සමෘද්ධවන බව සර්වඥතාඥානයෙන් දැක මතු අනාගත කාලයෙහි ගෞතම

නම් බුදුකෙනෙක් පහළ වෙයි තොප එකල්හි ආරබ්ධවීයයි ඇත්
තවුන් අතුරෙන් හෙවත් වීස්සාධික භික්ෂූන් අතුරෙන් අග්‍රකොතෙ
ක් වන්නෙහියයි විවරණදී හෙවත් ඒබව ප්‍රකාශකොට විහාරයට
වැඩිසේක ඒ සිරිවඩ්ඪතෙමේද ජීවිතාන්තය දක්වා කුසල්කොට
එයින් චුතව දෙව්මිනිස් දෙගතියෙහි සැරිසරමින් කල්පලක්ෂයක්
ගෙවා මෙකපබුදුවූ කසුප් බුදුන් පිරිනිවිකල අපබුදුන් නූපන්
කල්හි බරණැස කුලගෘහයක ප්‍රතිසන්ධිග්‍රහණය කෙළේය. තරුණ
වයසට පැමිණි ගෙතෙම තමන්ගේ යහළුවන් හා සමග එක්තරා
දිනක ගඟාවෙක්හි ජලක්‍රීඩාව කෙරෙයි ඉක්බිති එසමයෙහි ජරපත්
සිවුරු පෙරවූ එක් පසේ බුදුකෙනෙක් බරණැස ආශ්‍රයකොටපවත්
නා නදී තීරයක ආශ්‍රමයක්කොට වස්එලඹෙන්නෙමියි සිතා දියෙන්
මතුවී යහ දඬුහා වැල්ද අදිමින් සිටියේවෙයි මේ සිරිවඩ්ඪකුමාර
තෙමේද යහළුවන් සමගම උන්වහන්සේහට පැමිණ අභිවාදනය
කොට එකත්පසෙක සිටියේ ස්වාමීනි කුමක්කරන්නෙහිදැයි විචා
ළේය; කුමාරය වස්සානයඑළඹ සිටිකල්හි ප්‍රව්‍රජිතයන් විසින්
වස්වසනතැනක් ලබන්ට වටනේයයි වදාළසේක; ස්වාමීනි අද මේ
එකදවසක් ආයුෂ්තෙමේ යම් ඒ ක්‍රමයකින් බලාපොරොත්තුවන
සේක්වා සෙට වූකලිආයුෂ්යත්වහන්සේට වස්විසීමට ස්ථානයක්
කරවා දෙන්නෙමියි කීයේය, පසේබුදුරජානන්වහන්සේ ඒ කුමා
රයාහට්ම සංග්‍රහකරන්නෙමියි සිතා වැඩි බැවින් තුෂ්ණීම් භාව
යෙන් ඉවසූසේක; ඒ කුමාරතෙමේද උන්වහන්සෙගේ අධිවාස
නය දැන සියගෙට පැමිණියේය දෙවෙනි දවසෙහි සත්කාරසම්
මානාදියසලසා පසේබුදුන උඩනාමග බලමින් සිටියේය; පසේබු
දුහු අදකොතැන්හි භික්ෂාලබම්දෝහෝයි ආවර්ජනා කරණසේක්
අසවල් තන්හියයි දැන ඔහුගේ ගෘහද්වාරයටම වැඩිසේක; කුමාර
තෙමේ පසේබුදුන් දැක මොනවට ප්‍රීතිවෙමින් පාත්‍රය රැගෙණ භි
ක්ෂාව පිළිගන්වා ස්වාමීනි මේ වස්කාලය මුළුල්ලෙහි අපගෙදෙර
ටම වඩිනුමැනවයි ප්‍රතිඥාග්‍රහණයකොට පසේබුදුන් දන්වළඳා
වැඩිකල්හි තමන්ගේ යහළුවන් සමග ගොස් එකදවසකින්ම පසේ
බුදුන්ට විසීමට පන්සලද සක්මන්මළුවද දිවාස්ථානයද රාත්‍රිස්ථා
නයද කරවා පිළිගැන්වීය; පන්සලට ප්‍රවිෂ්ටවන කල්හි උන්වහන්
ගේ පාදයන්හි මඩනොලෑගේවායි ලක්ෂයක්වටිනා තමන්සතු රක්
තකම්බල පොරෝනය නිල්තණපත් ඇතිබිමෙහිඅතුරා ඊපිට වඩින
පසේබුදුන්ගේ ශරීරප්‍රභාව කම්බලවර්ණයසමග එකසදෘශවූ බැව්
දැක අතිප්‍රසන්නවූයේම මෙසේ කීයේය; මාවිසින් පූදකළ මේ
රක්තවර්ණකම්බලය නුඹවහන්සේ විසින් ආක්‍රමනය කළකල්හි

යම්සේ ඉතාමහත්ප්‍රභා සම්පූර්ණ භාවයෙන් බබලයිද එපරිද්දෙන්
ම උපනුපන්තන්හි මාගේ පාද වර්ණයන් බඳුවූද මල්වැනිවේවා
ස්පර්ශයද සියක්වර පෙළූ කප්පාසික පටල ස්පර්ශයක් සදෘශවේවා
හෙවත් සියක්වර පොළා සියුම්කරණලද කපු පුළුනට බඳු ස්පර්ශය
ඇතිවේවායි ප්‍රාර්ථනා තැබිය ඒ කුමාරතෙමේ තුන්මසක් පසේ
බුදුන්ට උපස්ථාන කොට වස්පවාරණය කළකල්හි තුන්සිවුරු
පූජාකොළේය පිරිපුන් පාසිවුරුඇති පසේබුදුරජතෙමේ ගන්ධමා
දන පව්වටමවැඩිසේක ඒකුලපුත්‍රතෙමේත් දෙව්මිනිසුන් අතර
සැරිසරමින් අවුත් අපබුදුන්ගේ කාලයෙහි චම්පා නගරවාසී උසභ
නම් සිටුගෙයි ප්‍රතිසන්ධිග්‍රහණය කෙළේය ඔහුපිළිසිඳගත්තැන්
පටන් සිටුකුලයට නොයෙක් දහස්ගණන් සතුටුපඬුරු පැමිණෙත්
උපන්දවසෙහි සියළුනගරය එකලාව සත්කාරසම්මානඇතිවිය
ඉක්බිති ඔහට නම්තබන දවසෙහි මව්පිය දෙදෙන සිතන්නාහු
අපගේ පුත්‍රතෙමේ තමන්ට සුදුසු නාමය රූහෙණම ආයේය රත්
රත්රසධාරා ඉසිනලද්දක් මෙන් ඔහුගේ ශරීරය සම්බන්ධ සිවිය
ඇතිවූබැවින් සෝණ කුමාරයයි ඔහට නාමය කළාහ ඉක්බිති කිරි
මව්වරු සැටදෙනෙක් පමුණුවා ඔහු දිව්‍යකුමාරයෙක්මෙන් සැප
සේ වර්ධනය කළාහ තවදඔහුගේ ආධාරවිධානයකරන්නෝ සැට
කිරියක් පමණතැන වපුරා ත්‍රිවිධවූ ජලයෙන් පෝෂණයකෙරෙති
ක්ෂෙත්‍රයට වදනාවූ උදකමාතෘකාවන්හි හෙවත් දියඇලවල කිරි
දියහා සුවඳදිය සම්බන්ධනොයෙක් දහස්ගණන් සැලිඉසිත් ඒ
හැල්කිරිවදිනාකාලයෙහි ගිරව් ආදීන්ගේ ඉඳුල වළක්නාපිණිසද
වී ගැබිසම්බන්ධ සිවිමැලිභාවයපිණිසද පරියන්ත පරික්ෂේපයකොට
අතරතුර කනුහිටුවා මත්තෙහි දඬුදමා කලාල්වලින් වසාහාත්
පසතිරයක් වටකොට සියළුදිසාවන් සම්බන්ධ කොන්වල ආරක්ෂා
ගන්වත් හෙවත් මුරකරවත් ශස්‍යය පැසී කපාගත්කල්හි වී බහාලූ
කොටු සිවිදෑගඳින් සුවඳගල්වා මතුමතුත්සුවඳකවත් නොයෙක්
දහස්ගණන් මනුෂ්‍යයෝ කෙතට බැස හැල්කරල් නැටිවලින්
කපාගෙණ මිටිමිටිකොට රූහැන්වලින් බැඳ වියලවත් ඉන්පසු
කෝෂ්ඨයසම්බන්ධ යටතට්ටුවෙහි සුවඳඅතුරා ඊමතුහැල්මිටි
අතුරත් ඒ මිටිදෙකක් දෙකක් අතර අවකාසතැන්හි දෙවෙනි
තට්ටුවදූයි මෙසේ පිරෙනතුරු හැල්මිටි අතුරා කොටුව පුරවා දොර
වසත් නැවත අවුරුදු තුනක් ගියකල්හි කොටුව විවෘත කෙරෙත්
විවෘත කළකල්හි මුළුනගරය සුවඳ ගල්වනලද්දක් මෙන් වෙයි
හැල්කොටු කළ භෘත්‍යකයෝ වී පොතු විකුණගණිත් කුඩු සුළුඋප
ස්ථායකයෝ ලබත් මොහොල් ගැටෙනලදකල්හි වීසිවෙන හැල්
සහල් රැස්කොට ගණිත් ඔවුහු රන්හි පැසකා බහා සියක්වර පෙරා

ගත් ඒ සහල්පැසී උතුරණලද දැපිඩුරසයෙක්හි එකවරක් බහා උඩරණයකොටගණිත්, රසයෙන් මිදුම්දු කැත් දැසමත් පුෂ්පශද්ෂ වෙයි ඒ බොජුන රන්තලියක බහා ඉදවනලද නිරුදක මධුපා යාසයෙන් පිරූ රන්තලිය දෙඃහාත් මුදුනෙහි කොටගෙණගෙ.ස් සිටුපුත්‍රයාගේ ඉදිරියෙහි තබත් හෙතෙම තමහට යැපෙන පමණ වලඳ සුවඳකැවූ ජලයෙන් මුවසෝද අත්පා ධෝවනය කෙරෙයි ඉක්බිති සේදූ අත්පා ඇති ඕහට අනේකප්‍රකාර මුඛවාස එලවා තබත් ඔහු පා තබන ස්ථානයෙහි උත්තම නියඳින් කළ විසිතුරු ආස්තරණ අතුරත් ඔහුගේ හස්ත පාද තලයෝ බඳුවද පුෂ්පව ර්ණ ඇතිවෙත් සියක්වර පෙළ කපු පුළුනකමෙන් මහාසපර්ශ ඇත්තේවෙයි පාදතලයන්හි මාණික්‍යකුණ්ඩලාවර්තීව ණීවැනි වර්ණ ඇති ලොම්හට ගත්තාහ හෙතෙම කිසියම් කෙනෙකුට කිපී දූන ගනුව තොප බිම පාගන්නෙහිමියි යන්න පමණක් කියයි මධ්‍යම වයසට පැමිණි ඕහට සෘතුත්‍රයට සුදුසු ප්‍රාසාදතුනක් කරවා නාටකස්ත්‍රීන් ලවා උවටැන්කළාහ මහත් සම්පත් අනුභවකරන් නාවූ හෙතෙම දෙවියෙක් මෙන් වාසය කෙරෙයි අපබුදුරජානන් වහන්සේ සර්‍වඥතාඥනයට පැමිණ පවත්වනලද උතුම්ධර්‍මචක්‍රය ඇ තිව රජගහ නුවරනිසා වැඩවාසය කාරණකල්හි ඔහුගේ පාදලෝම දර්‍ශනය පිණිස මගධරජුවිසින් කැඳවා අසූදහසක් ගම්මුන්සමග ශාස්තෲන් වහන්සේගේ සමීපයට යවනලද්දේ බුදුන්ගෙන් බණ අසා ලබනලද ශ්‍රද්ධාඇති ඒ සෝණ කුමාරතෙමේ ශාස්තෲන්වහන් සේනෙත් ප්‍රව්‍රජ්ජාව ඉල්වීය ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මව් පියන්විසින් අනුදන්නාලද්දෙහිදැයි ඔහුවිචාරා අනුනොදන්නා ලද බැව්අසා එම්බා සොණකුමාරය මව්පියන්විසින් අනුනොදන් නාලද පුත්‍රයකු තථාගතයන් වහන්සේලා පැවිදිනොකරත්යයි ප්‍රති ක්ෂේපකළසේක හෙතෙමේත් භාග්‍යවතුන් වහන්ස ඒ යහපතැයි තථාගතයන් වහන්සේගේ වචනය මස්තකයෙන් පිළිගෙණ මව් පියන් සමීපයට ගොස් කැමතිකරවා ගෙණ හෙවත් අවසර ලබා ගෙණ ශාස්තෲන් වහන්සේ සමීපයට පැමිණිපසු එක්භික්ෂුවක් ලග පැවිදිකරවීය මේ මෙහි සංක්ෂේප ප්‍රවෘත්තියයි විස්තරවශයෙන් පාලියෙහි ආයේමැයි ප්‍රව්‍රජ්ජාවහා උපසම්පදාව ලැබ ඔහු රජගහ නුවර වාසයකරද්දී බොහෝ නෑයෝහා සහලේනෑයෝද සන්දිෂ්ට සම්භක්තයෝද සත්කාර සම්මාන ගෙණඑත් රූපනිෂ්පත්තියෙහි ගුණකථනය කෙරෙත් අන්‍යවූ බොහෝදෙනාද ඔහු දකිමට පැමි ණෙති සථවිරතෙමේත් මෙසේ සිතුයේය මාගේ සමීපයට බොහෝ දෙනාපැමිණෙත් කම්මටහනකහෝ විදර්‍ශනාවකහෝ කටයුතු කො සේනම් කළහැක්කෙම්ද එබැවින් මම බුදුන්ගේ සමීපයෙහිදී කම

වහන් ඉගෙණගෙණ සීතවනනම් සොහොන්භූමියට ගොස් ශ්‍රමණ
ධර්මය කරන්නෙම්නම් ඉතායෙහෙක එබිවනැයි සොහොනයයි
පිළිකුල්කොට බොහෝදෙනා නොපැමිණෙන්නාහ එසේ ඇති
කල්හි මාගේ කර්මස්ථාන කෘත්‍යය මුදුන්පත්වන්නේයයි ශාස්තෲන්
වහන්සේ සමීපයෙහිදී කමටහන් කියවාගෙණ සීතවනයටගොස්
මහණ දම්පුරන්ට පටන්ගත්සේක එසේ ශ්‍රමණ ධර්මය පූරණය කරන්
නාවූ හෙතෙමේද මාගේ ශරීරය අතිසයින්ම සිව්මැලිය සැප
යකින්ම සැපයක් ලබන්ට නොහැකිවේ කය වෙහෙසවාද මහණ
දම්පුරන්වවටනේයයි සිතුයේය එතැන්පටන් ස්ථානචඞ්ක්‍රමණ දෙක
පමණක් වීර්‍ය්‍යාධිෂ්ඨානකොට පධන්කෙළේය හෙවත් සතර සම්‍ය
ක්ප්‍රධාන වීර්‍ය්‍යයෙහි යුක්තවිය ඒ සොණතෙරුන්ගේ සිව්මැලි
පාදතලයන්හි හාත්පසින් බිබිළිනැගී පිපිරීගියාහ සක්මන්මළුව
එකම ලේගොඩක්විය එසේ සක්මන්කිරීමට නොහැකිකල්හි දනව
ලින් හා අත්වලින්ද උත්සාහකොට සක්මනට පටන්ගත්තේය මෙ
සේ අත්පා ආදී අවයවයන් නොසලකා ඉතාදෘඩිවීර්‍ය්‍යකෙළේවී න
මුත් ඍදුණාභාසමාත්‍රයකුදු උපදවාගන්ට නොහැකිවූයේ මෙසේ සි
තිය ඉදින් වීර්‍ය්‍යාරම්භයෙහි නියුක්ත අනිකෙකු වන්නේනම් හෙතෙ
මේත් මාවැන්නෙක් වන්නේය මමවූකලි මෙසේ වීර්‍ය්‍යයකරම්නුත්
මාර්ගයක්හෝ ඵලයක්හෝ උපදවන්ට නොහැකිවීම් ඊටහෙතුනම්
ඒකාන්තයෙන් මම උද්ඝටිතඥයෙකුදු නොවෙම් විපරිතඥයෙකුදු
නොවෙම් ඥෙයපුද්ගලයෙකුදු නොවෙම් මෙකී තිදෙනාහැර පද
පරමයෙක්ම වෙම් ප්‍රව්‍රජ්‍යාවෙන් මට කවරප්‍රයෝජනයක්ද සිවුරු
හැර ගියහොත් කාමයන්ද සේවනයකළහැකිය පින්කම්ද කළ
හැකියයි මෙසේසිතීය එසමයෙහි සතරාමර ලෝකදිවාකරවූ
සම්මාසම්බුදුරජාණන් වහන්සේ එම සෝණතෙරනුවන්ගේ කල්
පනාව දැනවදුරා සවස්වේලෙහි දහස්ගණන් භික්ෂු සමූහයාවිසින්
පිරිවරණලදුව එහි වැඩමවා ලෙයින් ස්ඵීකරණලද චංක්‍රමණ ස්ථා
නය දැක වීනාවාදයෙන් අවවාදකොට වීර්‍ය්‍යසමථයෙහි යෙදීමට
සුදුසු කර්මස්ථානයෙක් වදාරා ගිජුකුළුපව්වටම වැඩිසේක. සෝණ
ස්ථවිරතෙමේද දසබලධාරීන්වහන්සේගේ හමුවෙන් අවවාද ලබා
නොබෝකලකින්ම රහත්ඵලයෙහි පිහිටිසේක වීර්‍ය්‍යාධික පුද්ගල
යන් අතුරෙන් මෙතෙම අග්‍රකෙනෙකි තමුන් අධිකවීර්‍ය්‍යය හේතු
කොටගෙණ මාර්ගඵලාදියක් උපදවන්ට නොහැකිවිය විශෙෂවශ
යෙන් වනාහි මේ ධර්මවිචය සම්බොධ්‍යඞ්ග විෂයෙහි ශ්‍රද්ධා ප්‍රඥ
යනඉන්ද්‍රිය දෙදෙනාගේහා සමාධිවීර්‍ය්‍යෙන්ද්‍රියදෙදෙනාගේත් සමභා
වය පසසත් විසමභාවයෙහි ආදීනවහා සමභාවයෙහි ආනිසංසත්
වදාරණ අර්ථකථාචාරීහු.

බලවසද්ධො හි මන්දපඤ්ඤො මුද්ධප්පසන්නො හොති අවත්ථුස්මිං පසීදති බලව පඤ්ඤො මන්දසද්ධො කෙරාටිකපක්ඛං භජති භෙසජ්ජසමුට්ඨිතොවිය රොගො අතෙකිච්ඡොහොති චිත්තුප්පාදමත්තෙනෙව කුසලං හොතීති අතිධාවිත්වා දානාදීනි අකරොන්තො නිරයෙ උප්පජ්ජති උභින්නං සමතාය වත්ථුස්මිං යෙව පසීදති බලව සමාධිං පන මන්දවිරියං සමාධිස්ස කොසජ්ජපක්ඛත්තා කොසජ්ජං අභිභවති බලව විරියං මන්දසමාධිං විරියස්ස උද්ධච්චපක්ඛත්තා උද්ධච්චං අභිභවති සමාධිංපන විරියෙන සංයොජිතො කොසජ්ජපතිතුං නලභති විරියං සමාධිනා සංයොජිතං උද්ධච්චෙ පතිතුං නලභති තස්මා තදුභයං සමං කාතබ්බං උභයසමතාය හි අප්පනාහොති අපිච සමාධිකම්මිකස්ස බලවතීපි සද්ධාවට්ටති එවං සද්දහන්තො ඔකප්පෙන්තො අප්පනං පාපුණිස්සති සමාධිපඤ්ඤාසු පන සමාධිකම්මිකස්ස එකග්ගතා බලවතීවට්ටති එවංහි සො අප්පනං පාපුණාති විපස්සනාකම්මිකස්ස පඤ්ඤාබලවතී වට්ටති එවංහි සො ලක්ඛණපටිවෙධං පාපුණාති උභින්නංපන සමත්තායපි අප්පනාහොති යෙව සතිපන සබ්බත්ථ බලවතී වට්ටති සතිහි චිත්තං උද්ධච්චපක්ඛිකානං සද්ධාවිරියපඤ්ඤානං වසෙන උද්ධච්චපාතතො කොසජ්ජපක්ඛිකෙනච සමාධිනා කොසජ්ජපාතතො රක්ඛති තස්මා සා ලොණධූපනං විය සබ්බව්‍යඤ්ජනෙසු සබ්බකම්මිකො අමච්චො වියච සබ්බරාජ කිච්චෙසු සබ්බත්ථඉච්ඡිතබ්බා තෙනාහ සතිචපන සබ්බත්ථිකා වුත්තා භගවතා කිං කාරණාචිත්තංහි සතිපටිසරණං ආරක්ඛපච්චුපට්ඨානාච සති නවිනාසතියා චිත්තස්ස පග්ගහනිග්ගහො හොතීති. යීවියු,,

මෙහි භාවාර්ථය අධික ශ්‍රද්ධාවඇත්තේ වනාහි මඳවූ ප්‍රඥාවඇත්තේ මූඪප්‍රසන්නයෙක්වේ නොපැහැදියයුතුතැන පහදින්නෙක් වෙයි බලවත් ප්‍රඥාවහා මඳශ්‍රද්ධාව ඇති පුද්ගලතෙම වනාහී කෛරාටික පක්ෂය භජනය කරන්නෙක්වෙයි ඒකෙසේද? කියනවානම් වාතපිත්තාදි දෝෂකෝපයකින්නොව බෙහෙතකින්ම හටගත් රොගයට පිළියම් කොට සුවලබන්ට නොහැකිවන්නාක් මෙන් ප්‍රසාදචිත්තොත්පාදමාත්‍රයකින්ම කුසල්සිද්ධවේයයි දුවපැන දානාදීන්නොකරණ තැනැත්තේ නිරයෙහි උපදියි ශ්‍රද්ධාප්‍රඥයනදෙදෙනාගේ සමභාවය ඇතිකල්හි වස්තුවෙහිම හෙවත් පැහැදියයුතු තැනම පහදින්නේ වෙයි බලවත් සමාධියහා මඳවීර්‍ය්‍යයඇත්තේ සමාධි තමාකුසීත ගතියට පක්ෂබැවින් කුසීතභාවය ලබයි බලවත් වීර්‍ය්‍යයහා මන්දසමාධිය ඇත්තෙක් වීර්‍ය්‍යයතමා උද්ධච්චපාක්ෂික බැවින් පහසුවෙන්ම උද්ධතභාවය ලබයි සමාධිවීර්‍ය්‍යවනාහි විශේෂ

ඥියසමග මොනවට යෙදුණේනම් හෙවත් සමාධිවීර්‍ය්‍යය දෙදෙනා සමවූනම් කුසීත භාවයෙහි පතිතවන්ට නොහැකිවේ වීර්‍ය්‍යය සමාධියසමග සමව යෙදුණේ උද්ධතභාවයෙහි පතිතවන්ට නොහැකිවෙයි එබැවින් යොගාවචර පුද්ගලතෙමේ ඒ සමාධිවීර්‍ය්‍යදෙක සමකටයුතුයි දෙදෙනාගේ සමභාවය ඇතිකල්හි අර්පනාව වේ එත කුදුවුවත් සමාධි කර්ම්ක යෝගාවචර පුද්ගලයාම ශ්‍රද්ධාතොමෝ බලවත්වීම වටියි මෙසේ ශ්‍රද්ධාව ඇත්තේ අවකප්පනය කරමින් හෙවත් අභ්‍යන්තරය බබුළුවමින් අර්පනාවට පැමිණෙන්නේය සමාධීන්ද්‍රිය ප්‍රඥෙන්ද්‍රිය යනදෙක අතුරෙනුදු සමාධිකර්ම්කයාහට එකාග්‍රතාවය බලවත්වීම වටියි මෙසේ ඇතිකල්හි හෙතෙමේ අර්පනාවට පැමිණෙයි විදර්ශනාකර්ම්කයාහට ප්‍රඥාතොමෝ බලවත්වීම වටියි මෙසේ ඇතිකල්හි හෙතෙමේ තිලකුණු ප්‍රතිවේධයට පැමිණෙයි දෙදෙනාගේ සමභාවය ඇතිකල්හිද අර්පනාව වේමැයි සතිතොමෝ සියළුතන්හි බලවත්ව පැවතීම වටනේවෙයි සතිවූකලි උද්ධච්චපාක්ෂික ශ්‍රද්ධාවීර්‍ය්‍යප්‍රඥාවන්ගේ වශයෙන් නොයන්සුන්බව ලැබීමෙන්ද කෞසීද්‍යපාක්ෂික සමාධිහුගේ වශයෙන් කුසීතභාවයෙහි වැටීමෙන්ද සිත ආරක්ෂාකෙරෙයි හෙවත් සියලුතැනටම සුදුසුසමෘති තොමෝ උද්ධච්ච කුසීතදෙකින් සිත කලිඹටනොකොට ආරක්ෂාකරගණී එහෙයින් ඒ සමෘතිතොමෝ සර්ව්‍යඤ්ජනයන්හි ලෝණධූපනයක්මෙන්ද සකල රාජකෘත්‍යයෙහි නියුක්ත සර්ව්කාර්මික ඇමතියෙකුමෙන්ද සැමතැනම කැමතිවියයුත්තීය. එහෙයින් සතිච පන සබ්බත්ථිකා වුත්තා භගවතා කිංකාරණා චිත්තංහි සතිපටිසරණං ආරක්ඛ පච්චුපට්ඨානාච සති. නවිනාසතියා චිත්තස්ස පග්ගහනිග්ගහො හොතීති යනු වදාලසේක් දුෂ්ප්‍රඥපුග්ගල පරිවර්ජනතා යනු ධර්මවිචය සම්බොධ්‍යඞ්ගයාගේ උත්පත්තියට හේතුවූ සතරවෙනි කරුණයි එහි තේරුම දුෂ්ප්‍රාඥ හෙවත් ප්‍රඥාවිරහිත පුද්ගලයන් සේවනය නොකොට හැරීමයි මෙකී ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය උපදවාගන්ට වීර්‍ය්‍යකරණ පුද්ගලයා ප්‍රඥාවිරහිත අඥාන බාලජනයන් දුරින් දුරුකටයුතුවේ. අඥාන. බාලජනයෝ නම් කායවාක්මනෝ යන චාරත්‍රයෙන් දුශ්චරිතයෙහි හැසිරෙණ අන්ධබාල පෘථජ්ජන සමූහයයි.

යථාකේතව තුලාකොටි යාති උන්නතිමොනතිං,
තථා පුථුජ්ජනො ලොකෙ යාති කොපපසාදනං.

මෙසේ ඉතාම ස්වල්පයකින් වෙනස්වන ස්වභාවය ඇති අන්ධපෘථජ්ජන සංඛ්‍යාත දුෂ්ප්‍රාඥ පුද්ගලයන් සේවනය කෙරේනම් ඕහට ධර්මවිචය සම්බොධ්‍යඞ්ගොත්පාදය තබා ජීවිතකාලයෙහි

ලබන ලෞකික කීර්ති ප්‍රසංසාවවත් ලැබිය නොහැකිවේ. එබැවින් ශ්‍රෙඨොක්ත බෝධ්‍යඞ්ගධර්මය උපදවන යොගාවචර පුද්ගලයා විසින් දුෂ්ප්‍රාඥයන් දුරුකටයුතුවේ. ඒ සඳහා අට්ඨකථාවෙහි "දුප්පඤ්ඤ පුග්ගලපරිවජ්ජනානාම ඛන්ධාදි භෙදසු අනොගාල්හපඤ්ඤානං දුම්මෙධපුග්ගලානං ආරකා පරිවජ්ජනං"යි දක්වා තිබේ. දුෂ්ප්‍රාඥ පුද්ගලපරිවර්ජනතාවය නම් ස්කන්ධ ධාතු ආයතනාදී නවවිධ ධර්මවිෂයෙහි බැස නොගත් විදර්ශනා ප්‍රඥව ඇති දුර්මේධ පුද්ගලයන් හාත්පසින් දුරුකිරීම ධම්මවිචය සම්බොධ්‍යඞ්ගොත්පාදයට හෙතුවේ. ආදීනව පක්ෂයට ජම්බුකාජීවකවස්තුආදිය මීට නිදර්ශනයි. ආනිසංස පක්ෂයට පූර්ණස්ථවිර වස්තුආදියවේ. පඤ්ඤාවන්ත පුග්ගලසෙවනතායතු පස්වෙනි හේතු ධර්මයවේ. ප්‍රඥවන්ත පුද්ගල සේවනතාව නම් සමපර්ණස් ආකාරයකින් පඤ්චස්කන්ධයාගේ ලක්ෂණ පරිග්‍රාහිකාවූ උදය ව්‍යය ප්‍රඥවෙන් යුක්ත පුද්ගලයන් සේවනය කිරීමයි ඒ බව "පඤ්ඤවන්ත පුග්ගලසෙවනා නාම සම්පඤ්ඤාස ලක්ඛණ පරිග්ගාහිකාය උදය වය පඤ්ඤාය සමන්නාගත පුග්ගලසෙවනතා"යි දක්වනලදී. සමපර්ණස් ආකාර උදය ව්‍යය ප්‍රඥව කෙසේදයත්?

"අවිජ්ජා සමුදයා රූප සමුදයො තණ්හාසමුදයා රූප සමුදයො අවිජ්ජානිරොධා රූපනිරොධො තණ්හානිරොධා රූපනිරොධො කම්මනිරොධා රූපනිරොධො ආහාරනිරොධා රූපනිරොධො අවිජ්ජාසමුදයා වෙදනාසමුදයො ඵස්සසමුදයා වෙදනා සමුදයො අවිජ්ජානිරොධා වෙදනානිරොධො තණ්හානිරොධා වෙදනානිරොධො කම්මනිරොධා වෙදනානිරොධො ඵස්සනිරොධා වෙදනා නිරොධො අවිජ්ජාසමුදයා සඤ්ඤාසමුදයො තණ්හාසමුදයා සඤ්ඤාසමුදයො කම්මසමුදයා සඤ්ඤාසමුදයො ඵස්ස සමුදයා සඤ්ඤාසමුදයො අවිජ්ජානිරොධා සඤ්ඤානිරොධො තණ්හානිරොධා සඤ්ඤානිරොධො කම්මනිරොධා සඤ්ඤානිරොධො ඵස්සනිරොධා සඤ්ඤානිරොධො අවිජ්ජාසමුදයා සංඛාරසමුදයො තණ්හා සමුදයා සංඛාරසමුදයො කම්මසමුදයා සඞ්ඛාරසමුදයො ඵස්සසමුදයා සඞ්ඛාර සමුදයො අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො තණ්හානිරොධා සඞ්ඛාරනිරොධො කම්මනිරොධා සඞ්ඛාරනිරොධො ඵස්සනිරොධා සඞ්ඛාරනිරොධො අවිජ්ජාසමුදයා විඤ්ඤාණසමුදයො තණ්හාසමුදයා විඤ්ඤාණසමුදයො කම්මසමුදයා විඤ්ඤාණසමුදයො නාමරූපසමුදයා විඤ්ඤාණසමුදයො අවිජ්ජානිරොධා විඤ්ඤාණනිරොධො තණ්හානිරොධා විඤ්ඤාණනිරොධො කම්මනිරොධා විඤ්ඤාණනිරොධො නාමරූපනිරොධා විඤ්ඤාණනිරොධො

මෙහි සංක්‍ෂෙපභාවය සංස්කාර සම්මශීනඥානය උපන්කල්හි ත්‍රෛභූමික සංස්කාරයන් කෙරෙහිම උදයව්‍යය දෙක අවිද්‍යාවගේ රැස්වීම කරණකොටගෙණ රූපයාගේ පහළවීම වේ තෘෂ්ණාවගේ රැස්කිරීමකරණකොටගෙණ රූපයාගේ පහලවීම වේ භවගාමී කර්මයන්ගේ රැස්වීම කාරණකොටගෙණ රූපයාගේ පහලවීම වේ ආහාරයාගේ රැස්වීම කරණකොටගෙණ රූපයාගේ පහලවීම වේ යයිද ප්‍රත්‍යපරාමශීණය නොකොට හුදෙක් රූපස්කන්ධයාගේ පහලවීම් ස්වභාවය දක්නේද රූපස්කන්ධයාගේ උදය දක්නේයි එසේම අවිද්‍යාවගේ නිරොධය කරණකොටගෙණ රූපයාගේ නොපැවැත්මවූ නිරොධය වේ තෘෂ්ණා නිරොධයෙන් රූපනිරොධයවේ කර්මනිරොධයෙන් රූපනිරොධයවේ ආහාරනිරොධයෙන් රූපනිරොධය වේ යයිද ප්‍රත්‍යයවිශයෙන් නොගෙණ හුදෙක් රූපස්කන්ධයාගේ විපරිනාම ලක්‍ෂණය දක්නේද රූපස්කන්ධයාගේ ව්‍යය දක්නේයි මෙසේ රූපස්කන්ධයෙහිද අවශෙෂවෙදනා සංඥා සංස්කාර යන ස්කන්ධත්‍රයෙහි සතරවන ආහාර ප්‍රත්‍යය හැර ඵස්සසමුදයා වෙදනාසමුදයො ඵස්සනිරොධා වෙදනානිරොධො යනාදීන් ඵස්සය බහාලා විඤ්ඤාණස්කන්ධයෙහිදු සතරවන ස්ඵර්ශප්‍රත්‍යය හැර නාමරූපසමුදයා විඤ්ඤාණසමුදයො නාමරූපනිරොධා විඤ්ඤාණනිරොධො යනුවෙන් නාමරූපය බහාලා කියනලද මේ සම්පූර්ණස්ලක්‍ෂණයෙහි යථොක්ත අවිද්‍යාදි ප්‍රත්‍යයන්ගේ සත්අභාවයෙහි රූපාදීන් වීමය අවිද්‍යාදීප්‍රත්‍යයන්ගේ අභාවයෙහි රූපාදීන් නොවීම යයි කියනලද ප්‍රත්‍යයවශයෙන්ද ප්‍රත්‍යය පරාමර්ශනය නොකොට නිර්වෘත්තිලක්‍ෂණ මාත්‍ර විපරිනාම ලක්‍ෂණමාත්‍ර වශයෙන් දක්නා හෙයින් ලක්‍ෂණවශයෙන්දුයි එකි එකී ස්කන්ධයෙහි ප්‍රත්‍යයවශයෙන් සතරෙක ලක්‍ෂණවශයෙන් එකෙකැයි පච පච ප්‍රකාරවූ උදයද පච පචප්‍රකාරවූව්‍යයදුයි දස දස උදයව්‍යයද දර්ශණවශයෙන් සම්පූර්ණස් ආකාර කීයේ උදයව්‍යයානුපස්සනාඥාණයයි භවත් උදයව්‍යය ප්‍රඥාවයි මෙවූ ප්‍රඥාවන්ත පුද්ගලසෙවනයට ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය හෙතුවේ ගම්භීරඥාණචරියපච්චවෙක්ඛණා නම් ''ගම්භීරෙසු ඛන්ධාදිසු පවත්තාය ගම්භීරපඤ්ඤාය පභෙද පච්චවෙක්ඛනා,,යී ජේත බැවින් ගැඹුරුවූ ස්කන්ධාදිධර්මයන් කෙරෙහි පැවති ගැඹුරුප්‍රඥුහුගේ ප්‍රභෙද ප්‍රත්‍යවෙක්‍ෂා කිරීමයි ගම්භීරෙසු ඛන්ධාදිසු පවත්තාංඥාණං,ගම්භීරඤාණං,චරියසංඛාතෙන පභෙදෙන පච්චවෙක්ඛණං-චරියපච්චවෙක්ඛණං,ගම්භීරඤාණස්ස-චරියපච්චවෙක්ඛනාඉති; ගම්භීරඥානචරිය පච්චවෙක්ඛනා, ගැඹුරු ස්කන්ධාදීන් කෙරෙහි ගැඹුරුවශයෙන් පැවති ප්‍රඥුහුගේ ප්‍රභෙද මේ මේ ආකාරයයි.වෙන්වෙන් කොටමෙනෙහි කිරීම ගම්භීරඥාණචරිය ප්‍රත්‍යවෙක්‍ෂාවයි මෙහිප්‍රකාශකල

ගම්භීරඥාණයනම් සොළොස්ප්‍රඥාවන්ට අයිති ගම්භීර ප්‍රඥාවයි "පඤ්ඤාපටිලාභො පඤ්ඤාවුද්ධි පඤ්ඤාවෙපුල්ලං මහාපඤ්ඤතා පුථුපඤ්ඤතා විපුලපඤ්ඤතා ගම්භීරපඤ්ඤතා අසාමන්තපඤ්ඤතා භූරිපඤ්ඤතා පඤ්ඤාබාහුල්ලං සීඝපඤ්ඤතා ලහුපඤ්ඤතා ජවනපඤ්ඤතා තික්ඛපඤ්ඤතා නිබ්බෙධිකපඤ්ඤතා, යනුසොළොසාකාරවූ ප්‍රඥාහුගේ සංඥාමාත්‍රයෙව් මෙහිවිස්තරවිභාගය මනොරථපූරණී එකක නිපාතයෙන් දතයුතුයි. යථොක්ත සොළොස් ආකාරප්‍රඥාවන්ට අන්තර්ගතවූ ධම්විචය සම්බොධ්‍යඞ්ගොත්පාදයට හේතුවූ ගම්භීරඥාණසංඛ්‍යාත ගම්භීරප්‍රඥාව "කතමා ගම්භීරපඤ්ඤා ගම්භීරෙසු ඛන්ධෙසු ඤාණං පවත්තතීති-ගම්භීරපඤ්ඤා පුථුපඤ්ඤාසදිසො විත්ථාරො, ගම්භීරෙ පරමත්ථෙ නිබ්බානෙ ඤාණං පවත්තතීති-ගම්භීරපඤ්ඤා" යනාදීවශයෙන් දක්වනලදී ගැඹුරුවූ ස්කන්ධ ගැඹුරුවූ ධාතු ගැඹුරුවූ ආයතන ගැඹුරුවූ සීල ගැඹුරුවූ සමාධි ගැඹුරුවූ ප්‍රඥා යනාදීධර්මයන් කෙරෙහි පැවති ඥාණයාගේ ප්‍රභෙද උපායමනස්කාරවශයෙන් සැලකීමත් ධම්විචය සම්බෝධ්‍යඞ්ගයාගේ ඉපදීමට හෙතුවක්වේ, තදධිමුත්තතා නම් ධම්විචය සම්බෝධ්‍යඞ්ගයාගේ උත්පාදයට හෙතුවූ හත්වෙනි කාරණයයි "තදධිමුත්තතා නාම ඨාන නිසජ්ජාදීසු ධම්මවිචය සම්බොජ්ඣඞ්ගසමුට්ඨාපනත්ථං නින්න පොනපබ්භාර චිත්තතා" ස්ථාන නිෂද්‍යාදී ඒ ඒ ඉරියව් පවත්වන අවස්ථාවලදී ධර්මවිචය සම්බෝධ්‍යඞ්ග සමුට්ඨාපනය පිණිස අධිමුක්තවූ නම්නවූ ප්‍රනම්නවූ හෙවත් හැරුනාවූ ප්‍රග්භාරවූ හෙවත් ප්‍රපාතයක් මෙන් අවගතවූ චිත්ත ස්වභාවය තදධිමුත්තතාන්නෙහි අදහසයි. අධිගමාභිලාෂී යොගාවචර පුද්ගලතෙමේ පරිපුච්ඡාබහුලත්වය වස්තුවිසදභාවකරණය ආදී සප්තධර්මයන් කාරණකොටගෙණ ධම්මවිචය සම්බෝධ්‍යඞ්ගය සමුට්ඨාපනය කොට ඒම ධුරකොටගෙණ අභිනිවේසයට එලඹ පිළිවෙලින් අර්හත්වය ලබන්නේ වෙයි. අර්හත්ඵලයෙහි පිහිටි සඳ ඔහුගේ මනෝරථය මුදුන් පත්වූයේ වෙයි. හෙවත් උතුම් නිර්වාණයට පැමිණ කෙලෙස් සංසිඳුවාගත් පුද්ගලයාවේ.

ඉක්බිති වීය්‍ර්‍යසම්බොධ්‍යඞ්ගයෙහි හේතු දක්වන අට්ඨකථාචාරීහු "එකාදසධම්මා විරිය සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති අපායභය පච්චවෙක්ඛණතා ආනිසංස දස්සාවිතා ගමනවීථි පච්චවෙක්ඛණතා පිණ්ඩපාතා පචායනතා දායජ්ජමහත්ත පච්චවෙක්ඛණතා සත්ථුමහත්ත පච්චවෙක්ඛණතා ජාතිමහත්තපච්චවෙක්ඛණතා සබ්‍රහ්මචාරී මහත්තපච්චවෙක්ඛණතා කුසීතපුග්ගල පරිවජ්ජනතා ආරද්ධවිරිය පුග්ගලසෙවනතා තදධිමුත්තතා"ති යනාදීන් දක්වනලදහ. වීරභාවතො විධිනා ඊරයිතබ්බතොච විරියං වීර

භාවයෙන්ද විධිවූ පරිද්දෙන් කියයුතුවචන ඇති හෙයින්ද නො
හොත් තත් තත් කර්මවිෂයෙහිදී දක්නවුන් කම්පා කටයුතු ස්ව
භාව ඇතිහෙයින්ද වීර්‍ය්‍යනම්වේ. මෙහිදී "අනුප්පන්නානං අකු
සලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති විරියං ආරභති"
යනාදීන් දක්වන සතරසම්‍යක් ප්‍රධානවීර්‍ය්‍යම ගනුලැබේ. එබඳු
ස්වභාවය ඇති වීර්‍ය්‍යාඞ්ගයත් මාර්ගඥනාවබොධයට සහපත් අඞ්ග
යක්වේ. ඒ වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ග සමුත්ථාපනය පිණිස දක්වනලද එක
දස ධර්මයන් අතුරෙන් අපායභය පච්චවෙක්ඛණතා යනු පලමු
වැනි කාරණයයි "අයසංඛාතසුඛතො අපගතො ඉති=අපායො භා
යති එතායාති-භයං, අපායසමා-ජාතං භයං අපායභයං, අපාය
භයං දුක්ඛතො උපාය මනසිකාරතො අවෙක්ඛතා අපායභය
පච්චවෙක්ඛනා, යනුහෙයින් අයසංඛ්‍යාතසැපයෙන් පහවූ හෙයින්
අපායනම් මේ කරනකොටගෙන බියවේ යන අර්ථයෙන් භය
නම් අපායෙන් ජාතවූභය අපායභයනම් ඒ අපායභය දුක්වශ
යෙන් උපායමනස්කාර වශයෙන් සලකා බැලීම අපායභය ප්‍රත්‍ය
වෙක්ෂාවයි, වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය උපදවන පුද්ගලයා අපායාදි
භය ප්‍රත්‍යවෙක්ෂාකිරීමෙන්ද එය උපදවාගණියි ඒ බව "තත්‍ථ
නිරයෙසු පඤ්චවිධ බන්ධන කරණතො පට්ඨාය මහාදුක්ඛං අනු
භවනකාලෙපි තිරච්ඡානයොනියං ජාලක්ඛිපකුම්නාදීහි ගහිතකා
ලෙපි පාජනකණ්ටකාදිප්පහාරතුන්නස්ස පන සකට වහනාදි කා
ලෙපි පෙත්තිවිසයෙ අනෙකානිපි වස්සසහස්සානි එකං බුද්ධන්ත
රම්පි ඛුප්පිපාසාහි ආතුරිභූතකාලෙපි කාලකඤ්ජකඅසුරෙසු සට්ඨි
හත්‍ථ අසීතිහත්‍ථප්පමාණෙන අට්ඨිචම්මමත්තෙනෙව අත්තභාවෙන
වාතාතපාදි දුක්ඛානුභවනකාලෙපි නසක්කා විරියසම්බොජ්ඣ
ඞ්ගං උප්පාදෙතුං අයමෙව තෙ භික්ඛුකාලොති එවං අපායභයං
පච්චවෙක්ඛන්තස්සාපි විරියසම්බොජ්ඣඞ්ගො උප්පජ්ජති" මෙහි
භාවය ඒ නරකයෙහිදී තත්තං අයොඛිලං හත්‍ථෙ ගමෙන්ති
යනාදීන් දක්වන පඤ්චවිධ වධබන්ධනයන් කරන තැන්පටන්
මහත්වූ දුක් අනුභවකරනකල්හිද තිරිසන්යොනියෙහි උපන්
කල්හි දැල් දැමීම් කෙමං ඇටවීම් ආදියෙන් අසුකරගත් කාලයෙහිද
ඇනකොට්ටිආදියෙන් ප්‍රහාරදෙද්දීම ගැල්ආදිය උසුලනකල්හිද
ප්‍රෙතලොකයෙහි ඉපිද නොයෙක් අවුරුදුදහස්ගනන්ද බුද්ධාන්ත
රයක් මුළුල්ලෙහිද සාපිපාසාදෙකින් රොගාභිභූත කාලයෙහිද
හෙවත් පෙලෙන කල්හිද අසුරවිෂයෙහිත් කාලකඤ්ජක අසුරලො
වලුපද සැටරියන් අසූරියන් ප්‍රමාණ අට්ටිචම් මාත්‍රවූ ආත්මභාව
යෙන් යුක්තව අව්සුලංආදීන් හෙතුකොටගෙණ දුක්අනුභවකර

ණ කල්හිද වීර්‍ය්‍යසම්බෝධ්‍යඞ්ගය උපදවන්ට නොහැකිවේමය එබැ
වින් මහණනොපව මෙම අවවාද කරගනුයි මෙපරිද්දෙන් නරක
තිරිසන් ප්‍රෙත අසුරනිකා යයි කියනලද සතරඅපායක නුවනින්
ප්‍රත්‍යවෙක්‍ෂාකරන්නාහටද වීර්‍ය්‍යසම්බෝධ්‍යඞ්ගය උපදීමය හෙවත්
සතරමාර්‍ගඥනාවබෝධයෙන් නිවන්ලැබීමය. "ආනිසංසදස්සාවි
නායනු දෙවැනි අඟයයි කරණලද කුසලකර්‍මයෙහි ආනිසංස
දක්නා ස්වභාවය යමෙකුට වීනම් හෙද වීර්‍ය්‍යසම්බෝධ්‍යාඞ්ගාත්
පාදයට හේතුධර්‍මයක්වේ, එහෙයින් කීහ" නසකකා කුසීතෙන නව
ලොකුත්තරධම්මාලභ්ං ආරඞවිරියෙනෙව සකකා අයමානිසංසො
විරියස්සාති එවං ආනිසංසදස්සාවිනොපි විරිය සම්බොජ්ඣඞ්ගො උ
ප්පජ්ජති" කුසීතවූවාහුවිසින් නවලෝකෝත්තරධර්‍මයෝ ලබන්ට
නොහැක්කාහ අරබ්ධවීර්‍ය්‍යඇත්තාහුවිසින්ම ඒ ලැබියහැක හෙ
වත් ලැබියයුතුවේ වීර්‍ය්‍යයෙන් යුක්ත පුද්ගලයාවිසින් ලැබියයුතු
ආනිසංසය මෙබඳුයයි කියා එහි ආනිසංස දක්නාසුළුවූවාහුවිසින්ද
යථොක්ත බෝධ්‍යඞ්ග ධර්‍මය උපදවා මාර්‍ගප්‍රතිපාටියෙන් අර්හත්වය
ලබන්නේය කුසීතවූවහුට හෙවත් ලාමකවීර්‍ය්‍යඇති පුද්ගලයාහට
බෝධ්‍යඞ්ගධර්‍ම වැඩීම තබා නිසිසේ දරකැඩීමවත් කරන්ට බැරිවී
මෙන් පරිහානියටපැමිණෙන බැව් මතු දක්වන වරණජාතකයෙන්
පෙණේ යටගිය දවස ගන්ධාර රට තක්සලානුවර දිසාපාමොක් ආ
චාරිවූ අපමහබෝසතානන් සමීපයෙහි සිල්පඋගන්නාවූ පන්සිය
යක් පමණ මාණවකයෝ එක්දවසක් දර ගෙණෙනපිණිස වලට
ගොස් දරකඩන්නාහු ඔවුන් අතුරෙන් එක්කුසීතමාණවකයෙක්
කොළ වගුල මහත්වූ එනුවරණ ගසක් දැක මළදරගසෙකැයි සිතා
මදක් මෙහි නිදාඉඳ පසුව ගසට නැගී දරකඩාගෙණ යෙමියි සිතා
උතුරුසළුව අතුට වැදහෙව නායා හඬවහඬවා නිදන්ටවන සෙසුමා
ණවකයෝ දරකඩාගෙණ මිටිබැඳගෙණ යන්නාහු නිදන්නාවූ මා
ණවකයා දැක පිටිපත්ලෙන්*ගසා පුබුදුවාගියාහුය ඒ කුසීතයා නැ
ගීසිට ඇසනිදිපිසපිස නිදිමතනොයාදීම එනුවරණගසට නැගී අත්
තක් අල්වාගෙණ තමාදිසාවට ඇදබිඳිනේ බිඳීනැගිඅතුකෙලව
රින් තමාගේ ඇස සිල්කොටගෙණ එක්අතකින් ඇසවසා එක්අත
කින් නොමල දරකඩා මිටියක් බැඳ ඔසවාගෙණ ගොස් මාණවක
යන්විසින් එලවනලද දරමිටිමත්තෙහි එළයේය. එදවස්ම දනව්
ගමෙක මනුෂ්‍යයෝ බමුණන්ලවාශාන්තිකරවා දනුත් දක්ෂිණාවක්
දෙමහයි ආචාරීන් පැවරූය එකල්හි ආචාරීහුමාණවකයන්ට කියත්
නාහු දරුවෙනි සෙට එක්ගමෙකට යායුතුය එසේහෙයින් තෙපි
නිරාහාරව යන්ට අසමර්‍ථය උදෑසනම කැඳපිසවා අනුභවකොට

තොප ලබනකොටසත් අපට පැමිණිකොටසත් එක්කොට හැරගෙණ එවයි කීයේය. එබස්ඇසූ මාණවකයෝ කැඳපිසිනුපිණිස කෙල්ල පුබුදුවා නගාසිටුවා වහා අපට කැඳපිසවයි කීවාහුය. ඒ කෙළිද කැඳපිසිනුපිණිස දරගණිමියි දරහොඩ මත්තෙහි තුබූ අමුඑනුවරණ දඬුගෙණ ගින්නේලා පිඹින්නීගිනිදල්වාගතනොහී හිරුනැගුය මාණවකයො

ඉතා දවල්ගියේය දූන්යන්ට නොපිළිවනැයි කියා ආචාරීන් සමීපයට ගියෝය. ඒ දූක දරුවෙනි, කුමක්නිසා නොහියෝදැයි විචාළෝය. එසේය ආචාරීන්වහන්ස නොහියම්හයි කිවුය කුමනකාරණාවක්නිසාදැයි විචාළකල ස්වාමීනි අසවල් කුසීත මාණවකයා අපහා සමග දරට ගොස් එණුවරණගසක්මුල වැදහෙව නිදාපියා පසුව ගසට නැගී ඇසක් සිල්කොට ගෙණ අමු එනුවරණ දරඇරගෙණ අපවිසින් පලමුකොටගෙණවිත් එලනලද දරමත්තෙහි එළිය කැඳපිසනතැනැත්තී ඒ වියලිදරයයි යනසංඥාවෙන් ගින්නේලා පිඹින්නී හිරුනැගෙණතුරු ගිනිමොලවාගත නුහුනීය මේකාරණයෙන් අපගේ ගමනට බාධාවීයයි කීහ. මාණවකයා කළ කාරියඅඥානයන්ගේකාරියනිසා මෙබඳුලාභහානියක් වීයයි කියා මාණවකයන්ට මෙසේ කාරණාකීවාහුය යම්කිසිපුද්ගලයෙක් මේ පළමුකොට කළමනාදෙය මේ පසුව කළමනාදෙයයි පරීක්ෂානොකොට පළමුකොට කළමනාදෙය පසුවකෙරේද, ඒ අඥානපුද්ගලතෙම අමුඑණුවරණ දරකඩාගෙණාවාවූ අපගේ මේ මාණවකයාමෙන් පශ්චාත්තාපයට පැමිණ සොකකොට හඬන්නේයයි මෙසේ මහබෝසතානෝ අතවැස්සන්ට මේ කාරණය කියා දනාදි පින්කම්කොට ජීවිතාවසානයෙහි කම්වූපරිද්දෙන් මියපරලොවගියෝය එබැවින් පින්වත් සත්පුරුෂයෙනි මේමාණවකයාමෙන් කුසීත නොව එසේකුසීතවූ සෙසුජනයන් සෙවනය නොකොට කුසීතභාවයෙන් තොරවී මෙහි අනුසස්දැක වීර්‍ය්‍යසම්බෝධ්‍යඞ්ගය වඩා සෝවාන් සකෘදාගාමි අනාගාමිඅර්හත් යන සතරමාර්ගයහා ඵලයත් නිර්වාණධර්මයත් යන නවලෝකෝත්තර ශ්‍රීසද්ධර්මාවබොධය පිණිස උත්සාහකටයුතු ගමනවීථිසඞ්ඛ්‍යාත ගායුතු මාර්ගය ප්‍රත්‍යවෙක්ෂාකිරීමත් වීර්‍ය්‍යසම්බෝධ්‍යඞ්ගෝත්පාදයට හේතුවූ තුන්වැනිධර්මයවේ. ඒ කෙසේ ප්‍රත්‍යවෙක්ෂාකෙරේදයත්?

“සබ්බඤ්ඤුබුද්ධ පච්චෙකබුද්ධ මහාසාවකෙහි ගතමග්ගො ගාච ගන්තබ්බො සොච නසක්කා කුසීතෙන ගන්තුන්ති එවං ගමනවීථිං පච්චවෙක්ඛන්තස්සාපි උප්පජ්ජති” යනු අටුවා බැවින් අතීතානාගතවර්තමාන යනකාලත්‍රයසම්බන්ධ සියළුඥෙයධර්මයන් දැනගත් සම්

ශ්‍රීබුදුවරයන්වහන්සේලාවිසින්ද නිර්වාණයකරා පැමිණි යම්මාර්ගයක්වේනම් ඒමාර්ගයම යායුතුමාර්ගයවේ ඒමාර්ගයද කුසීතවූවහුවිසින් පැමිණියනොහැකියයි මෙසේ යායුතුමාර්ග උපායමනස්කාර වශයෙන් ගමනෙහිකරන්නාහටම වීර්යසම්බොධ්‍යඞ්ගය උපදනේ වෙයි **පිණ්ඩපාතාපචායනතා,,** යනුපිණ්ඩපාතයෙන් පිදීම කුමක් අරබයාදැයි නුවනින් ප්‍රත්‍යවෙක්ෂාකිරීමවේ. එසේ ප්‍රත්‍යවෙක්ෂාකොරේනම් ගෙද වීර්යසම්බෝධ්‍යඞ්ගෝත්පාදයට හෙතුවූ සතරවැනිධර්මියවේ යොගාවචර මහණතෙමේ ඒකසේප්‍රත්‍යවෙක්ෂාකෙරේද අඞ්ගී කථාවෙහි. ඒසඳහා.

“යෙතං පිණ්ඩපාතාදිහි උපට්ඨහන්ති ඉමෙ තෙ මනුස්සා නෙව ඤාතකා නදාසකම්මකරා නාපි තං නිස්සාය ජීවිස්සාමාති මත පණීතානි පිණ්ඩපාතාදීනි දෙන්ති අථකො අත්තනො කාරනං මහප්ඵලතං පච්චාසිංසමානා දෙන්ති සත්ථාරාපි අයං ඉමෙ පච්චයෙ පරිභුඤ්ජිත්වා කායදළ්හිබහුලො සුඛංවිහරිස්සතීති න එවං සම්පස්සතා තුය්හං පච්චයා අනුඤ්ඤාතා අථකො අයං ඉමෙ පරිභුඤ්ජමානො සමණධම්මං කත්වා වට්ටදුක්ඛතො මුච්චිස්සතීති තෙපච්චයා අනුඤ්ඤාතා සො දානි ත්වං කුසීතො විහරන්තො න තං පිණ්ඩපාතං අපචායිස්සසි ආරද්ධවිරියස්සෙව හි පිණ්ඩපාපචායනං නාම හොතීති එවං පිණ්ඩපාතාපචායනං පච්චවෙක්ඛන්තස්සාපි උප්පජ්ජති මහාමිත්තත්ථෙරස්සවිය පිණ්ඩපාතියතිස්සත්ථෙරස්සවියච”

මෙහි භාවයනම් යම් බඳුශ්‍රද්ධාවන්තපුද්ගලයෙ තුමූ නුඹට පිණ්ඩපාතාදීන් උපස්ථානකෙරේද්ද ඒබඳුවූ මේ මනුෂ්‍යයො නුඹගේ නෑයෝද නොවෙත් දාස්කම්කරුවෝද නොවෙත් නුඹනිසා ඔව්හු ජීවිකාවකරන්නෙමුයි සිතා ප්‍රණීත පිණ්ඩපාතාදිය දෙන්නෝද නොවෙත් එතකුදුලවත් තමන්විසින් කරණලද උපකාරයන්ගේ මහත්ඵල මහානිසංසභාවය මිහිලාපොරොත්තුවින්නාහුපිණ්ඩපාතාදීන් උපස්ථානකෙරෙත් ශාස්තෘන්වහන්සේවිසිනුදු ඒ සම්බන්ධව මෙතෙමේ මේ සිව්පසපරිභොගකොට කායදළහීභාවය බහුලවූවෙක්ව හෙවත් කායපුෂ්ටිමත්භාවය බහුලවූයේ සැපසේවාසයකරන්නේය යනමෙබඳු අදහසක්සලකන්නාහු විසින් නුඹට මේ සිව්පස අනුඥනොකරණලදහ එසේනම්කුමක්සඳහා අනුඥකරණලද්දාහුද මෙතෙමේ යථොක්ත චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍යය යන සිව්පසය පරිභොග කරමින් ශ්‍රමණධර්මය පරිපූර්ණකොට වෘත්තදුක්ඛයෙන්මිදෙන්නේය යනුම සලකා ඒ ප්‍රත්‍යයෝ අනුදැනවදාළාහ ඒ නුඹ දැන් කුසීතව වාසයකරන්නේ නම් ඒ පිණ්ඩාහාරය නොපුදන්නෙහිය ආරබ්ධවීර්යඇත්තේකුහට ඒ පිණ්ඩාහාරයෙන් පිදීම

කරන්නේ වේන්ද මෙසේ පිණ්ඩපාතයෙන් පිදීම කුමක්සලකා කෙ
රේදැයි නුවනින් ප්‍රත්‍යවෙක්‍ෂාකරන්නාහටද වීර්‍ය්‍යසම්බෝධ්‍යඞ්ගය
උපදින්නේවෙයි මහාමිත්තස්ථවිර පිණ්ඩපාතියතිස්සස්ථවිර යනාදීන්
නමයින් වහන්සේ ලාට මෙනි මහාමිත්‍රස්ථවිරතෙමේ වනාහි එක්ත
රාකාලයක කස්සකනම් ලෙනවාසයකරණ්නේක එකල්හි උන්ව
හන්සේගේ ගොදුරුගමෙහි එක්තරා උපාසිකාවක් තොමෝ තෙ
රුන්වහන්සේ පුතෙකුකොට හෙවත් ඒ මහාමිත්‍රස්ථවිරයන්වහන්
සේ තමන්ගේ දරුවෙකුමෙන් සලකා ඉතාආදරයෙන් පොෂ්‍යයකෙ
රෙයි ඒ උපාසිකාතොමෝ එක්තරා දවසක් සම්කිසි කට්යුත්තක්
සඳහා තොහොත් පලාකඩනපිණිස ආරණ්‍යයට්යන්නී තමධීතෘව
ට මෙසේකීය දියනියඅසවල්තැන පරණසහල්ද අසවල්තැන කිරිද
අසවල්තැන ගිතෙල්ද අසවල්තැන පැණිද ඇත තීගේ සහෝදර
වූ ආයර්‍ය්‍යමිත්‍රස්ථවිරයන්වහන්සේ පිඬුපිණිස පැමිණිකල්හි බත්පිස
කිරිගිතෙල් පැනි යනාමේවා සමග දෙව නීදඅනුභවකරව මමත් ඊ
යේපිසනලද පිළිනුබතක් කැඳසමග අනුභවකෙළෙම්යි නොහොත්
දියබතක් අනුභවකෙළෙම් එකල්හි දියනිතොමෝ කියන්නී මෑනි
යනිදවාලට කිනම්දෙයක් අනුභවකරන්නෙහිදදියනිය පලාකොල
බහාකැඩුහලින් ඇඹුල්කැඳ පිසනබවයි කියා මව්තොමෝ ගියාය
ස්ථවිරතෙමේ පිඬුපිණිස යාමට සිවුරපෙරවා පාත්‍රයගණිමින්ම ඒ
ශබ්දය හෙවත් මව්ගේහා දියනියගේ කථාශබ්දය අසා තමහට තෙ
මේම මෙසේ අවවාදකෙළේය ශ්‍රමණය මහ උපාසිකාතොමෝ කැඳ
සමග පාරිවාසිකභකතය අනුභවකෙළේය. දවාලටද කුඩුහා පලා
කොලබහාකකාරණ්ලද ඇඹුල්කැඳ අනුභවකරන්නේය නුඹපිණිස
පූරාණසහල්ආදීන් ආරෝවනයකරයි මෝතොමෝ නුඹනිසා කෙත්
වත් ආහාර වස්ත්‍රාදිකිසිවක් ලබම්යි ප්‍රාර්ථනාතොකෙරෙයි ත්‍රිවිධ
සම්පත්තිය මැට දෙන්ට නුඹටහැකිවන්නෙහිද මේ පිණ්ඩාහාරය
නුඹවිසින් රාගද්වේෂ මොහ යනාදියින් යුක්තව ගන්ට නොහැක්
කේයයි හෙවත් සුදුසුනැතැයි කියා පාත්‍රයපසුම්බියෙහි බහා සිවුරෙ
හි ගැට මුදා පිණ්ඩපාතය පිණිස නොගොස් ආපිට හැරී කස්සකනම්
ලෙනටම ගොස් පාත්‍රය ඇඳයටද සිව්ර සිවුරුදමන උන දන්ඩෙහිද
තබා අභිනවයට නොපැමිණ පිඬුපිණිස නොනික්මෙන්නෙමියි. වී
ර්‍ය්‍යාධිෂ්ඨානකොට වැඩහුන්නේය බොහෝකලක පටන් අප්‍රමාදව
වාසයකළාවූ ඒභික්ෂුව එකෙනහිම විදර්ශනාවඩා පෙරබත් කාලයෙ
හිම හෙවත් උදේවරුවෙහිම අභීන්ඵලයට පැමිණ පිපුමක්වැනිවූ
ඒ මහාක්ෂීණාශ්‍රවයන් වහන්සේ සිනා පහලකරමින් ලෙණෙන්
නික්මුනේය එකල්හි ලෙණදොර වෘක්‍ෂයෙහි අධිගෘහීත දෙවතා
තොමෝ

නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම
යස්ස තෙ ආසවා ඛීණා දක්ඛිණෙය්‍යාසි මාරිස"ති'

යන්නෙන් ප්‍රීතිවාක්‍යය පහළකරන්නී ස්වාමීන්වහන්ස පිණ්ඩ
චර්‍ය්‍යාවෙහි ප්‍රවිෂ්ටවූ තුඹවහන්සේ වැනි රහතුන්වහන්සේලාට භි
ක්ෂාදානයකොට මහළුස්ත්‍රීහු දුකින් මිදෙත්යයි කීවාය ඉක්බිති ස්ථවිර
තෙමේ හුනස්සෙන් නැගිට චාරය විවෘතකොට පිණ්ඩපාතපිණිස
නික්මීමට කාලය සුදුසුදැයි බලන්නේ ඉරඅවරට නොගිය බව දැන
පාසිවුරු රැගෙණ ගමට ප්‍රවිෂ්ටවූසේක, යථොක්තඋපාසිකාවගේ දිය
නිවූ ලද්දිතොමෝද බත්සම්පාදනයකොට මාගේ සහෝදරයන්
වහන්සේ දැන් දැන් එන්නේයයි දොරබලමින් උන්නීය ඕතොමෝ
තෙරුන්වහන්සේ ගෘහචාරයට පැමිණිකල්හි පාත්‍රයගෙණ ගිතෙල්
පැනිසොදනලද ක්ෂීරමය පිණ්ඩාහාරපූරවාගෙණවුත් තෙරුන්වහන්
සේගේ හස්තයෙහි තැබීය ස්ථවිරතෙමේද සුවපත් වේවායි අනුමෝ
දනාකොට වැඩිසේක ඒ දියනි තොමෝද වඩනාතෙරුන්වහන්සේ
බලමින්ම සිටියාය එකල්හි තෙරුන්වහන්සේගේ ජීවක්ෂීණය ඉතා
ම පිරිසිදුවූයේවිය ඉන්ද්‍රියයෝ විශෙෂයෙන් ප්‍රසන්නයහ මුහුනබඩ
නයෙන් මිදුනු පැසුනුතල්ඵලයක්මෙන් අතිසයින් බැබළිය ඉක්බි
ති මහාඋපාසිකා තොමෝ ආරණ්‍යයෙන් අවුත් දියනිය කිමෙක්ද
තීගේ සහෝදරභික්ෂුව පැමිණියේදැයි විචාළේය ඕතොමෝත් එද
වස තුඹුපිරිසිදුජීවක්ෂීණාදි සියළුම ප්‍රවෘත්තිය ආරොචනය කළාය
එකල්හි උපාසිකාතොමෝද මාගේ පුත්‍රයාගේ ප්‍රව්‍රජිතකෘත්‍යය
මස්තකප්‍රාප්තවීයයි දැන දියනියනි තීගේ සහෝදරයා බ්‍රහ්මචර්‍ය්‍යා
වෙහි අභිරමනයකෙරෙයි, බුද්ධශාසනයෙහි නොකළකිරේයයිකීවා
ය, මෙසේහෙයින් මහාමිත්‍රස්ථවිරයන්වහන්සේගේකථාවස්තුවදක්
වනලදී; මේස්ථවිරතෙමේ පිණ්ඩපාතයෙන් පිදීම කුමක්සලකා
ගෙණකෙරේදැයි යනාදීන් නුවතින් ප්‍රත්‍යවේක්ෂාකොට තමහට
තෙමේම අවවාදකරගෙණ ඒ හේතුවෙන් සියළුමකෙලෙසුන්නැසී
මෙන් රහත්ව නිවන්දුටුසේක, එහෙයින් පිණ්ඩපාතා පචායනා
වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගොත්පාදයට හේතුයයි දක්වනලදී;

පිණ්ඩපාතිය තිස්සස්ථවිරයන්වහන්සේගේ වස්තුවද මේවනුදක්
වනාකාර දතයුතුයි; මාගමවනානි එක්තරා දිළිඳුවූ පුරුෂයෙක්
දරවිකිනීමෙන් ජීවිකාවෘත්තිය කෙරෙයි හෙතෙම එමහේතුකොට
තෙණ නාමය ලබා දරුභණ්ඩකමනාතිස්ස නම්විය, හෙතෙම එක්දව
සක් සියබිරින්දට මෙසේකීය, අපගේජීවිකාව කෙබඳුජීවිකාවක්ද
ශාස්තෲන්වහන්සේවිසින් දිළිඳුදනයාගේ මහත්ඵලභාවය වදාරණ

ලදී නමුත් නිතර එසේදන්දෙන්ට අපොහොසත්වූවෝවෙමු එබැ
වින් පාක්ෂිකදානයක්වත් හෙවත් පක්ෂයට වරක්වත් දන්දී නැවත
උපන්කාලයක දවසකට වරක්බැගින් සලාකදානයක්වත් දෙන්
නෙමුයි ඕතොමෝත් ස්වාමීනි එය යහපතැයි පිළිගෙණ දෙවෙනි
දින සර්වලාභපරිදි පාක්ෂිකදානයක්දුන්නීය එකාල භික්ෂුසංඝයාද
සිව්පසෙන් නිරුපද්‍රවවූයේවිය එබැවින් ලදරුසාමණේරවරු ප්‍ර
ණීතභොජනයන් අනුභවකොට ඔවුන්බලාසිටියදීම අහකදමා
යෙත් ඕතොමෝ ඒදූක අපවිසින් දෙනලදදානය බැහැරදමනලද්
දේයයි තම ස්වාමියාට කීනමුත් පසුතැවිලිනොවීය නැවත ඇගේ
ස්වාමිතෙමේ අපිදුප්පත් බැවින් ආර්‍යයන්වහන්සේලාට සුවසේව
ලදවන්ට නොහැකිවූවෝවෙමු ඒන්සා කුමක් නුමුත්කොට ආර්‍ය
යන්ගේ සිත්ගන්ට වටනේයයිකීයේය ඉක්බිති ඔහුගේ භාර්‍යාතො
මෝ තොපකුමක්කියන්නෙහිද පුත්‍රයන්සහිතවූ දුප්පත්තුනම්ඇද්ද
ඔබගේ මේදියනිය එක්කුලගෘහයක හබා කහවණුදෙළසක් ගෙන
එක්කිරි එළදෙනෙක් රැගෙණ එව එයින් ආර්‍යයන්වහන්සේලාට
කිරිමුසු සලාකදානයක් දෙන්නෙමු එසේඇතිකල්හි ඒආර්‍යයන්
වහන්සේලාගේ සිත්ගන්ට හෙවත් උන්වහන්සේලාසතුටුකරවන්ට
හැකිවන්නෙමු හෙතෙමේත් ඒයහපතැයි පිළිගෙණ එසේකොළේය
ඔවුන්ගේ පුණ්‍යචෙතනාව හේතුකොටගෙණ ඒදෙන් තොමෝත්
සවසටමාණිකාත්‍රයක්ද හෙවත් කිරිද්‍රෝණදෙළසක්ද උදේටකිරද්‍රෝ
ණදෙළසක්දදෙයි-සවස ලබනලද කිරි දී කොට දෙවෙනිදවසෙහි
එයින්ගත්තාලද වෙඬුරෙන් ගිතෙල්කොට ගිතෙල්මුසුකරණලද
ක්ෂීර සලාකදානයක්දෙන්ට පටන්ගත්තෝය එතැන්පටන් ඒදූගියා
ගේ ගෘහයෙහිවූ සලාකබත පින්වත්නුම ලබත් හෙතෙමේ එක්දව
සක් භාර්‍යාවට කියනුයේ අපිඅපගේ දුවනිය සිටිබැවින් ලජ්ජාව
කිනුත් මිදුනෙමු ගෘහයෙහිත් අපගේදානය ආර්‍යයන්ට පරිභෝජනා
හීවිය මම යම්තාක්කලකින් එන්නෙම්ද ඒතාක්නුඹ මේකල්‍යාණ
වෘත්තියෙහි පමානොවෙව මමකිසියම් උපායක්කොට අපගේ ධීතෘ
ව මුදවාගෙණ එන්නෙමියි හෙතෙම එක්ප්‍රදෙශයකට ගොස් ඉක්ෂු
යන්ත්‍රකර්මයක්කොට සමසකින් කහවනුදෙළසලැබ මාගේධීතෘව
මුදවා ගැණීමට මෙපමණක් ප්‍රමාණයයි සිතා ඒකහවණුදෙළස
ඇගතුබුවසත්‍රයෙහි දවඑකොණේ බැඳගෙණ සියගෘහයටයන්නෙමි
යි මාර්ගයටපැමිණියේය එසමයෙහි අම්බරිය නම්වෙහෙරෙහි වාසය
කරන්නාවූ පිණ්ඩපාතියතිස්ස නම්තෙරුන්වහන්සේ තිස්සමහා
විහාරයට ගොස් චෛත්‍යරාජයා වඳිනාකරන්නෙමියි සිතා තමන්
වාසයකරණස්ථානයේසිට මහගමටඑඩනේ වීථිමාර්ගයට පිළිපන්නේ
ය ඒඋවසුතෙමේ තෙරුන්වහන්සේ දුරදීම දැක මම හුදකලාව

ගොස් මේ ආයුෂ්මතුන්වහන්සේ සමග එක් ධර්මකථාවක් අසමින්යන් නෙම් සිල්වතුන් දැකීම හැමකාලයේම දුර්ලභයයි වේගයෙන් තෙරුන්වහන්සේවෙත පැමිණ උන්වහන්සේ සමග යන්නේ දන්වැලඳීමට වේලාව ළංවූ කල්හි මෙසේ සිතුයේය කෙසේද මාඅත බත් මූලක්නැත්තේය ආයුෂ්මතුන්වහන්සේටත් භික්ෂාකාලය සම්ප්‍රාප්තවිය මාසත්තකවූ වියදම්කළහැකිමුදලක් ඇත එබැවින් එක්ග්‍රාමද්වාරයකට පැමිණිකල්හි එයින් ආයුෂ්මතුන්වහන්සේට පිණ්ඩාහාරයක් ගෙනදෙන්නෙමියි ඔහුටමේසිතුවිලි උපන්මාත්‍රයෙහිම මිනිහෙක් එක් බත්මුලක් ගෙන එතනට පැමිණියේය උපාසකතෙමේ ඒ දැක ස්වාමීන්වහන්ස මදක්නවතිනුමැනවැයි කියා ඔහුසමීපයට ගොස් පින්වත් පුරුෂය තුබට කහවනුවක් දෙන්නෙමි මේබත්මුලමටදෙවයි කීය එකල්හි ඒපුරුෂතෙමේ මෙසේසිතීය මේබත මේකාලයෙහි මස්සක්පමනකුත් නොවටියි මෙතෙමේ මටඑකවරටම කහවණුවක්දෙයි මෙයි අමුතුකරුනක් ඇතැයිසිතා මම කහවණුවකින් නොදෙමැයි කීය එසේවීනම් කහවණුදෙකක්ගනුව තුනක්ගණුවයි යනාදික්‍රමයෙන් ඉල්වූනමුත් නුදුන බැවින් සියඑම කහවනුදී බත්මුලගණුකැමතිවිය අනික්තැනැත්තේද මොහුඅතතවත්කහවණු ඇතැයි යන සංඥාවෙන් නොදෙම්යිකීය එකල්හි ඒ උපාසකතෙමේ පින්වත මිත්වැඩියන් කහවණු මාඅත තිබේනම් ඒ දෙන්නෙමි මම මෙය මා උදෙසා නොගන්නෙමි මේඉදිරියෙ විද්‍යමානවෘක්ෂයමුල එක්ආයුෂ්මතුන් වහන්සේකෙනෙක් මාවිසින්වඩාහිඳුවනලද්දේය. එබැවින් මට බත්මුලදෙව නුඹටත් කුසල්වන්නේයි එසේනම් පින්වත ඒකහවණුදී ගනුවයි කහවණුගෙණ බත්මුලදුන්නේය උපාසකතෙමේ බත්කොටස ගෙණ අත්සෝදාගෙණ තෙරුන්වහන්සේවෙත පැමිණ ස්වාමීනි පාත්‍රයදුනමැනවැයි කීය ස්ථවිරතෙමේ පාත්‍රය හැර බතින්අඩක් බෙදූකල්හි අතින්පාත්‍රය වැසීය එකල්හි උපාසකතෙමේ ස්වාමීනි මේ එකම බත්කොටසය කෙනෙකුට්යැපෙනතර මමවේ මෙයින් අනුභවකරන්ට මට නොහැකිය නුඹවහන්සේ උදෙසාම මවිසින් මෙය සොයාලබනලද්දේය. මට අනුකම්පා පිණිස ඒපිළිගනුමැනවයි කීය ස්ථවිර තෙමේත් මෙහි විශේෂ හේතුවක් ඇතැයි පිළිගෙණ සියඑම බත්කොටස වැළඳූසේක, උපාසකතෙමේ ධර්මාවෙන් පැන් පෙරා පිළිගැන්වූසේක ඉක්බිති දන්වලඳා අවසානයෙහි දෙදෙනාම පෙර පරිද්දෙන්ම මාර්ගයට පිළිපන්හ ස්ථවිරතෙමේ උපාසකයා කවරකරුණකින් තොප අනාහව නොකෙළේදැයි පිළිවිසීය, හෙතෙම තමන් සම්බන්ධ සියඑම ගමනාගමන විධානය කීයේය ඒ අසා සංවේගප්‍රාප්තවූ ස්ථවිරතෙමේ උපාසකයා විසින් කරන්ට දුෂ්කරවූවක් කරණ

ලද් මාවිසිනුදු මෙබඳු පිණ්ඩපාතයක් වළඳා මෝහට කෘතඥතා
යෙන් යුක්තවූයයුතුය සප්‍රායසෙනසුනක් ලැබ එහිදීම සිව්මස්ලේ
වියලී ගියත් හුන්අස්නෙත් අර්හත්වයට නොපැමිණ නැඟීනොසිටින්
නෙම්හි සිතා තිස්සමහා විහාරයට වැඩ ආගන්තුක වතාවත්කොට
තමාට පැමිණි සෙනසුනට ප්‍රවිෂ්ටව පසතුරණු අතුරා එහි වැඩ
හුන්නේය තමන්පුරුදුකළ මූලකර්මස්ථානයම වඩන්ට පටන්ගත්
සේක ඒ රාත්‍රියෙහිදී ඕහට ඍදුණාලෝකමාත්‍රයකුත් උපදවාගන්ට
නොහැකිවිය දෙවෙනි දවස්හි පටන් භික්ෂාචාරපළිබෝධයන්සිද
යථොක්ත කර්මස්ථානයම අනුලෝම ප්‍රතිලෝම වශයෙන් බැලීය
මේ ක්‍රමයෙන් විදර්ශනා කරන්නාවූ ඒ තෙරුන්වහන්සේ සත්
වෙනි අරුනෙහිදී සව්කෙලෙස් නසා සිව්පිළිසිඹියා සහිත අර්හත්
ඵලයෙහි පිහිටා මගේශරීරය ඉතාමකලාන්තය කිමෙක්ද මගේ
ආයුසංස්කාරය තව බොහෝකලක් පවතින්නේද නොපවතින්
නේදැයි සිතීය ඉක්බිති නොපවතිනබව දැක සයනාසනය තැන්
පත්කොට තබා පාසිවුරු රැගෙණ වෙහෙරමැද්‍යයට පැමිණ බෙර
හසුරුවා සංඝසන්නිපාතය කෙළේය සංඝයාරැස්වූනුපසු සංඝස්ථ
විර තෙමේ කිනම්කෙනෙකුවිසින් සංඝයාරැස්කරණලද්දේදැයි
විචාළේය ස්වාමීනි මාවිසිනැයි කියනලදි සත්පුරුෂය කුමක්සඳ
හා රැස්කරණලද්දේද ස්වාමීනි අනික්කරුණෙක්නම්නැත එතකුදු
උවත් යම්කෙනෙකුට මාර්ගයෙහිහෝ ඵලයෙහිහෝ සැකයක් ඇත්
නම් ඔවුහු මා විචාරත්වායි කියායි සත්පුරුෂය තොපවැනි භික්ෂූහු
අසන්තගුණයක් කථනය නොකෙරෙත් අපවද මෙහි සැකයෙක්
නැත කිමෙක්ද තුඹට සංවෙගකරුණක්ඇතිවූයේද කුමක්ප්‍රත්‍ය
යකොට අර්හත්වයට පැමිණියේද ස්වාමීනි මම්මහගමෙහිවල්ලියනම්
වීථියෙහි දුරුභණ්ඩක මහාතිස්සනම් උපාසකයෙක්ඇත හෙතෙම
තමන්ගේ දියනිය බැහැරතබා කහවණුදෙළොසක්ගෙණ එයින්
කිරිදෙනක් ගෙණවුත් සංඝයාට කිරිබත් සලාකයක් තැබූයේය
ඉත් මැතකලක හෙතෙම තමන් දුවනිය මුදවාගෙණ එන්නෙ
මියිකියා ගොස් සමසක් යන්ත්‍රශාලාවක බැලමෙහෙකොට කහවනු
දෙළොස ලබාගෙණ මෙයින් ධීතෘව මුදවාගන්නෙමියි ස්වකීයගෘහ
යට යන්නේ අතරමගදී මා දැක භික්ෂාචාර වේලාව සම්ප්‍රාප්තවූ
කල්හී ඒ සියළුම කහවනුදී බත්මුලක්ගෙණ සියළුම මුල්බත මට
දුන්නේය මම ඒ ආහාරය වළඳාමෙහි අවුත් සැපසෙනස්නක්ලබා
පිණ්ඩපාතාපචායන කර්මය කරන්නෙමියි භවත් අපචායන පිණ්ඩ
පාතය වළඳා කටයුතුකර්මයකරන්නෙමියි ඥානදර්ශනවිශෙෂ සං
ඛ්‍යාත අර්හත් ඵලයට පැමිණියෙමියි කීයේය ස්ථවිරතෙමේ මෙසේ

කීකල්හී එතනට පැමිණසිටි සිව්පිරිසම තෙරුන්වහන්සේට සාධු කාර දුන්නාහ ප්‍රකෘතිභාවයෙන් සිටින්ට සමර්ථවූ කිසිවෙකු නොවූයේය ස්ථවිරයන්වහන්සේ සඟමැදහිඳ කථාකරමින් කථා කරමින්ම මෘසම්බන්ධ කුළුගෙය හෙවත් රත්සිව්ගේ දුරුහණ්ඩක මහාතිස්සනම් උවසුගේ හස්තයෙන් ස්පර්ශකළ කල්හිම චලිතවේ වායි ඉටා නිරුපධිශෙෂ නිර්වාණධාතුවෙන් පිරිනිවිසේක.

එකල්හී කාවන්තිස්ස මහරජතෙමේ එක්රහතුන් වහන්සේ නමක් පිරිනිවීසේක යන ප්‍රවෘත්තිය අසා විහාරයටගොස් ගරුබුහු මන්කොට රත්සිළිනෙයක් සාදවා මෘතදේහය එහි ආරෝපනය කොට ඒ දැවීම පිණිස චිතකස්ථානයට යන්නෙමුයි කථාකොට රත්සිව්ගෙය උස්සන්ට උත්සාහකරන්නාහු එය තුබූතැනින් සොලවන්ට පමණවත් නොහැකිවූහ ස්වාමිවරුනි මේපිරිනිවී තෙරුන්වහන්සේ විසින් කියනලද කිසිවක්ඇත්දැයි රජතෙමේ භික්ෂුසංඝයා විචාළේය භික්ෂූහුද එමතෙරනුවන්විසින් කියනලද විධිවිධාන සියල්ලක්ම රජහට ආරෝචනයකළාහ එකල්හී රජ තෙමේ ඒ උපාසකයා කැඳවා පින්වත නොපවිසින් මීට සත්දවස කට පෙර මාර්ගීයට ප්‍රතිපන්නාවූ කිසියම් භික්ෂුවක්හට පූටකහක් තයක් හෙවත් බත්මූලක් දෙනලද්දේදැයි විචාළේය හෙතෙමේත් ඒ සියළුම ප්‍රවෘත්තිය දන්වූයේය ඉක්බිතිරජතෙමේ ඔහු තෙරුන් වහන්සේගේ කූටාගාරස්ථානයට යැව්යේය යව ඒ භික්ෂුවද අනික් භික්ෂුවක්දැයි ඒ තෙරනුවන් ඇඳිනගනුවයි කීය ඒ උපාසකතෙමේ කූටාගාරස්ථානයට පැමිණ හිරයඔසවා මුහුනබලා ඇඳිනගෙණ අත්දෙක ළයමැද තබාගෙණ රජහුගේ සමීපයට පැමිණ දේවයන් වහන්ස මාවිසින් උපකාරකරණලැබූ ආර්යයන්වහන්සේයයි කී යේය ඉක්බිති රජතෙමේ මහත් ආභරණයෙන් ඔහු සරසා භ්‍රාතෘවූ මහාතිස්සය මාගේ ආර්යයන්වහන්සේට වැඳ රත්සිව්ගෙය ඔසවා ගනුවයි කීයේය උපාසක තෙමේත් දේවයන්වහන්ස ඒමැනවයි ගොස් තෙරුන්වහන්සේගේ පාදයත් විවෘතකොට දැතින් රත් සිව්ගේඔසවාගෙණ තමාහිස මතුයෙහි තබාගත්තේය එකෙණෙහි කුළුගෙය අහසට පැණනැගී ගොස් චිතකමතුයෙහිම පිහිටා චිත කායසම්බන්ධ සිව්කොනෙන් ගිනිජාලාවෝ තුමූම ඇවිලගත්හ. "දායජ්ජමහත්තපච්චවෙක්ඛණතා,, යනුවීර්‍යසම්බෝධ්‍යඞ්ගෝත්පාදයට හේතුවූ පස්වෙනි අඟයයි දායාදමහත්වය ප්‍රත්‍යවෙක්ෂා කරන්නේකෙ සේදයත්? එබව.

"මහන්තංඛොපනෙතං සත්ථුදායජ්ජං යදිදං සත්තඅරියධනානි නාම තං නසක්කා කුසීතෙන ගණ්හිතුං යථාහි විප්පටිපන්නං පුත්තං මාතාපිතරො අයං අම්හාකං අපුත්තකොති පරිබාහිරං කරො

නත්ථි සො තෙසං අච්චයෙන දායජ්ජං නලභති එවං කුසීතොපි ඉදං අරියධනදායජ්ජං නලභති ආරද්ධවිරියොව ලභතීති දායජ්ජ මහත්තං පච්චවෙක්ඛතොපි උප්පජ්ජති,,

සද්ධාධනං සීලධනං හිරිඔත්තප්පියංධනං
සුතධනං ච චාගොච පඤ්ඤාවෙ සත්තමංධනං

යනුවෙන් දක්වනලද ශ්‍රද්ධාධනය ආදී යම් ආර්‍ය්‍යධනයක් වෙත්ද ඒ මේ ආර්‍ය්‍යධන සත ඉතාමහත්ය එබැවින්ඒ ආර්‍ය්‍යධන සත හීනවීර්‍ය්‍යඇති පුද්ගලයාවිසින් ලබාගැණීම දුෂ්කරවේ යම්සේ නපුරුකොට පිළිපදින පුද්ගලයා දෙසබලා මව්පියදෙදෙන මොහු අපගේ පුත්‍රයෙක්නොවේයයි බැහැරකෙරෙත්ද ඒ පුත්‍ර තෙමේ ඒ මව්පියදෙදෙනාගේ ඇවෑමෙන් දායාදය නොලබයි හෙවත් මව්පියන් සතුධනයට හිමියෙක් නොවෙයි එපරිද්දෙන්ම අප සම්මාසම්බුදුරජාණන්වහන්සේගේ ශාසනයට ප්‍රවිෂ්ටව ක්‍රියාකරණ කුසීතපුද්ගලතෙමේද බුදුරජාණන්වහන්සේ සන්තක මේ ආර්‍ය්‍යධනදායාදය නොලබයි හෙවත් සකලක්ලේශයන් නසා ලොව්තුරා දහමටපැමිණි සර්වඥයන්වහන්සේගේ ආර්‍ය්‍යධනදායාදය ලැබීමට අභව්‍යපුද්ගලයෙක් වෙයි ආරබ්ධවීර්‍ය්‍යපුද්ගලතෙමේම ඒ ආර්‍ය්‍යධන ප්‍රතිලාභයට සවාමිවේවායි මෙසේ දායාදමහත්ත්වයනුවතින් මෙනෙහිකරමින් වාසයකිරීමෙන් වීර්‍ය්‍යසම්බෝධ්‍යඞ්ගය උපදවා උතුම්නිර්වාණයට පැමිණෙත්නේය.

“සත්ථුමහත්තපච්චවෙක්ඛනතා,, නම් ඒ වීර්‍ය්‍යසම්බෝධ්‍යඞ්ගයේත් පාදයට හේතුවූ සවැනිධර්මයයි යම්කිසි යොගාවචරපුද්ගලයෙක් ශාස්තෲන්වහන්සේගේ ගුණමහන්තතාවය යොනිසොමනස්කාරයෙන් සලකාතම් එසේ සැලකීම ඔහට වීර්‍ය්‍යසම්බෝධ්‍යඞ්ගය උපදවාගැණීමපිණිස පවත්නේවෙයි ඒබව.

“මහාබොපතනෙසත්ථා සත්ථුනො හි තෙ මාතුකුච්ඡිස්මිං පටිසන්ධිං ගණ්හනකාලෙපි අභිනික්ඛමනෙපි අභිසම්බොධියම්පි ධම්මචක්කප්පවත්තන යමකපාටිහාරිය දෙවොරොහන ආයුසංඛාරවොස්සජ්ජනෙසුපි පරිනිබ්බාණකාලෙපි දසසහස්සීලොකධාතු කම්පිත්ථ යුත්තනාම තෙ එවරූපස්ස සත්ථුසාසනෙ පබ්බජිත්වා කුසීතෙන භවිතුන්ති එවං සත්ථුමහත්තං පච්චවෙක්ඛතොපි උප්පජ්ජති,,

මෙහි විස්තරසහිත භාවය භාවනානුයොගීපුද්ගලතෙමේ තමහටම මෙසේ අවවාදකරයි එනම් තොපගේ ශාස්තෲන්වහන්සේ ඉතාමහත්ය තොපගේ ශාස්තෲන්වහන්සේගේ ප්‍රතිසන්ධිග්‍රහණකාලයෙහිද දසසහස්‍රීලෝකධාතුව එකාහැර කම්පාවිය ඒබව.

“බොධිසත්තස්ස පන මාතුකුච්ඡිම්හි පටිසන්ධිග්ගහණක්ඛණෙ එකප්පහාරෙනෙව සකලදසසහස්සී ලොකධාතු සංකම්පි සම්පකම්පි සම්පවෙධි ද්වත්තිංසපුබ්බනිමිත්තානි පාතුරහිංසු දසසු චක්කවාළසහස්සෙසු අප්පමාණො ඔභාසො ඵරි තස්ස තං සිරිං දට්ඨුකාමා'විය අන්ධා චක්ඛූනි පටිලභිංසු බධිරා සද්දං සුණිංසු මූගා සමාලපිංසු ඛුජ්ජා උජුගත්තා අහෙසුං පඞ්ගුලා පදසාගමනං පටිලභිංසු බන්ධනගතා සබ්බසත්තා අන්දුබන්ධනාදීහි මුච්චිංසු සබ්බනරකෙසු අග්ගිනිබ්බායි පෙත්තිවිසයෙ ඛුප්පිපාසා වූපසමි තිරච්ඡානානං භයං නාහොසි සබ්බසත්තානං රොගො වූපසමි සබ්බසත්තානං පියංවදා අහෙසුං මධුරාකාරෙන අස්සා හසිංසු වාරණා ගජ්ජිංසු සබ්බතූරියානි සකසකනින්නාදං මුඤ්චිංසු අඝට්ටිතානියෙව මනුස්සානං හත්ථූපගාදීනි ආභරණානි විරවිංසු සබ්බදිසා විප්පසන්නා අහෙසුං සත්තානං සුඛං උප්පාදයමානො මුදුසීතලො වාතො වායි අකාලමෙඝො පවස්සි පඨවිතොපි උදකං උබ්භිජ්ජිත්වා විස්සන්දි පක්ඛිනො ආකාසගමනං විජහිංසු නදියො අසන්දමානා අට්ඨංසු මහාසමුද්දෙ මධුරං උදකං අහොසි සබ්බත්ථකමෙව පඤ්චවණ්ණෙහි පදුමෙහි සඤ්ඡන්නතලො අහොසි ථලජජලජාදීනි සබ්බපුප්ඵානි පුප්ඵිංසු ථලෙසිලාතලානි භින්දිත්වා උපරූපරි සත්තසත්තාහුත්වා දණ්ඩපදුමානි නාම නික්ඛමිංසු ආකාසෙ ඔලම්බක පදුමානි නාම නිබ්බත්තිංසු සමන්තතො පුප්ඵවස්සා වස්සිංසු ආකාසෙ දිබ්බතූරියානි වජ්ජිංසු සකලදසසහස්සීලොකධාතු වට්ටෙත්වා විස්සට්ඨමාලාගුළංවිය උප්පීළෙත්වා බද්ධමාලාකලාපොවිය අලංකත පටියත්තං මාලාසනංවියච එකමාලමාලිනී විප්ඵුරන්තවාළබීජනී පුප්ඵධූපගන්ධපරිවාසිතා පරමසොභග්ගප්පත්තා අහොසි එවං ගහිත පටිසන්ධිකස්සබොධිසත්තස්ස පටිසන්ධිතො පට්ඨාය,,

යනාදීන් දක්වනලදී මහාභිනිෂ්ක්‍රමණකාලයෙහිද ලෝකධාතුව කම්පාවිය එබව.

“එවංචපනස්ස චිත්තෙ උප්පන්නමත්තෙයෙව මහාපුරිසත්තයා නිවත්තිත්වා ඔලොකන කම්මං කත්තන්ති වදමානාවිය මහාපඨවී කුලාලචක්කංවිය ඡිජ්ජිත්වා පරිවත්ති බොධිසත්තො නගරාභිමුඛො ඨත්වා නගරං ඔලොකෙත්වා තස්මිං පුථුවිප්පදෙසෙ කන්ථක නිවත්තන චෙතියට්ඨානං දස්සෙත්වා ගන්තබ්බමග්ගාභිමුඛං කන්ථකං කත්වාපායාසි මහන්තෙන සක්කාරෙන උළාරෙන සිරිසොභග්ගෙන තදාකිරස්ස දෙවතාපුරතො සට්ඨිං උක්කාසහස්සානි ධාරයිංසු පච්ඡතො සට්ඨිං දක්ඛිණපස්සතො සට්ඨිං වාමපස්සතො සට්ඨිං අපරාදෙවතා චක්කවාළමුඛවට්ටියං අපරිමාණා උක්කා ධාරයිංසු අපරාදෙවතාච නාගසුපණ්ණාදයොච දිබ්බෙහි ගන්ධෙහි මාලාහි චුණ්ණෙහි

ධූපෙහි පූජයමානා ගච්ඡන්ති පාරිච්ඡත්තකපුප්ඵෙහි චෙව මන්දාරව පුප්ඵෙහිච සතමෙඝ වුට්ඨිකාලෙ ධාරාහි විය නභන්තිරන්තරං අහොසි දිබ්බානි සංගීතානි පවත්තන්ති සමන්තතො අට්ඨතුරියානි සට්ඨිතුරියානීති අට්ඨසට්ඨිතුරියසතසහස්සානි පවජ්ජිංසු සමුද්දකුච්ඡියං මෙඝත්ථනිතකාලෙවිය යුගන්ධරකුච්ඡියං සාගරනිග්ඝොසකාලෙවිය වත්තති ඉමිනා සිරිසොභග්ගෙන ගච්ඡන්තො බොධිසත්තො එකරත්තෙනෙව තීනිරජ්ජානි අතික්කම්ම තිංසයොජනමත්ථකෙ අනොමානාමනදිතීරං පාපුනි,,

මේආදිවශයෙන් මහාභිනික්මන් කාලයෙහිද මහාපෘථුවිය කම්පාවීමෙන් ආශ්චය්‍යීකරුණුපහළවිය ඒහැර සම්‍යක්සම්බොධියෙහිදීද හෙවත් සමත්‍රිංශත්පාරමී ධර්‍මයන් පූරණයකොට සව්කෙලෙස් නැසීමෙන් ලොව්තුරාබුද්ධත්වයට පැමිණිසමයෙහිද දසසහශ්‍රී ලෝකධාතුව කම්පාවිය කම්පිතපරිදිනම් ''අථස්ස චාදසපදිකං පච්චයාකාරං වට්ටවිවට්ටවසෙන අනුලොම පටිලොමතො සම්මසන්තස්ස සම්මසන්තස්ස දසසහස්සී ලොකධාතු උදකපරියන්තං කත්වා ද්වාදසක්ඛත්තුං සංකම්පි මහාපුරිසෙ පන දසසහස්සී ලොකධාතුං උන්නාදෙත්වා අරුණුග්ගමනවෙලාය සබ්බඤ්ඤුතං ඤාණං පටිවිජ්ඣන්තෙ සකලදසසහස්සී ලොකධාතු අලංකත පටියත්තා අහොසි පාචීන චක්කවාලමුඛවට්ටියං උස්සාපිතානං ධජානං පටාකානං පච්ඡිමචක්කවාල මුඛවට්ටියං පහරන්ති තථා පච්ඡිමචක්කවාල මුඛවට්ටියං උස්සාපිතානං පාචීනචක්කවාලමුඛවට්ටියං උත්තරචක්කවාලමුඛවට්ටියං උස්සාපිතානං දක්ඛිණචක්කවාලමුඛවට්ටියං දක්ඛිණචක්කවාලමුඛවට්ටියං උස්සාපිතානං උත්තරචක්කවාල මුඛවට්ටියං පහරන්ති පථවිතලෙ උස්සාපිතානං පන ධජානං පටාකානං බ්‍රහ්මලොකං ආහච්ච අට්ඨංසු බ්‍රහ්මලොකෙ බද්ධානං පථවිතලෙ පතිට්ඨහිංසු දසසහස්සචක්කවාලෙ පුප්ඵූපග රුක්ඛා පුප්ඵානි ගණ්හිංසු ඵලූපගරුක්ඛා ඵලපිණ්ඩිභාරභරිතා අහෙසුං,,

යනාදී වශයෙන් මෙසේම ඉසිපතනනම් අරම්හිදී අඤ්ඤාකොණ්ඩඤ්ඤ භද්දිය වප්ප අස්සජි මහානාම යන පස්වග මහනුන් ඇතුළු අටළොස් කෙළක් දෙව්බඹුන්ට දම්සක් පැවැත්වූ සමයෙහිද යමකප්‍රාතිහාය්‍යීය දේවෝරෝහන ආයුසංස්කාරවොස්සජ්ජනය යන සමයන්හිද දසසහශ්‍රීලෝකධාතුව කම්පාව්ය තවද ඒ බුදුරජාණන් වහන්සේ පන්සාළිස්වසක් මුළුල්ලෙහි සියළු සත්වයාට දහම්නැමති අමාරසපොවා පරිනිර්‍වාණයකළකාලයෙහිද දසසහශ්‍රීලෝක

ධාතුව කම්පාවූයේය ඒබව "පරිනිබ්බුතෙ භගවති සහපරිනිබ්බානා මහාභූමිචාලො අහොසි,,

යනාදීන් භාග්‍යවත්බුදුරජාණන්වහන්සේ සකන්ධපරිනිර්වාණයෙන් පිරිනිවීකල්හි ඒපරිනිර්වාණයසමගම මහාභූමිචලනයවූයේය හෙවත් දසදහසක් සක්වල එකතින් නාදවූයේය යෝගාවචර පුද්ගලතෙමේ මෙසේ බුදුරජාණන්වහන්සේගේ ගුණ මහිමයන් නුවනින් සලකා මෙබඳු ශාස්තෘත්වහන්සේ කෙනෙකුගේ ශාසනයෙහි පැවිදිබවට පැමිණ අධිකුසලධර්මයෙහි නොහැසිර කුසීතවන්ට නුඹටසුදුසුදැයි තෙමේතමහටම අවබෝධකොට ශාස්තෘන්වහන්සේගේ ගුණමහත්ත්වය ප්‍රත්‍යවෙක්ෂාකිරීමෙන් වීර්‍ය්‍යසම්බෝධ්‍යඞ්ගය වඩා අර්හත්වයටපැමිණ උතුම්නිවන්දක්නේය.

"ජාතිමහත්තපච්චවෙක්ඛනතා" යනු සත්වෙනි ධර්මයයි එහි තේරුම ජාතිමහත්ත්වය ප්‍රත්‍යවෙක්ෂාකිරීමයි අර්ථකථාවෙහි.

"ජාතියාපි ත්වං ඉදානි න ලාමකජාතිකො අසම්භින්නාය මහාසම්මතපවෙනියා ආගත ඔක්කාකරාජවංසෙ ජාතොසි සුද්ධොදනමහාරාජස්සච මහාමායාදෙවියාච නත්තාරාහුලභද්දස්ස කනිට්ඨො තයා නාම එවරූපෙන ජිනපුත්තෙන හුත්වා නයුත්තං කුසීතෙන විහරිතුන්ති එවං ජාති මහත්තං පච්චවෙක්ඛතොපි උප්පජ්ජති,,

මෙහි භාවය වීර්‍ය්‍යසම්බෝධ්‍යඞ්ගය වඩන භික්ෂුතෙමේ තමහට අවවාදකරන්නේය නුඹදූත් ජාතියෙන්ද හෙවත් වංශයෙන්ද හීනජාතිකයෙක්නොවේ අසම්භින්නමහාසම්මත රාජපරම්පරානුයාත ඔක්කාක රාජවංශයෙහි උපන්නේවෙහිය සුද්ධෝදනමහරජහුගේද මහාමායාදේවියගේද මුනුබුරෙක රහල්කුමරුහුගේ බාලසහෝදරකෙනෙක එබඳුවූ නුඹ දූත් සර්වඥපුත්‍රයකෙනෙක්ව කුසීතව වාසය කරන්ට යුතුනැතැයි මෙසේ ජාතිමහත්ත්වය ප්‍රත්‍යවෙක්ෂාකිරීමෙන්ද වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය උපදවා අර්හත්වයට පැමිණීමෙන් උතුම්නිවන්සම්පත්ලබන්නේය. එබැවින් ජාතිය සම්බන්ධ උත්තමභාවය හා පරම්පරාවෙහි ශ්‍රේෂ්ඨභාවයත් කල්පනාකර මීටත් වඩා ශ්‍රේෂ්ඨ උවනොත් සෙහෙකැයියනඅදහසින් ජාතිමහත්ත්වය මෙනෙහි කිරීම වීර්‍ය්‍යසම්බෝධ්‍යඞ්ගෝත්පාදයට හේතුවන්නේය "සබ්‍රහ්මචාරිමහත්තපච්චවෙක්ඛනතා,, යනු අටවෙනි අඞ්ගයයි සබ්‍රහ්මචාරීමහරහතුන්වහන්සේලාගේ ගුණමහත්ත්වයහා උන්වහන්සේලා වැඩී මාර්ගය ප්‍රත්‍යවෙක්ෂාකිරීමයි ඒ මෙසේයි.

"සාරිපුත්තමොග්ගල්ලානාවෙච අසීතිමහාසාවකාච විරියෙනෙව ලොකුත්තරධම්මං පටිවිජ්ඣිංසු ත්වං එතෙසං සබ්‍රහ්මචාරීනං මග්ගං

පටිපජ්ජසි න පටිපජ්ජිස්සති එවං සබ්‍රහ්මචාරී මහත්තං පච්චවෙක්ඛ තොපි උප්පජ්ජති,, ශාරීපුත්‍රමෞද්ගල්‍යායනයන්වහන්සේලාද අසූම හාසව්වන්වහන්සේලාද එනම්.

කොණ්ඩඤ්ඤ, භද්දිය, වප්ප, මහානාම, අස්සජි, උපතිස්ස කොලිත, පුණ්ණ, අනුරුද්ධ, කස්සප, භද්දිය, කිම්බිල, චුන්ද, නන්ද, ආනන්ද, රාහුල, උපසෙන, නාලක, දබ්බ, සොණ, සීවලී, සොභිත, සුණාපරන්ත, පුණ්ණ, රෙවත, පුනරෙවත, කුමාරකස්සප, රාධ, වංගීස, සොභිත, භගු, සෙළුදායි, භද්දාලි, භද්දිය, ලකුණ්ටක, තොදෙය්‍යපුත්ත, උභය, චතුසාණ්ණ, පෝසල, පුණ්ණක, ධොතක, නන්ද, උපසීව, හෙමක, මෙඝරාජ, අජිතතිස්ස, මෙත්තගු, පිංගිය, මෞඝිය, කොසීත, ජන්ත, උපවාන, භද්දජි, කප්පින, මහාකප්පින, රට්ඨපාල, වක්කලි, සාගත, ලක්ඛණ, භාරද්වාජ, ගවම්පති, යස, පුණ්ණ, කච්චායන, පන්ථක, චූලපන්ථක, පිලින්දවච්ඡ, කුණ්ඩධාන, භග්ගුල ,නන්දිය, කස්සප, භද්‍රාවුධ, අඟුලිමාල, කස්සප, ගයාකස්සප, අචෙලකස්සප, උරුවෙලකස්සප, සුභූති, සභිය;

යන අසූමහා ශ්‍රාවකයන්වහන්සේලාද චතුර්විධ වීර්‍ය්‍යාංගයෙන් යුක්තවව නවලොව්තුරුදහම්ප්‍රතිවේධ කළාහ නුඹ මේ සබ්‍රහ්මචරීන්විසින් ගනමාර්ගයෙහි පිළිපදින්නෙහිද, නොපිළිපදින්නෙහිදයි මෙසේ සබ්‍රහ්මචාරීමහත්ත්වය ප්‍රත්‍යවෙක්ෂාකාරණ භාවනානුයොග පුද්ගලයාද වීර්‍ය්‍යසම්බෝධ්‍යංගය වඩා නිවන්දක්නේය, "කුසීත පුග්ගලපරිවජ්ජනතා,, යනු නවවෙනි හේතුධර්මයයි කෙබඳුකුසීත පුද්ගලපරිවර්ජනයක්දයත්?

"කුච්ඡිංපූරෙත්වාසීන අජගරසදිසෙ විස්සට්ඨ කායික චෙතසික විරියෙ කුසීතපුග්ගලෙ පරිවජ්ජනතස්සාපි" යනාදීන් දක්වන ලද බැවින් කුසපුරවාගෙණසිටි පිඹුරන්සදෘශ හරණලද කායික චෛතසික වීර්‍ය්‍ය ඇති කුසීතපුද්ගලයන් සේවනය නොකරණ පුද්ගලයාවද වීර්‍ය්‍යසම්බෝධ්‍යංගය උපදී.

"ආරද්ධවිරියපුග්ගලපරිවජ්ජනතා,, යනුදසවෙනි ධර්මයයි එහි අදහසනම් පටන්ගන්නාලද වීර්‍ය්‍යඇති කෙලෙසුන් නැවීමෙහි යුක්තප්‍රයුක්ත භාවනානුයොගී යෝගාවචරයාවද වීර්‍ය්‍යසම්බෝධ්‍යංගය උපදී හෙවත් අභිඥායට හේතුවූ යහපත් අභයක්වූ වීර්‍ය්‍යය වඩා ඒ අභිඥාය ලබා ශාන්තලක්ෂණනිර්වාණයට පැමිණෙන්නේය, "තදධිමුත්තතා,, යනු එකොළොස්වෙනි අඞ්ගයයි එහි භාවය ඨානනිසජ්ජාදිසු විරියුප්පාදනත්ථං නින්න පොන පබ්භාරචිත්තස්සාපි උප්පජ්ජති. යනුහෙයින් ස්ථානනිසද්‍යාදි ඉරියව්විසයෙහි වීර්‍ය්‍යයෝත්පාදයට

නිම්න පොන ප්‍රග්භාර සිත්ඇති තැනැත්තාහටද වීය්‍යීසම්බෝධ්‍ය ඞ්ගය උපදී යනුයි එබැවින් ආදිකර්මික කුලපුත්‍රතෙමේ යථොක්ත එකාදසධර්මයන් හේතුකොටගෙණ වීය්‍යීසම්බෝධ්‍යඞ්ගය උපදවා ඒම සන්නිඹිකොටගෙණ එහිම අභිනිවේසප්‍රාප්තව පිළිවෙලින් එකා දසක්‍රමයකින් අභිවෘධ්‍යනනිසි හෙතෙම අභිජ්මාගීය දක්වාම වීය්‍යී සම්බෝධ්‍යඞ්ගය වඩන්නේනම්වෙයි එලෙපනෙනභාවිතො නාමහො ති යනුහෙයින් අභිත්එලසෙහිපිහිටිකල්හිඋක්තප්‍රකාරබෝධ්‍යඞ්ගය වැඩූකෙනෙක්වීනැවත ස්බඛපරිනිර්වාණයෙන් නිවන්දක්නේය,

"එකාදසධම්මා පිතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති බුද්ධානුස්සති. ධම්ම සංඝ සීල චාග දෙවතානුස්සති උපසමානුස්සති ලූඛපුග්ගලපරිවජ්ජනතා සිනිද්ධපුග්ගලසෙවනතා පසාදනියසුත්තන්තපච්චවෙක්ඛනතා තදධිමුත්තතා,, ති ..... පීතයතිතිපීති පිනවානුයි ප්‍රීතිනම්වේ.

මෙහි බෝධ්‍යඞ්ගභාවය හා නිශ්‍රිතභාවයත් යටකී පරිදිමැයි පින වීම් සවභාවය පමණක් වෙනසයි ප්‍රීතියපංචප්‍රකාරවේ.

"පීතිපඤ්චවිධාහොති ඛුද්දිකාපීති ඛනිකාපීති ඔක්කන්තිකාපීති උබ්බෙගාපීති ඵරණාපීතීති තත්ඛුද්දිකාපීති ශරීරෙලොමහංසමත්තමෙවකාතුංසක්කොති ඛණිකාපීති ඛණෙඛණෙවිජ්ජුප්පභාසදිසාහොති ඔක්කන්තිකාපීති සමුද්දතීරං වීචිවියකායං ඔක්කම්ත්වා ඔක්කමිත්වා භිජ්ජති උබ්බෙගාපීති බලවතීහොති කායංඋද්ධංකත්වා ආකාසෙලඞ්ඝාපනප්පමාණප්පත්තා ,,

යනුවෙන්දක්වනලදී ක්‍ෂුද්‍රිකප්‍රීතිය හෙවත් කුඩාප්‍රීතිය ක්‍ෂණික ප්‍රීතිය අවක්‍රාන්තික ප්‍රීතිය උද්වේගප්‍රීතිය ඵරණප්‍රීතියයි ප්‍රීතියපඤ්චවිධවේ එහි ක්‍ෂුද්‍රික එනම් කුඩාප්‍රීතිය ශරීරයෙහි රෝමෝත්ගමනය පමණක් ඇතිකරන්ට හැකිවෙයි ක්‍ෂණික ප්‍රීතිය ක්‍ෂණක්‍ෂණයෙහි උපදින විදුලිආලෝකය සදෘශව ක්‍ෂණක්‍ෂණයෙහි ප්‍රීතිආලෝකය ගෙණදෙයි අවක්‍රාන්තික ප්‍රීතිය මුහුදුතෙරපවත්නා රළමෙන් කය ඉදිරියට ඔසවා දමදමා බිඳියන ස්වභාව ඇතිවෙයි කයප්‍රවෘත්තියෙන් මතුකොට අහසෙහි ලඞ්ඝාපනප්‍රමාණයට පැමිණියේ නොහොත් අහසෙහි එල්බවන්ට තරම් ශක්තිසවභාවයක් ඇත්තේ උද්වේගප්‍රීතියයි ඊටනිදර්ශනයක්

පූර්ණවල්ලිකාවිහාරවාසී මහාතිස්සස්ථවිරයන්වහන්සේ එක් පසළොස්වක් පොහෝදිනයෙක සවස්වේලෙහි චෛත්‍යාඞ්ගනයට පැමිණ බබලනචන්ද්‍රාලෝකය දැක මහාචෛත්‍යයට අභිමුඛව දුන් සිව්පිරිස මහාචෛත්‍යය වඳිත්යයි ප්‍රකෘතියෙන්දක්නාලද අරමු

නක් වශයෙන් බුදුරජානන්වහන්සේ අරමුනුකොට උබ්බෙගප්‍රීතිය
උපදවා ප්‍රථුවිතලයෙහි පහරණලද චිත්‍රභෙණ්ඩුකයක් මෙන් හෙවත්
ශක්තිවත්පුරුෂයෙක් පොළොවේගසනලද විසිතුරුබෝලයක්
මෙන් අහසටනැගී චෛත්‍යාඞ්ගනයෙහිම පිහිටියේය. එසේම ගිරි
කණ්ඩකනම් විහාරයට උපනිශ්‍රයවූ වත්තකාලකනමැති ගමෙහි
එක්තරා කුලධීතෘවක්තොමෝද බුදුන්අරමුණුකොට උපන් උබ්බෙ
ගප්‍රීතියෙන් අහසින්ගමන්කළාය, එනම් ඇගේමව්පියදෙදෙනා ස
වස්වේලෙහි ධර්‍මශ්‍රවණය සඳහා විහාරස්ථානයට යන්නාහු දියනිය
තුඹ බරවූ දරුගැබ්ඇත්තී චාරිකාකරන්ට නොහැකිවන්නෙහිය
අපි තුඹෙගඹනකොට හෙවත් තුඹවෙනුවටත් අපිමගොස්බණඅ
සන්නෙමුයයි දියනියන්නවත්වා ධර්‍මශ්‍රවණයට පැමිණියාහ. ඕතො
මෝත් යනුකැමැත්තී නමුදු ඒ දෙමව්පින්ගේ වචනය අත්හරින්ට
නොහැකිබැවින් ගෙදරම නැවත්තී ගෘහාඞ්ගනයෙහි හෙවත් ගෙහි
මිදුලෙහිසිට චන්ද්‍රාලෝකයෙන් ගිරිකණ්ඩකවිහාරයෙහි චෛත්‍යාඞ්ග
නයසම්බන්ධ අහසබලාසිටින්නී චෛත්‍යය උදෙසා කරණලද ප්‍රදීප
පූජාලෝකය දුටුවාය ඒ හැර මල්ගඳආදීන් චෛත්‍යයපුදාප්‍රදක්ෂිණ
කරණ සිව්පිරිසද භික්ෂුසංඝයාගේ ගණසජ්ඣායනයෙහි ශබ්දයදා
ඇසුවාය ඉක්බිති ඈට මේ සිතවිය විහාරයටනොස් මෙවැනි චෛ
ත්‍යාඞ්ගනයෙක්හි අනුසංචරණය කරන්ටද මෙබඳු මිහිරිධර්‍මකථා
අසන්ටද වේනම් ඒ මගේ පුණ්‍යවන්තකමක්යයි සිතා මුතුරුසක්ස
දෘශ චෛත්‍යයබලාසිටියදීම ඈට උබ්බෙගප්‍රීතිය උපන්නේය. එකණෙ
හිම ඕතොමෝ අහසට පැණ මව්පියන්ට පළමුකොටම ආකාශයෙන්
ගොස්චෛත්‍යාඞ්ගනයට බැස චෛත්‍යයවැඳ බණඅසමින් සිටි
යාය ඉක්බිති මව්පියදෙදෙන ඈවෙත පැමිණ දියනියනි තුඹ කි
නම් මාර්ගයකින් පැමිණියාදැයි විචාළෝය ඕතොමෝ මාර්ගයකින්
නොව අහසින් ආවෙමියි කීය දුවනිය ක්ෂයකරණලද ආශ්‍රවඇති
රහතුන්වහන්සේලා නම් අහසෙහි ගමන්කෙරෙත් තුඹ කෙසේ
නම්අහසින් ආවාදැයිවිචාරණලද්දී මෙසේකීවාය චන්ද්‍රාලෝකයෙන්
චෛත්‍යයදෙස බලමින් සිටි මට බුදුන්අරමුණුකොට බලවත් ප්‍රී
තියක් උපන්නීයඑකල මම තමාසිටිබවක්හෝ හුන්බවක්හෝ දැන
නොගත්තෙමිගන්නාලද නිමිත්තසමගම අහසට පැණ චෛත්‍යාඞ්ග
නයෙහිමපිහිටියාවෙමියිමෙසේඋබ්බෙගප්‍රීතිය අහසෙහි ලඞ්ඝාපනප්‍රමා
ණවූවක්වේඵරණාප්‍රීතිය නම් පූරිතවස්තිකෝෂයක්මෙන්සැමතැනම
එකාපරිදි පැතිර පවත්නා ප්‍රීතියයි උක්තප්‍රකාර ප්‍රීතියද මාර්ගඥනාව
බෝධයට යහපත්වූ අඞ්ගයක්යන අර්ථයෙන් ප්‍රීතිසම්බෝධ්‍යඞ්ග
නම්වේ ප්‍රීතිසම්බෝධ්‍යඞ්ගෝත්පාදයට හෙතුවූ එකාදස ධර්‍මයන්

අතුරෙන් පළමුවැනිවූයේ බුද්ධානුස්මෘතියයි "බුද්ධං ආරබ්භ උප්පන්නා අනුස්සති බුද්ධානුස්සති බුද්ධගුණාරම්මණාය සතියා එතං අධිවචනං බුදුන් අරබයා උපන් අනුස්මෘතිය බුද්ධානුස්මෘතියයි බුදුගුණ අරමුණුකොටගෙන පවත්නා සිහියට මේනමෙකි යනුබැවින් බුදුරජාණන්වහන්සේ සම්බන්ධව පවත්නා යම්ගුණසමූහයක්මේ නම් ඒ ගුණයන්අරමුණුකොට පවත්නාවූ සිහියට බුද්ධානුස්මෘතියයි කියනුලැබේ සකලලෝකශිවඞ්කරවූ භාග්‍යවත්බුදුරජාණන්වහන්සේ.

"ආරකත්තාහතත්තාච කිලෙසාරිනසොමුනි
හතසංසාරචක්කාරො පච්චයාදීනචාරහො
නරහොකරොතිපාපානි අරහංතෙන පවුච්චතී,,ති.

යනාද්‍යර්ථයෙන් අර්හත්නම්වනසේක "සම්මා සාමඤ්ච සබ්බධම්මානං බුද්ධත්තාපන සම්මාසම්බුද්ධො,, මොනවටනමන්වහන්සේම ස්වයම්භූඥානයෙන් සියළුධර්මයන් අවබොධකළහෙයින් සම්‍යක් සම්බුද්ධනම් වනසේක.

විපස්සනාඤාණමනොමයිද්ධි ඉද්ධිප්පභෙදොපිචදිබ්බසොතං
පරස්සචෙතොපරියායඤාණං පුබ්බෙනිවාසානුගතංචඤාණං
දිබ්බංචචක්ඛාසවසංඛයොච එතානිඤාණානිඉධට්ඨවිජ්ජා.

විදර්ශනාඥානය මනොමයඍද්ධිය ඍද්ධිවිධඥානය දිව්‍යශ්‍රොත්‍රඥානය පරචිත්තවිජානනඥානය පූර්වේනිවාසානුස්මෘතිඥානය දිව්‍යචක්ෂුරභිඥානය ආශ්‍රවක්ෂයකරඥානය යනඅෂ්ටවිද්‍යාවෙන්ද

සීලංවරං ඉන්ද්‍රියසංවරොච
මත්තාසිතාජාගරියානුයොගො
සද්ධාහිරොත්තප්ප බහුස්සුතත්තං
පරක්කමොචෙවසතීමතීච,

චත්තාරිඣානානිච තානිමානි
තිපඤ්චධම්මාචරණානිජඤ්ඤ
එතෙහිවිජ්ජාහිචසම්පයොගා
සම්පන්නවිජ්ජාචරණො මුනින්දෙති.

සීලය ඉන්ද්‍රියසංවරය භෝජනයෙහිපමණදත්මය නිදිදුරුකිරීමය ශ්‍රද්ධාවය පාපයටපිළිකුල්වූලජ්ජාවය පාපයටභයවූ ඔත්තප්පය බහුශ්‍රැතභාවය පරාක්‍රමය සිහියය ප්‍රඥාවය ප්‍රථමධ්‍යානය ද්විතීයධ්‍යානය තෘතීයධ්‍යානය චතුර්ථධ්‍යානය යනපසළොස්චරණධර්මයෙන්ද මෙසේ පූර්වොක්ත අෂ්ටවිද්‍යාවෙන්හා මෙකීපසළොස්

චරණ ධර්මයන්ගෙනුත් යුක්තබැවින් ඒ මුනීන්ද්‍රතෙමේ විද්‍යාචරණ සම්පන්න නම්වනසේක.

"සොභනගමනත්තා සුන්දරං ඨානං ගතත්තා සම්මාගතත්තා සම්මාච ගදත්තා සුගතො"යි

යනුහෙයින් සොභන හෙවත් නිරවද්‍යගමන්ඇති බැවින්ද සුන්දරස්ථානසංඛ්‍යාත නිර්වාණයට වැඩිහෙයින්ද මනාව වැඩිහෙයින්ද හෙවත් ඒ ඒ මාර්ගවලදී ඒ ඒ කෙලශයන් පිළිවෙලින් ප්‍රහීන කෙරෙමින් වැඩිහෙයින්ද මනාතෙපුල්ඇතිහෙයින්ද නොහොත් "සුප්පතිට්ඨිතපාදතා හෙට්ඨාපාදතලෙසු චක්කානි ජාතානි සහස්සරානි සනෙමිකානි සනාභිකානි සබ්බාකාරපරිපූර්ණලක්ඛණතා ආයත පණ්හිතා දීඝඞ්ගුලිතා" යනාදීන් දක්වන දෙතිස්මහාපුරුෂ ලක්ෂණ යෙන්හා "චිත්තඞ්ගුලිතා අනුපුබ්බවඩ්ඪඞ්ගුලිතා වට්ටඞ්ගුලිතා තම්බනඛතා සිනිද්ධනඛතා තුඞ්ගනඛතා නිගූල්හගොප්ඵකතා" යනාදීන් දක් වන අසූවක්පමණ අනුව්‍යඤ්ජනයන්ගෙන්ද යුක්තවූ යහපත් බුද්ධ ශරීරයක්ඇති හෙයින්ද ඒලෝකස්වාමීතෙමේ සුගත නම්වන්නේය. "සබ්බථා විදිතලොකත්තා ලොකවිදූ" සත්ව සංස්කාර අවකාශ යන ලෝකත්‍රය සර්වප්‍රකාරයෙන් හස්තාමලකයක්සේ දතවදාළහෙයින් ඒ බුදුරජතෙමේ ලෝකවිදූනම් වනසේක. "නත්ථි උත්තරතරො එතස්මාති අනුත්තරො"යි වියූබැවින් මුන්වහන්සේටවඩා අතිසයින් උත්තරිතරකෙනෙක්නැතිහෙයින් ඒභාග්‍යවත්තෙමේ අනුත්තර නම්වනසේක. "පුරිසදම්මෙ සාරෙතීති පුරිසදම්මසාරථි දමෙති විනෙතීති වුත්තං හොති" යනුහෙයින් උග්‍රවූඝෝරවූ විෂතේජස්ඇත්තාවූ අජපාලනාගරාජයාය චූලෝදර මහෝදර නාගරාජයෝය අග්ගිසිඛධූමසිඛනාගරාජයෝය ධනපාලනම් හස්තිරාජයාය යනාදී තිරශ්චීනපුරුෂයෝද සච්චක නිගණ්ඨපුත්‍ර අම්බට්ඨ මානවක පොක්ඛරසාති සොණදණ්ඩ කූටදන්තය යනාදිමනුෂ්‍යපුරුෂයෝද ආලවක සූචිරෝම ඛරරෝම යනාදීයක්ෂ පුරුෂයෝද ශක්‍රදෙවේන්ද්‍ර බක බ්‍රහ්මාදී අමනුෂ්‍යපුරුෂයෝද දමනයකරණලද්දේය එබැවින් අන් කෙනෙකුට දමනය නොකළහැකි සියළුපුරුෂයන් සර්වප්‍රකාරයෙන් දමනයකරන්ට හැකිවේය යනඅර්ථයෙන් පුරිසදම්මසාරථිනම් වන සේක. ඉහාත්මයෙහි මෙලොවින් වන අර්ථය මතු ආත්මයෙහි පර ලොවින් වන අර්ථය නිර්වාණ සංඛ්‍යාත පරමාර්ථය යන මේ තුන් ප්‍රකාර අර්ථයන් අතුරෙන් යම් යම් පුද්ගලයෙක් යම් යම් අර්ථය කට සුදුසු වන්නේද ඒ ඒ පුද්ගල සංඛ්‍යාත දිව්‍ය මනුෂ්‍යාදීන්ට ඒ ඒ අර්ථයෙන් අනුශාසනා කරණ හෙයින් ඒ භාග්‍යවත්තෙමේ දෙවිමිනිසුන්ට ශාස්තෘනම් වනසේක. "චත්තාරිසච්චානි අබුජ්ඣි

බුජ්ඣති බුජ්ඣිස්සතීති බුද්ධො,, චතුරාර්‍ය සත්‍යධර්මයන් අතීතයෙහිදු අවබෝධකෙළේය. දැනුදු අවබොධකෙරෙයි මත්තෙහිදු අවබොධ කරන්නේය යන අර්ථයෙන් තථාගතතෙමේ බුද්ධනම්වනසේකැයි යනාදී වශයෙන් බුද්ධගුණානුස්මරණය කිරීමද ප්‍රීතිසම්බොධ්‍යඞ්ගෝත්පාදයට හේතුවූ පළමුවැනි කාරණයවේ.

"ධම්මං ආරබ්භ උප්පන්නා අනුස්සති ධම්මානුස්සති" ධර්මය අරබයා උපදනා අනුස්මෘතිය ධර්මානුස්මෘතියයි "ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො,, යනාදීන් දක්වන පර්‍ය්‍යාප්තිය සහිත සෝවාන් ආදී සතරමඟ සතර ඵලයද නිර්වාණයද යනමේ නවලෝකෝත්තර ධර්මය අරමුණුකොට නැවත නැවත උපදනා සිහියට ධර්මානුස්මෘතියයි කියනුලැබේ. උක්තප්‍රකාර නවලෝකෝත්තර ධර්මය සම්බන්ධ ගුණානුස්මරණය කිරීම් සඞ්ඛ්‍යාත ධර්මානුස්මෘතියද ප්‍රීතිසම්බෝධ්‍යඞ්ගෝත්පාදයට හේතුවූ. දෙවෙනි ධර්මය හෙවත් ඒ පිණිස පවත්නා දෙවෙනි කාරණයවේ.

"සංඝං ආරබ්භ උප්පන්නා අනුස්සති සංඝානුස්සති" සංඝයාඅරබයාඋපන් අනුස්මෘතිය සංඝානුස්මෘතියයි. "සුපටිපන්නො භගවතො සාවකසංඝො උජුපටිපන්නො භගවතො සාවකසංඝො ඤායපටිපන්නො භගවතො සාවකසංඝො සාමීචිපටිපන්නො භගවතො සාවකසංඝො,, යනාදී වශයෙන් සඞ්ඝරත්නය යුගලවශයෙන් සතරක්ද පුද්ගලවශයෙන් අටදෙනෙක්ද නැවත ප්‍රභෙදවීමෙන් එකසිය අටදෙනෙක්දැයි මෙසේ ප්‍රභෙදවූ අෂ්ටාර්‍ය පුද්ගල මහ සංඝරත්නය අරමුණුකොට නැවත නැවත උපදනාස්මෘතිය සංඝානුස්මෘතියයි කියනුලැබේ. එබැවින් ඒ සංඝානුස්මරණය කිරීමද භාවනානුයෝගී පුද්ගලයාගේ ප්‍රීතිසම්බෝධ්‍යඞ්ගෝත්පාදය පිණිස පවත්නා තුන්වැනි අඞ්ගයවේ. ඒ පුද්ගලතෙමේ ඒ අඞ්ගය වඩා හෙවත් ඒ සංඝරත්නය මේ අර්ථයෙන් සංඝනම්වන්නේයයි ගුණානුස්මරණය කොට පිළිවෙලින් අභිවෘද්ධියට පැමිණ උතුම් නිර්වාණයට පැමිණෙන්නේය.

"දීඝරත්තං අඛණ්ඩං කත්වා රක්ඛිතං චතුපාරි සුද්ධිසීලං පච්චවෙක්ඛන්තස්සාපි ගිහීනො දසසීලං පචසීලං පච්චවෙක්ඛන්තස්සාපි"

යනුහෙයින් දීඝී රාත්‍රියක් මුළුල්ලෙහි හෙවත් බොහෝ කාලයක පටන් නොකඩකොට රක්‍ෂාකරණලද ප්‍රාතිමොක්‍ෂ සංවරසීලය ඉන්ද්‍රිය සංවරසීලය ආජීවපාරිසුද්ධිසීලය ප්‍රත්‍යයසන්නිශ්‍රිත සීලය යනමේ සතරසංවරසීලය ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නාවූ යොගාවචර භික්‍ෂුන්වහන්සේටද එසේම බොහෝ කලක් අඛණ්ඩව

රක්ෂාකරණලද දසසීලය පචසීලය ප්‍රත්‍යවෙක්ෂා කරන්නාවූ ගෘහස්ථ යොගාවචර පුද්ගලයානටද ප්‍රීතිසම්බෝද්ධ්‍යඞ්ගය උපදී මෙසේ යම්කිසි භික්ෂුවක් හෝ ගෘහස්ථයෙක් හෝ අඛණ්ඩව පිරිසිදුව තම තමන් විසින් රක්ෂාකරණලද ඒ ඒ සීලගුණයන් නුවනින් මෙනෙහි කෙරේනම් එසේ කිරීම හේතුකොටගෙණ ප්‍රීතිසම්බෝද්ධ ඞ්ගය වඩා අභිවෘද්ධියට පැමිණේ යනු භාවයි.

මේ මතු දක්වන කථාවස්තුව ඊට නිදර්ශන කටයුතුයි. මෙම ලංකාද්වීපයෙහි කරඹුමහලෙණයයි ප්‍රසිද්ධ එක්තරා ලෙණක් විය ඒ ලෙණතුල විපස්සීය, සිඛීය, වෙස්සභූය, කකුසන්දය, කොනාගමනය, කාශ්‍යපය, ගෞතමය, යන සත්බුදුවරයන් වහන්සේලා මහභිනික්මන්කළ ආකාරයට අඳිනලද සිතියම් දුටුවන් සිත් පැහැර ගන්නාසේ විසිතුරුවෙයි එම කරඹු මහලෙණෙහි චිත්තගුප්තනම් එක්තරා මහාස්ථවිරයෙකෙනෙක් සිල් රක්ෂාකෙරෙමින් තපස්කරණසේක. එක්කලෙක බොහෝ භික්ෂූහු සෙනස්නෙත් සෙනස්නට නොයෙක් විසිතුරු බලමින් ඇවිදිනාහු මේ කරඹු මහලෙණට පැමිණ එහිතුබූ සිතියම් සාමීනනාදක වහන්ස මේ සිත්යම සිත්කළුයයි කීවාහුය එහි වාසයකළ මහතෙරුන්වහන්සේ මෙසේ කීයේය ඇවැත්නි මේ ගල්ලෙණ වසන්නාවූ මට සැට අවුරුද්දකට වැඩිකල් ඉක්මගියේය. එතකුදු උවත් මේතාක්කල් මෙබඳු විසිතුරු සිතියම් ඇතැයි යන බවකුදු නොදනුම්හ දූන් අද ඇස් ඇත්තාවූ නොපතිසා සිතියම් ඇතිබව දක්නා ලදුම්හයි කීයේය. මේ ගල්ලෙණෙහි මෙතෙක් දීර්ඝ කාලයක් වසන්නාවූ තෙරුන්වහන්සේ විසින් හැමතැනම වියදඬුපමණ දුරබලුන බැළුම් ඇතිබැවින් කිසිකලෙක ඇසදල්වා උඩනොබලනලද්දේය. ඒ තෙරුන්වහන්සේගේ ගල්ලෙන් දොරකඩ මහත්වූ නාරුකොක්ද ඇත. ඒ නාරුකද තෙරුන්වහන්සේ විසින් නොදක්නාලද්දේය. කිසිකලක උඩ නොබලන ලද්දේමය. හව්රුදුපතා මල්පිපෙන සමයෙහි බිම හෙන නාමල් රොන්සලා දූකම ඒ රුක මල්පිපී ගියහයි දූනගන්නාහ. එසමයෙහි මාගම්නුවර රජකරණ රජතෙමේ මහතෙරුන්වහන්සේගේ සීලාදී ගුණ සම්පත් අසා වඳිනු කැමතිව තුන්වරක් රාජදූතයන් යවා තෙරුන්වහන්සේ නොවඩිනාකල ඒ මාගම් නුවර කිරිබොන ලදරුවන් ඇති ගැහැනුන්ගේ පයෝධරයන් පටින් බඳවා රාජ මුද්‍රිකාවෙන් මුද්‍රණයකරවූයේය. කුමක් සඳහා දයත්? යම්තාක් මහතෙරුන්වහන්සේ නුවරට වඩිත්ද ඒ තාක්කල් දරුවෝ කිරි නොලබත්වායි කියාය මහතෙරුන් වහන්සේ එපවත්අසා ඒ තෙරුන්වහන්සේගේ නොයාමත් කිරි

නොලබන්නාවූ ළදරුවන්ට අනුකම්පාපිණිස මාගම්නුවරට වැඩී යාහ රජතෙමේ මහතෙරුන්වහන්සේ වැඩියහයි අසා රාජ පුරුෂයන් බණවා යව සගය මහතෙරුන්වහන්සේ රජගෙට වැඩම්වාගෙණ එව තෙරුන්වහන්සේගේ සමීපයෙහිදී සිල්ගනුම් හයි කියා යවා තෙරුන්වහන්සේ රජගෙට වඩාගෙන්වා පසග පිහිටුවා වැද දන්වලදවා ඉක්බිති ස්වාමීන්වහන්ස අද අපට අවකාශ නැත්තේය සෙට දවස සිල්ගනුම්හයි නැවතත් තෙ රුන්වහන්සේ දකිනු කැමතිව තෙරුන්වහන්සේගේ පාත්‍රය ගෙණ මදක්දුර පසු ගමන්කොට රාජදේවිය හා සමග සිට වැඳ නැවැත්තාහ මහතෙරුන්වහන්සේද රජු වඳිවයිහෝ රාජදේවිය වඳිවයි හෝ මහරජ සුවපත්වේවායි කියන්නේය. මෙසේ තෙ රුන්වහන්සේ දවස දවස රාජප්‍රතිඥා මුදවන පිණිස රජගෙට වඩනාහු රජුද ස්වාමිනි සෙට සෙට යයි කියමින් සත්දවසක් ඉක්මගියාහුය. තෙරුන්වහන්සේට පශචාත් ශ්‍රමණව වඩනාවූ සෙසු භික්ෂූහු ස්වාමීන්වහන්ස නුඹවහන්සේ රජගෙට වැඩිය වේලෙහි රජහු වඳිනාකල්හිද දේවිය වඳිනාකල්හිද වෙනසක් නැතුව මහරජ සුවපත්වේවායි යන මෙපමණක්ම කුමක්නිසා කියන්නේදැයි විචාළාහ. මහතෙරුන්වහන්සේ ඇවැත්නි මම රජුයයි කියා හෝ දේවියයි කියා හෝ නියම නොකරමි හෙ වත් විශෙෂ ලක්ෂණ දැක නොහඳුනම්හයි කීහ. මෙසේ සත් දවසක් ඉක්මුණුකල තෙරුන්වහන්සේට මේ ඇතුල්නුවරවිසීම දුක්වන්නේයයි සිතා රජුවිසින්ම පිටත්කොට හරිණලදුව තමන් වහන්සේ වැඩ විසූ කරඬු මහලෙණටම වැඩ එදවස රාත්‍රි භාග යෙහි භාවනාකිරීමපිණිස සක්මනට නැගාහ ඒ බව දුටු නා රුක අධිගෘහිතවූ දෙව්දුතොමෝ තෙරුන්වහන්සේගේ සීලය සුපරිසුඬබවදැක දඬුවැට පහනක්ගෙණ ආලෝකකරමින් සිටි යාහ. ඉක්බිත්තෙන් තෙරුන්වහන්සේට කම්සථානාරම්මණය සෙසු දවසට වඩා ඉතා පිරිසිදුව පහලවූයේය තෙරුන්වහන්සේ ප්‍රීතියට පැමිණ අද දවස මට කම්සථානාරම්මණය ඉතා පිරිසිදුව ප්‍රකාශවෙයි කුමක්වේදෙහොයි සතුටුව භාවනාවෙහි යෙදී මැදුම් යම් දසපැය කෙලවර සියළු පර්වතය පෘථුවි කම්පාවෙන් නාද කරවමින් ඒ පර්වතවාසී දෙවියන්ගේ සාධුකාර පූජාලබමින් සෝවාන් ආදී මාගීඵල පිළිවෙලින්නොස් උතුම්වූ අර්හත්ඵලයට පැමි ණිසේක. එබැවින් තමන්හට වැඩකැමති අනිත්කුලපුත්‍රකෙනෙ කුදු ඇත්නම් හෙතෙමේද වනයෙහි වසන නොයෙක් දිගබලන වඳුරෙකුමෙන්ද වනයෙහි සිංහාදී සිව්පාවුන්ට භයින්ත්‍රසවූ

මුවෙකුමෙන්ද මව්පියාදීන්ගෙන් වෙන්වීමෙන් භයටපත්වී ඔබ මොබ බලන ළදරුවෙකුමෙන්ද චචලවූ හෙවත් වටපිට බලන ඇස් ඇත්තෙක් නොවියයුත්තේය යථොක්ත විත්තගුත්ත මහා ස්ථවිරයන්මෙන් ආරක්‍ෂාකරගන්නාලද සිව්පිරිසිදු සීලගුණානුසමරණයකොට ප්‍රීතිසම්බෝධ්‍යඞ්ගය උපදවා ගැණීමෙන් සෝවාන් ආදී මාර්ගඵල පිළිවෙළින් ගොස් සව්කෙලෙස්නසා නිවන් ප්‍රත්‍යක්‍ෂ කටයුත්තේයි.

"දුබ්භික්ඛභයාදිසු පණීතභොජනං සබ්‍රහ්මචාරීනං එවංනාම අදම්හාති චාගං පච්චවෙක්ඛන්තස්සාපි ගිහීනොපි එවරූපෙකාලෙ සීලවන්තානං දින්නදානං පච්චවෙක්ඛන්තස්සාපි"

යනුහෙයින් දුර්භික්‍ෂභයාදිය පැමිණිකල්හි සබ්‍රම්සරුන්ට ප්‍රණීතභෝජන මේ මේ ආකාරයෙන් ත්‍යාගකොළෙමුයයි කියා ඒ ත්‍යාගය ප්‍රත්‍යවෙක්‍ෂාකරන්නාවූ භික්‍ෂුවටද යථොක්ත පරිදි දුර්භික්‍ෂාදිකාලවලදීම සිල්වතුන්ට මෙසේ දන්දෙනලද්දේයයි ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නාවූ ගෘහස්ථපුද්ගලයාහටද ප්‍රීතිසම්බෝධ්‍යඞ්ගය උපදී එසේ ත්‍යාගානුසමරණය කරන්නාවූ පුද්ගලතෙමේද ඒ හේතුවෙන්ම ශාන්තසුඛලක්‍ෂණ නිර්වාණයට පැමිණෙන්නේයි. ඒබව

"තස්සෙවං විගතමලමච්ඡෙරතාදි ගුණවසෙන අත්තනො චාගං අනුස්සරතො නෙව තස්මිං සමයෙ රාගපරියුට්ඨිතං චිත්තං හොති න දොස න මොහ පරියුට්ඨිතං චිත්තං හොති උජුගතමෙවස්ස තස්මිංසමයෙ චිත්තං හොති චාගං ආරබ්භාති පුරිමනයෙනෙව වික්ඛම්භිත නීවරණස්ස එකක්ඛණෙ ඣානඞ්ගානි උප්පජ්ජන්ති චාගගුණානං පන ගම්භීරතාය නානප්පකාර චාගගුණානුස්සරණාධිමුත්තතායවා අප්පනං අප්පත්වා උපචාරප්පත්තමෙව ඣානං හොති තදෙතං චාගගුණානුස්සරණවසෙන චාගානුස්සතිං චෙව සඞ්ඛං ගච්ඡති ඉමඤ්චපන චාගානුස්සති මනුයුත්තො භික්ඛු භීයෙය්‍යා සොමත්තාය චාගාධිමුත්තො හොති අලොභජ්ඣාසයො මෙත්තාය අනුලොම කාරී විසාරදො පීතිපාමුජ්ජබහුලොති"

යනාදී වශයෙන් දක්වනලදි මෙහි භවාය මෙසේ මේ උක්ත ප්‍රකාර විගතමල මාත්සර්‍ය්‍යාදි ගුණවශයෙන් තමාගේ ත්‍යාගය සිහිකරන්නාවූ ඒ යෝගාවචර පුද්ගලයාහට ඒ භාවනා සමයෙහි රාගයෙන්හෝ ද්වේෂයෙන්හෝ මෝහයෙන්හෝ මඩනාලද සිතක් නූපදනේය යළිදූ ඒ භාවනා සමයෙහි ඔහුගේ සිත ත්‍යාගය අරබයා පවත්නා බැවින් කාමච්ඡන්දාදියෙන් පහව සෘජු

වන්නේය ඉක්බිති පෙරකී නයින්ම ඔබාගන්නාලද නීවරණ ඇත්තාවූ ඒ යොගාවචරයාහට එකවිටම ධ්‍යානාඞ්ගයෝ උපදනාහුය ත්‍යාගගුණ ගැඹුරුබැවින්ද නොයෙක් ප්‍රකාර ත්‍යාගගුණ සිහිකිරීමෙහි නැමුණු සිත්ඇති බැවින්ද අර්පනාවට නොපැමිණ උපචාර ප්‍රාප්තවූ ධ්‍යානයම උපදනේය ඒ මේ උපචාර ධ්‍යානය ත්‍යාගගුණ සිහිකිරීම් වශයෙන් උපන්හෙයින් ත්‍යාගානුස්මෘතිය යන සඞ්ඛ්‍යාවට පැමිණෙන්නේයි මේ ත්‍යාගානුස්මෘති භාවනාවෙහි නිරන්තරයෙන් යුක්තවූ මහණතෙම අධිකවශයෙන් දනවස්තුපරිත්‍යාගයෙහි නැමුනාවූ සිතැතිවෙයි කිසිවක නොඇළුනාවූ අලෝභඅදහස්ඇතිවෙයි. මෛත්‍රිභාවනාවට සුදුසුප්‍රතිපත්තිඇත්තේවෙයි තමාගේගුණයෙන් කිසිතැනක අමඞ්කුභූතව හැසිරෙයි. ප්‍රීතිප්‍රමෝද්‍යය බහුලකොටඇත්තේ නැවතනැවතත් ත්‍යාගානුස්මරණය කොට ලෝකෝත්තර ප්‍රීතිසම්බෝධ්‍යඞ්ගය ලබා හෙවත් අභීත් ඵලයට පැමිණ නිර්වන්දක්තේවෙයි. **"දෙවතා ආරබ්භ උප්පන්නා අනුස්සති දෙවතානුස්සති"** දෙවියන්අරමුණුකොට උපන්අනුස්මෘතිය දෙවතානුස්මෘතියයි ප්‍රීතිසම්බොධ්‍යාඞ්ගය උපදවන්ට තපස්කාරණපුද්ගලතෙමේ දෙවියන්අරමුණුකොට හෙවත් දෙවියන්සාක්ෂිස්ථානයෙහි තබා තමාගේ ශ්‍රද්ධාදි ගුණානුස්මරණයකොට ඒ උපදවාගණීය යනුභාවයි. ඒකෙසේදයත හොත්?

"සන්තිදෙවාචාතුම්මහාරාජිකා සන්තිදෙවාතාවතිංසා යාමා තුසිතා නිම්මානරතිනො පරනිම්මිතවසවත්තිනො,,
යනාදීවශයෙහි මෙතිහාසය ගන්ධර්ව කුම්භාණ්ඩ නාග යක්ෂ යනාසතර සෙනඟට අධිපතිවූ ධෘතරාෂ්ට්‍රවිරූඪවිරූපාක්ෂවෛශ්‍රවණයයන සතරවරම් මහරජකෙනෙකුන් ඇතියෙයින් චාතුර්මහාරාජිකනම්වූ ක්‍රීඩාකරණ අර්ථයෙන් දිව්‍යනම්වූ දිව්‍යසමූහයෙක්ද මගමාණවකජාතකයෙහි ආනියායෙන් එක්ව පින්කම්කළ තෙතිස්යහළු කෙනෙකුන් එහි උපන්බැවින් තාවතිංසනම්වූ දිව්‍යසමූහයෙක්ද දුකින්පහවූ අර්ථයෙන් යාමනම්වූ දිව්‍යසමූහයෙක්ද ප්‍රීතියෙන් උපන්හෙයින් තුසිතනම්වූ දිව්‍යසමූහයෙක්ද භෝගසම්පත් නිර්මාණයකිරීමෙහි ඇළුම්ඇති බැවින් නිර්මාණරතීනම් දිව්‍යසමූහයෙක්ද අනුන් විසින් නිර්මිතකරණලද සම්පත් තමන්ගේ වසහයෙහි පවත්වනහෙයින් පරනිර්මිත වසවර්තී නම්වූ දිව්‍යසමූහයෙක්ද බ්‍රහ්මකායිකනම්වූ දිව්‍යසමූහයෙක්ද ඔවුන්ගෙන් මතුමත්තෙහි පරිත්තාභාදී දිව්‍යසමූහයෝද ඇත්තාහුවෙති ඔවුන් අතුරෙන් මාගීස්ථවූදිව්‍යසමූහයෝ මනුෂ්‍යව යම්බදුවූ ශ්‍රද්ධාවකින් යුක්තවූවාහු මෙලොවින්චුතව ඒ ඒ දිව්‍යලෝකයෙහි උපන්නාහුවීනම්

මටද එබඳු ශ්‍රද්ධාව ඇත්තේය මාගීසථවූ ඒදෙවියෝ වනාහි යම්බඳුවූ සීලයකින්ද යම්බඳුවූ ශ්‍රැතියකින්ද යම්බඳුවූ ත්‍යාගයකින්ද යම්බඳුවූ ප්‍රඥාවකින්ද යුක්තවූවාහු මෙලොවින් චුතව ඒ ඒ දෙව් ලොව උපන්නාහුනම් මටද එබඳුවූ සීලශ්‍රැතත්‍යාගප්‍රඥාවෝ ඇත් තාහුයයි මෙසේ දෙවියන්ගේ ශ්‍රද්ධාදිගුණයෝ සාක්ෂිස්ථානයෙහි තබා තමාගේද මාගීගතවූ ශ්‍රද්ධාදිධර්මඅනුස්මරණයකෙරේනම් ඒ දේවතානුස්මෘතියයි ඒ පුද්ගලයාගේ ප්‍රීතිසම්බෝධ්‍යඞ්ගෝත්පාදය පිණිස යථොක්ත දෙවතානුස්මෘතියම හේතුවන්නේයි. **"උපසමං ආරබ්භ උප්පන්නා අනුස්සති උපසමානුස්සති"** කෙලශව්‍යුපශමනය අරබයා උපන් අනුස්මෘතිය හෙවත් මේ මේ ක්‍රමයෙන් සන්තානයෙහි පැවැති කෙලෙස් විෂ්කම්භනවශයෙන් සංසිඳී ගියහයි ඒ අරමුණු කොට නැවතනැවත උපදනා සිහියට උපසමානුස්මෘතියයි කියනු ලැබේ.

"සමාපත්තියා වික්ඛම්භිතා කිලෙසා සට්ඨිම්පි සත්තතිම්පි වස්සානි න සමුදාචරන්තීති පච්චවෙක්ඛන්තස්සාපි,, යනුහෙයින් සමාපත්තියකින් විෂ්කම්භනය කරණලැබූ කාමච්ඡන්දාදී කෙලෙස් සැට සැත්තෑවර්ෂගණනක් තමාපිරිවරා නොහැසිරෙතැයිකියා යම්කිසි යෝගාවචර පුද්ගලයෙක් උපායවශයෙන් මෙනෙහිකෙරේනම් එය ප්‍රීතිසම්බෝධ්‍යඞ්ගෝත්පාදයට හේතුවන්නේයි එහෙයින් භාව නානුයෝගී තෙමේ යටත් පිරිසෙයින් තදඞ්ගවශයෙන්හෝ උඩත්පිරි සෙයින්විෂ්කම්භනවශයෙන් හෝ යම්කිසි ආකාරයකින් ඒ ඒ කෙල ශධර්මප්‍රහීනවූ අවස්ථාවලදී ඒප්‍රහාණය සම්බන්ධව පවත්නාගුණ නැවතනැවත සිතෙහි ඇතිකරගණීනම් ඔහට ප්‍රීතිය පහළවේ ඒ ප්‍රීතියම මාගීාවබෝධයටත් හේතුවීමෙන් පිළිවෙළින් අර්හත්වය ලබා නිවන් දක්නේවෙයි **"ලූඛපුග්ගලපරිවජ්ජනතා"** යනුමේ ප්‍රීති සම්බෝධ්‍යඞ්ගෝත්පාදයට හේතුවූ අටවෙනි අඞ්ගයවේ රූක්ෂ හෙවත් කාවුක නොතික්මුනුපුද්ගලයන් හාත්පසින් බැහැරකොට ඔහු ගෙන් වියෝව වාසයකිරීමයි ඒ සඳහා අර්ථකථාවෙහි.

"චෙතියදස්සන බොධිදස්සන ථෙරදස්සනෙසු අසක්කච්චකිරි යාය සංසූචිතලූඛභාවෙ බුද්ධාදීසු පසාදසිනෙහාභාවෙන ගද්‍රභපිට්ඨෙ රජසදිසෙ ලූඛපුග්ගලපරිවජ්ජනතස්සාපි,,යි.

දක්වනලදී මෙහි භාවය ධාතුපෙත්පිළිම කරඬුආදී යම්යම් පූජනීයවස්තුතබා තිදන්කරණලද චෛත්‍යයක්හෝ පාරිභෝගික බෝධියක්හෝ මහතෙරුන්වහන්සේ නමක්හෝ දශීනයකලකල්හි නොසකස්ක්‍රියාවෙන් හෙවත් ඒ පූජනීයවස්තු සමීපයෙන් ගමන් කරණකල්හි වහන්පයලායෑමෙන්හෝ කුඩඉසලායෑමෙන්හෝ කා

රාදුම්මෙන්හෝ යම්කිසිආකාරයකින් අගෞරවලෙස නොසකස් ක්‍රියා පැවැත්වීමෙන් රුස්කරගන්නාලද රළුස්වභාවය ඇත්තාවූද එහෙයින්ම බුද්ධාදිරත්නත්‍රය කෙරෙහිම ප්‍රසාදසෙනහස්වභාවයක් නැතිබැවින් කොටළුපිට රජස්සදෘසවූද රූක්ෂප්‍රතිපත්ති සහිත පුද්ගලයන් දුරුකොට වාසයකරණ පුද්ගලයාටද ප්‍රීතිසම්බෝධ්‍යඞ්ගය උපදී යනුයි "සිනිද්ධපුග්ගලසෙවනතා" යනු නවවෙනි අඞ්ගයයි සිනිඳුපුද්ගලසෙවනය නම් බුද්ධාදිරත්නත්‍රය කෙරෙහි ප්‍රසාදය බහුල කොට ඇති මෘදුමොලොක් සිත්ඇති තදපරුෂපැවතුම්රහිත තමහට අභිමත යහපත් අරමුණුකරාම සිතගමන්කරවියහැකි සිනිඳු පුද්ගලයන්සෙවීමයි එබඳු ශාන්තදාන්තලීලාඇති සිනිඳු පුද්ගලයන් ඡේවනයකිරීමත් ප්‍රීතිසම්බෝධ්‍යඞ්ගෝත්පාදයට හේතුධර්මයක් වශයෙන් පැවතීමෙන් හෙතෙමේ අභීත්‍රළාවබෝධයෙන් නිර්වාණයට පැමිණෙන්නේයි. "පසාදනියසුත්තන්තපච්චවෙක්ඛනතා"යනු දසවෙනිඅඞ්ගයවේ රත්නත්‍රයෙහි ගුණප්‍රකාශකවූ ප්‍රසාදවහවූ සූත්‍රාන්තයන් ධර්මව්‍යඤ්ජනාදිවසයෙන් ප්‍රත්‍යවෙක්ෂාකරන්නාහටද එසේම එකොළොස්වෙනි අඞ්ගයවූ තදධිමුක්තතායෙන් යුක්තවූ වහුටද එනම් ධ්‍යානනිසද්‍යාදීන්හී ප්‍රත්‍යෝත්පාදනය පිණිස නින්නප්‍රවණ ප්‍රභාරසිත්ඇත්තාහටද ප්‍රීතිසම්බෝධ්‍යඞ්ගය උපදී මෙසේ භාවනානුයෝගී පුද්ගලතෙමේ යථෝක්ත එකාදස ආකාර හේතුධර්මයන් නිසා ප්‍රීතිසම්බෝධ්‍යඞ්ගය උපදවා ගැණීමෙන් සකලකෙලශයන් ප්‍රහීණව ලබන නිර්වාණයට පැමිණෙන්නේයි.

"සත්තධම්මා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති පණීතභොජනසෙවනතා උතුසුඛසෙවනතා ඉරියාපථසුඛසෙවනතා මජ්ඣත්තපයොගතා සාරද්ධකායපුග්ගලපරිවජ්ජනතා පස්සද්ධකායපුග්ගලසෙවනතා තදධිමුත්තතා"ති,

යනු ප්‍රශ්‍රබ්ධිබොධ්‍යඞ්ගොත්පාදයට හේතුධර්මයොයි ප්‍රශ්‍රබ්ධිය හෙවත් කායචිත්තදෙදෙනාගේ බරඇරීම මාර්ගඥානාවබෝධය කරණ පුද්ගලයාට සුන්දරවූ අඞ්ගයක්යයනඅර්ථයෙන් ප්‍රශ්‍රබ්ධිබෝධ්‍යඞ්ගයයි කියනුලැබේ ඒ ප්‍රශ්‍රබ්ධිබෝධ්‍යඞ්ගයාගේ උත්පත්තියට ප්‍රණීතභෝජනසේවනාදිය හේතුවේ "පණීතංහි සිනිද්ධං සප්පාය භොජනං භුඤ්ජන්තස්සාපි„ යනුහෙයින් "පණීතභොජනසෙවනතා"නම් ප්‍රණීතවූ සිනිඳුවූ සැපවූ භෝජනය අනුභවකරණ පුද්ගලයාහටද කයසම්බන්ධ නිදුරළුස්වභාවය හෙවත් කයසැහැල්ළු බවයයි කියනලද බෝධ්‍යඞ්ගධර්මය ඉපදීමෙහිදී සාමාන්‍යයෙන් භාවනානුයොගීපුද්ගලයාගේ සත්ප්‍රාය අසත්ප්‍රාය භාවය හෙවත් සැප අයැප විභාගය දක්වනුලැබේ.

ආවාසො ගොචරො භස්සං පුග්ගලො භොජනං උතු,
ඉරියාපථොති සත්තෙතෙ අසප්පායෙ විවජ්ජයෙ.

සප්පායෙ සත්ත සෙවෙථ එවංහි පටිපජ්ජතො,
නචිරෙනෙව කාලෙන හොති කස්සචි අප්පනා.

යනුහෙයින් නොසැපසේනාසනය නොසැපගොදුරුගමය නොසැපකථාය නොසැපපුද්ගලයාය නොසැපභෝජනය නොසැපඍතුවය නොසැපඉරියව්පැවැත්මය යනමොහු සද්දෙනා දුරුකට යුත්තෝය ඉක්බිති සැපවූසෙනස්නාය සැපවූගොදුරුගම්ය සැපවූ කථාය සැපවූපුද්ගලයාය සැපවූභෝජනය සැපවූඍතුවය සැපවූ ඉරියව්වය යනමොහුසත්දෙනා සේවනය කටයුත්තේය.

"තත්‍රස්ස යස්මිං ආවාසෙ වසන්තස්ස අනුප්පන්නංවා නිමිත්තං නුප්පජ්ජති උප්පන්නංවා විනස්සති අනුපට්ඨිතාච සති න උපට්ඨාති අසමාහිතං ච චිත්තං න සමාධියති අයං අසප්පායො,,

යනාදින්දක්වනලද බැවින් ඒසත්දෙනා අතුරෙන් යම්සෙනස්නෙකවසන්නාවූ මේ යොගාවචරයාහට නූපන්නාවූ ප්‍රතිභාග නිමිත්ත නූපදනේද පෙරඋපන්නිමිත්ත නොනස්නේද නොඑලඹ සිටි සිහිය නොඑලඹෙන්නේද එකාග්‍රනුවූසිත එකඟනොවේද මෙබඳුලක්‍ෂණයෙන්යුත්සෙනස්න නොසැපසෙනස්නය නම් වන්නේය යම්සෙනස්නෙක වසන්නාහට නාගපර්වතවාසී යොගාවචර තිස්සස්ථවිරයන්ට මෙන් නූපන් ප්‍රතිභාගනිමිත්ත උපදීද පෙර උපන්නිමිත්ත නහවූරුවේද සිහියඑලඹසිටීද සිතඑකඟවේද මෙබඳු ආවාසය සැපවූ ආවාසයනම්වන්නේයි එහෙයින් යම්වෙහෙරක බොහෝසෙනසුන්ඇත්තාහු වීනම් එබඳුවෙහෙර එකෙකී සෙනසුන තුන්තුන්දවසවැස ඒ යෝගාවචරයාගේ සිත යම්සෙනස්නක එකඟවේනම් ඒසෙනස්නෙහි විසියයුත්තේය සැපවූ ආවාසපහසුව කරණකොටගෙණ මෙමසිංහලද්වීපයෙහි සුළු නා ලෙන් වැසි පන්සියයක් භික්‍ෂූහු එහිම කමටහන්ගෙණ රහත්ඵලයට පැමිණියෝය සෙසුතැන්හි සෝවාන්ආදී ආර්‍ය්‍යභූමියට පැමිණ මෙසේ සුලු නා ලෙණට අවුත් රහත්ඵලයට පැමිණි සෝවාන්ආදී ආර්‍ය්‍ය පුද්ගලයන් මෙතෙකැයි කියා සංඛ්‍යාවක් නැත්තේය සෙසු සිතුල් පව්වෙහෙර මිහිඳු පව් චෛත්‍යඝර ආදී විහාරයෙහිදු මෙසේ ආර්‍ය්‍යභූමියට පැමිණියවුන්ගේ සංඛ්‍යාවක් නැත්තේය යම්ගොදුරුගමෙක් සෙනස්නෙහි සිට පිඬුසිඟා යනකල්හිහෝ පෙරලාපෙරලාඑනකල හෝ හිරුරැස්මුහුනට නොවදනාසේ උතුරෙන්හෝ දකුණෙන්හෝ පිහිටියේවේද ගමනාගමනයට පහසුපරිද්දෙන් දුනුතුන්දහසකින්

8

ඇතුළත ඉතාදූරුතන්හිවේද සුලභවූ සම්පූර්ණභික්ෂාව ඇත්
තේවේද එබඳුගොදුරුගම සැපවූ ගොදුරුගමනම්වන්නේය එයින්
විපරීත වීනම් නොසැපවන්නේයි කථාවද රාජකථාදී දෙතිස්තිර
ශ්චීනකථාවන්ට ඇතුලත්ව හෙවත් ස්වර්ගමොක්ෂයන්ට බාධකවූ
කථාවක්වීනම් නොසැපවන්නේය එබඳුකථාව මේ යොගාවචරයා
ගේ උද්ග්‍රහ ප්‍රතිභාග නිමිත්තයන් අතුරුදන්වීමට කාරණාවන්
නේය ඒදෙතිස්කථාවන්ගෙන් වෙන්වූ අල්පෙච්ඡතාදී දසකථාවස්
තු නිශ්‍රිතකථාවම සැපවන්නේයි එතකුදුළුවත් ඒ සැපවූ කථාවද
පමණදන කටයුත්තේයි පුද්ගලයාද තිරශ්චීනකථාවන්ට ප්‍රතිපක්ෂ
වූ ධර්මප්‍රතිසංයුක්ත කථාකරණ සුළුවේද සීලාදිගුණයෙන් යුක්ත
වීද ඔහුනිසා එකඟනුවූ සිත එකඟවේද එකඟවූ සිත තහවුරු
හෝවේද මෙබඳු පුද්ගලතෙමේ ඇසුරුකිරීමට යොග්‍යවූ සැපවූ පුද්
ගලයානම්වන්නේය ඊටවිරුඬවූ ශරීර සන්තර්පණ පෝෂණයෙහිම
නියුක්තවූ තිරශ්චීන කථාකරණ සුළුවූ පුද්ගලතෙම නොසැපපුද්
ගලයානම්වන්නේයි කුමක්හෙයින්දයත්? එබඳුපුද්ගලතෙම පැහැදි
ජලය කිළුටුකරණ මඩදියක්මෙන් ඒ යෝගාවචරපුද්ගලයා කිළුටු
කරන්නේය එබඳුපුද්ගලයාකරා එළඹ කෙළිපව් වෙහෙර වැසි ලද
රුහිකුවගේමෙන් සමාපත්තියද නස්නේමය උපදවාගත් ප්‍රතිභාග
නිමිත්තනැසීම කියනුමකවරේද? හෝජනයවනාහි කිසිවෙකුට
මිහිරිවද කිසිවෙකුටඇඹුල්වද සැපවන්නේය සෘතුවදකිසිවෙකුට
සිහිල්වද කිසිවෙකුට උනුසුම්වද සැපවන්නේය එහෙයින් යම්බො
ජුනක්හෝ යම්හුණුසිහිල්සෘතුවක්හෝ සෙවුනාහට පහසුවේද
එකඟනුවූ සිත එකඟවේද එකඟවූ සිත තහවුරුහෝ වේද එබඳු
බොජුනද එබඳුසෘතුවද සැපවන්නේයි-අනික්බොජුන් හා අනික්
සෘතුවද නොසැපවන්නේයි. ඉරියව්පැවැත්මෙහිද කිසිවෙකුට
සක්මනය සයනය සිටීමය හිඳීමය යන ඉරියව්අතරෙන් යම්කිසි
ඉරියව්වක් සැපවන්නේය එහෙයින් සෙනාසනයට කී නියායෙන්
තුන්දිනක් පරීක්ෂාකොට යම්ඉරියව්වෙක පවත්නහුගේ එකඟනො
වූසිතඑකඟවේද එකඟවූසිත තහවුරුවේද එබඳු ඉරියව්වම සැප
වන්නේයි. අනික් ඉරියව්වක් නොසැපවන්නේයයි දතයුත්තේයි.
මෙසේ සත්වැදෑරුම් නොසැපයන්දුරුකොට සත්වැදෑරුම් සැප
යන් සෙවියයුත්තේයි. මෙකී සත්ප්‍රාය කරුණු අතරෙන් විශෙෂ
වශයෙන් සත්ප්‍රාය හෝජනය අනුභවකිරීමද ප්‍රශ්‍රබ්ධිබෝධ්‍යඞ්ගය
උපදවාගැණීමට හේතුවූ පළමුවෙනි අඞ්ගයවේ. යථොක්ත පරිදි
සෘතුසුඛසේවනය හා ඊර්යාපථසේවනයද මෙමප්‍රශ්‍රබ්ධිබෝධ්‍ය
ඞ්ගෝත්පාදයට හේතුවූ දෙවෙනි තුන්වෙනි අඞ්ගයෝවෙත්.

“මජ්ඣත්තපයොගොචුද්දෙච්චනි අත්තනොව පරස්සච කම්මස්සකත
පච්චවෙක්ඛනා ඉමිනා මජ්ඣත්තපයොගෙන උප්පජ්ජති.”

යනුහෙයින් “**මජ්ඣත්තපයොගතා**”නම්, තමන්ගේහා මෙරමා
ගේ කම්මස්සකතප්‍රත්‍යවෙක්ෂාවහෙවත්කර්මයතමාට අයිතිබව නුව
ණින්මෙනෙහිකිරීමයයි කියනුලැබේ. හේකෙසේදයත්?

“ත්වං එතස්ස කුද්ධො කිංකරිස්සසි කිමස්ස සීලාදීනි නාසෙතුං ස
ක්ඛිස්සසි නනු ත්වං අත්තනොකම්මෙන ආගතො අත්තනො කම්මෙ
නෙවගමිස්සසි, පරස්ස කුජ්ඣනංනාම වීතච්චිකඞ්ගාරතත්තඅයසලා
කගූථාදීනි ගහෙත්වා පරංපහරිතුකාමතාසදිසංහොති එසොපි තවකු
ද්ධො කිංකරිස්සති. කිංතෙ සීලාදීනි නාසෙතුං සක්ඛිස්සති එසඅත්ත
නො කම්මෙන ආගතො අත්තනො කම්මෙනෙව ගමිස්සති අප්පටි
ච්ඡිතපහෙණකංවිය පටිවාතංඛිත්තරජොමුට්ඨිවිය ච එතස්සෙවස
කොධො මත්ථකෙපතිස්සතීති එවංඅත්තනොච පරස්සච කම්මස්සක
තං පච්චවෙක්ඛතොපි,,

යනාදීන්දක්වනලදී. මෙහිභාවය, නුඹමෝහටකිපීකුමක්කරන්
නෙහිද, කිමෙක්ද ඔහුගේ සීලාදිගුණධර්මයන්නසන්ට හැකිවන්
නෙහිද නුඹතමන්විසින්මකරණලද කර්මහේතුකොටගෙණ මෙ
ලොව උත්පත්තියටඅවුත්තමන්විසින්කරණලද කර්මබලයෙන්ම පර
ලොවයන්නේනොවෙහිද මෙරමාහට කිපීම නම් ගිනිඅඟුරුතපන
යහුල් අසුචිආදීන්ගෙණ පරහට ප්‍රහාරදෙනුකැමැත්තක්වැනිවෙයි
මෙතෙමේද නුඹහටකිපීකුමක්කරන්නේද කිමෙක්ද නුඹෙසීලාදීන්
නසන්ට හැකිවන්නේද මෙතෙමේතමන්ගේ කර්මහේතුවෙන් අවුත්
තමන්ගේ කර්මහේතුවෙන්ම යන්නේය නොපිළිගත් පඬුවිඩයක්
මෙන්ද ප්‍රතිවාතයටදමාගසනලද රජස්මිටක්මෙන්ද මේක්‍රොධය
මොහුගේම මස්තකයෙහිවැටෙන්නේයයිකියා මෙපරිද්දෙන්තමන්
ගේදමෙරමාගේද කර්මය තම්තමන්ටඅයිතිබව ප්‍රත්‍යවෙක්ෂාකරන්
නාහටද උපදීයනුයි මෙසේතමන්ගේහා අනුන්ගේ ගුණාගුණදක්
හි සමප්‍රවෘත්තිඇතිව වාසයකාරණපුද්ගලයාහටද ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍ය
ඞ්ගයඋපදීහෙවත් පිළිවෙලින් අභිධ්‍යයට පැමිණතිවන් දක්නේ
වෙයි.—

“යොලෙඩ්ඩුදණ්ඩාදීහි පරං විහෙඨයමානොව විචරති එවරූපං
සාරද්ධකායං පුග්ගලං පරිවජ්ජන්තස්සාපි,,

යනුහෙයින් “**සාරද්ධකායපුග්ගලපරිවජ්ජනතා**”නම් යම්කිසි
පුද්ගලයෙක් කැටකැබිලිකිදඬුමුගුරුආදීන්ගෙණ මෙරමාහට පීඩා
කරමින්ම හැසිරේද එබඳුසංරබ්ධකයඇතිපුද්ගලයන් දුරුකොට
වාසයකරන්නාහටද ප්‍රශ්‍රබ්ධිබෝධ්‍යඞ්ගයඋපදී.

"සංයතපාදපාණිං පස්සද්ධකායපුග්ගලං සෙවන්තස්සාපි" යනු හෙයින් "පස්සද්ධකායපුග්ගලසෙවනතා" නම් සංයතහස්තපාදඇති හෙයින් ප්‍රශ්‍රබ්ධවූ හෙවත් සැහැල්ලුවූ කායසංවරඇත්තාවූ පුද්ගලයන් සේවනය භජනය පර්‍යුපාසනය කිරීමද ප්‍රශ්‍රබ්ධිසඞ්ඛ්‍යාත බොධ්‍යඞ්ගොත්පාදයට (නම්‍යප්‍රවණප්‍රාග්භාරවූ සිත් ඇතිබවයි.) මෙසේ යථොක්තප්‍රකාරවූ හේතුවේ ඒ හේතුවෙන් සියළුකෙලශයන් නසා අර්හත්වය ලැබීමෙන් නිර්වාණප්‍රාප්ත වේ. "තදධිමුත්තතා" නම් එම බොධ්‍යඞ්ගොත්පාදයට නම්‍ය ප්‍රවණ ප්‍රාග්භාරවූ සිත් ඇතිබවයි මෙසේ යථොක්ත ප්‍රකාර සප්තවිධ අඞ්ගයන් හේතුකොටගෙණ ප්‍රශ්‍රබ්ධිබොධ්‍යඞ්ගය උපදවාගෙණ යොගාවචරපුද්ගලතෙමේ නිවන් දක්නේ වෙයි.

"එකාදසධම්මා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති වත්ථුවිසදකිරියතා ඉන්ද්‍රියසමත්තපටිපාදනතා නිමිත්තකුසලතා සමයෙ චිත්තස්ස පග්ගණ්හනතා සමයෙ චිත්තස්ස නිග්ගණ්හනතා සමයෙ සම්පහංසනතා සමයෙ අජ්ඣුපෙක්ඛනතා අසමාහිතපුග්ගලපරිවජ්ජනතා සමාහිතපුග්ගලසෙවනතා ඣානවිමොක්ඛපච්චවෙක්ඛනතා තදධිමුත්තතාති" සමාධි නම්. චිත්තෛකාග්‍රතාවයයි කාමයන් ගෙන් වෙන්ව කාමච්ඡන්දාදිපඤ්ච නීවරණසඞ්ඛ්‍යාත අකුසල ධර්මයන් ගෙන් වෙන්වම, විතර්කවිචාරසහිතවූ විවේකයෙන් උපන් ප්‍රීතිය හා, සැපඇති ප්‍රථමධ්‍යානාදීන්ගේ වශයෙන් විදර්ශනාභාවනාවට යෝග්‍යපරිදි සමාධියාගේ සිත එකඟකරගැණීම සමාධියයි. මෙපරිදිවූ සමාධියද බොධ්‍යඞ්ගයක්වේ. හෙවත් සතරමාර්ගඥානාවබෝධයට ප්‍රධානහේතුවක්වේ ඒ සමාධිසම්බොධ්‍යඞ්ගයද යථොක්තපරිදි විවේකාදියනිශ්‍රිතවෙයි සමාධිසම්බෝධ්‍යඞ්ගය උපදවන යෝගාවචර පුද්ගලතෙම ඒකාදසආකාරයකින් ලබයි හෙවත් ඒ පිණිස පවත්නා වත්ථුවිසදකිරියතාආදී ඒකාදසධර්මයන් හේතුකොටගෙණ පිළිවෙලින්, අර්හත්වය ලබා නිවන් දක්නේවෙයි. මෙහි වත්ථුවිසදකිරියතා ඉන්ද්‍රියසමත්තපටිපාදනතා යනදෙක ධර්මවිචයහේතුවශයෙන් කියනලද පරිදිවේ. "නිමිත්තකුසලතා නාම, කසිණනිමිත්තස්ස උග්ගහකුසලතා" නිමිත්තග්‍රහණකෞශල්‍යභාවය නම්, සිත් එකඟකිරීමට හේතුවූ පෘථිවිකසිණාදිනිමිත්ත ග්‍රහණයෙහි දක්ෂබවයි. ඒබව.

"නිමිත්තකොසල්ලං නාම, පඨවිකසිණාදිකස්ස චිත්තෙකග්ගතානිමිත්තස්ස අකතස්ස කරණකොසල්ලං කතස්ස භාවනාකොසල්ලං භාවනාය ලද්ධස්ස රක්ඛණකොසල්ලඤ්ච තං ඉධ අධිප්පෙතං"

යනුවෙන් දක්වනලදී. මෙහි භාවය නිමිත්තකෞශල්‍යය නම්. නො උපදවනලද පෘථිවිකසිණාදිවූ සිත් එකඟබවට කාරණාවූ කසිණනිමිත්තයන් උපදවීමෙහි දක්ෂබවය උපදවනලද කසිණනිමිත්තයන්

වැඩීමෙහිදක්‍ෂබවය භාවනාවශයෙන් ලදනිමිත්ත ආරක්‍ෂාකිරීමෙහි දක්‍ෂබවය යනමේ ත්‍රිවිධාකාර දක්‍ෂබවයි මේඅපීනාකෞශල්‍යකථා වෙහිවනාහි ඒ රක්‍ෂණකෞශල්‍යයම නිමිත්තකෞශල්‍ය වශයෙන් කැමතිවියයුත්තේයි. මේ සමාධිසම්බොධ්‍යඞ්ගොත්පාදයට හේතුවූ තුන්වෙනි අඞ්ගයයි. "**සමයෙ චිත්තස්ස පග්ගණ්හනා**,, යනු සතර වෙනි අඞ්ගයවේ සුදුසුකල්හි සිත භාවනාවශයෙන් වැඩීමය යන අදහසයි ඒබව අට්ඨවාවෙහි යදාස්සඅතිසිථිලවිරියතාදීහි ලීනං චිත්තං හොති අපස්සද්ධිසම්බොජ්ඣඞ්ගාදයො තයො අභාවෙත්වා ධම්මවිචය සම්බොජ්ඣඞ්ගාදයො තයො භාවෙති.

## වුත්තං හෙතං භගවතා.

"සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො පරිත්තං අග්ගිං උජ්ජලෙතුකාමො අස්ස සො තත්‍ථ අල්ලානිචෙව තිණානි පක්ඛිපෙය්‍ය අල්ලානිච ගොමයානි පක්ඛිපෙය්‍ය අල්ලානිච කට්ඨානි පක්ඛිපෙය්‍ය උදකවාතඤ්ච දදෙය්‍ය පංසුකෙනච ඔකිරෙය්‍ය භබ්බොනුඛො සො භික්ඛවෙ පුරිසො තං පරිත්තං අග්ගිං උජ්ජලෙතුන්ති නොහෙතං භන්තෙ එවමෙවඛො භික්ඛවෙ යස්මිං සමයෙ ලීනං චිත්තං හොති අකාලො තස්මිං සමයෙ පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය අකාලොසමාධි—පෙ—අකාලො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය තංකිස්සහෙතු ලීනං භික්ඛවෙ චිත්තං තං එතෙහි ධම්මෙහි දුස්සමුට්ඨාපයං හොති යස්මිං ච ඛො භික්ඛවෙ සමයෙ ලීනං චිත්තං හොති කාලො තස්මිං සමයෙ ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය,,

යනාදීන් දක්වනලදී. මෙහිභාවය, යම්කලෙක මේ යෝගාවචරයාගේ භාවනාසිත ඉතා ලිහිල් වීර්‍ය්‍යාදියෙන් හැකිලෙන්නේවේද, එකල ප්‍රශ්‍රබ්ධි ආදී බොධ්‍යඞ්ගයන් තුන්දෙන නොවඩා ධර්‍මවිචය ආදී බොධ්‍යඞ්ගයෝ තුන්දෙන වැඩියයුත්තෝයි. භාග්‍යවත්නු විසිනුදු මේ වදාරණලදුයේමැයි. මහණෙනි යම් පුරුෂයෙක්තෙම යම්සේ සවල්පවූ ගින්නක් දල්වනු කැමැත්තේද ඒ පුරුෂතෙම ඒ මදගින්නෙහි අළුත් තණකොළ බහාලන්නේද අළුත් ගොම බහාලන්නේද අළුත් දර බහාලන්නේද දියමුසුවාතය දෙන්නේද පස් ඉසින්නේවේද මහණෙනි ඒ පුරුෂතෙම ඒ මදගින්න දල්වන්නට පොහොසත්වේදැයි විචාලේය. භික්‍ෂූහුද ස්වාමීන්වහන්ස පොහොසත් නොවන්නේයයි ප්‍රතිවචන දුන්නාහුය. මහණෙනි එපරිද්දෙන්ම යම්සමයෙක්හි සිත හැකුළුනේවේද,

එසමයෙහි ප්‍රශ්‍රබ්ධිබොධ්‍යඞ්ගයද සමාධිබොධ්‍යඞ්ගයද උපෙක්‍ෂාබොධ්‍යඞ්ගයද වැඩීමට සුදුසුකල්නොවන්නේය ඊට කාරණා

කවරේදයත්? මහණෙනි එසමයෙහි සිත හැකුළෙන්වේයි ඒ හැකුළුනාවූ සිත මේ ප්‍රශ්‍රබ්ධි සමාධි උපෙක්‍ෂායන බොධ්‍යඞ්ගයන් කාරණකොටගෙණ නගා සිටුවාලිය නොහැකිවන්නේය. ධර්‍මවිචය විරියපිතීයන බොධ්‍යාඞ්ගයන් කරණකොටගෙණම ඒ හැකුළුනාවූසිත නගාසිටුවාලිය නොහැක්කේමය. මෙසේ සුදුසු කාලයෙහි සිත ධර්‍මවිචයාදීන් හේතුකොටගෙණ වැඩීමෙන් සමාධි සම්බොධ්‍යඞ්ගය උපදී. "**සමයෙ චිත්තස්ස නිග්ගණ්හනතා**" යනු නම් සුදුසුකල්හි සිතට නිග්‍රහකිරීමයි. ඒ බව.

කථංයස්මිං සමයෙ චිත්තං නිග්ගහෙතබ්බං තස්මිං සමයෙ චිත්තස්ස නිග්ගණ්හාහොති,,

යනාදින් දක්වනලදී. යම් සමයෙක සිත නිග්‍රහකටයුතුවී නම් එසමයෙහි සිත කෙසේ නිග්‍රහකරන්නේදයත් යම්කලෙක මේ යොගාවචරයාගේ සිත අතිශයින් පටන්ගන්නාලද වීර්‍ය්‍ය ඇතිබැව් ආදියෙන් උඩගුවේද හෙවත් සමාධි ආදීයෙන් නොසන්හුන්වේද එකල්හි ධර්‍ම විචය සම්බොධ්‍යඞ්ගාදී තුන්දෙන නොවඩා ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යාඞ්ගාදී තුන්දෙන වඩන්නේයි භාග්‍ය වතුන්වහන්සේ විසිනුදු මෙසේ වදාරණලදී. මහණෙනි යම්සේ යම්පුරුෂයෙක් මහත්වූ ගිනිකඳක් නිවනුකැමතිවේද ඒ පුරුෂතෙම ඒ මහත් ගින්නෙහි වියලි දරහා තණපත් ගොම බහාලන්නේවේද පස් නොදමන්නේද මහණෙනි ඒ පුරුෂතෙම ඒමහත්වූ ගිනිකඳ නිවන්ට පොහොසත්වන්නේදැයි විචාලාහු භික්‍ෂූහු වහන්ස ඒ පුරුෂතෙම ඒ ගිනිකඳ නිවන්නට පොහොසත්නොවන්නේයයි ප්‍රතිවචනදුන්නාහුය. එපරිද්දෙන්ම මහණෙනි යම්කලෙක සිත උඩගුවීනම් එකල්හි ධර්‍මවිචය වීර්‍ය්‍ය ප්‍රීතිසම්බොධ්‍යාඞ්ගයන් වැඩීමට සුදුසුකල් නොවන්නේය ඊට කාරණා කවරේදයත්? මහණෙනි එකල සිත උඩගු වූයේය ඒ උඩගුවූ සිත මේ ධර්‍මවිචය වීර්‍ය්‍ය ප්‍රීති සම්බොධ්‍යාඞ්ගයන් කාරණකොටගෙණ සන්සිඳුවාලිය නොහැක්කේය මහණෙනි යම්කලෙක සිත උඩගුවීනම් ඒකාලයෙහි ප්‍රශ්‍රබ්ධි සමාධි උපෙක්‍ෂා යන සම්බොධ්‍යඞ්ගයන් වැඩීමට සුදුසුකල්වන්නේය. ඊට කාරණා කවරේදයත්? මහණෙනි ඒකාලයෙහි සිත උඩගුවූයේය ඒ උඩගුවූසිත මෙප්‍රශ්‍රබ්ධි සමාධි උපෙක්‍ෂා යන සම්බොධ්‍යඞ්ගයන් කාරණකොටගෙණ සන්සිඳුවාලිය හැකිවන්නේය මහණෙනි යම්සේ යම්පුරුෂයෙක් මහත්වූ ගිනිකඳක් නිවනු කැමතිවේද ඒ පුරුෂතෙම ඒ මහත්ගින්නෙහි අළුත් තණ පත් දර ගොම බහාලන්නේවේද පස්විසුරුවන්නේවේද මහණෙනි ඒ පුරුෂතෙම ඒ මහත් ගිනිකඳ නිවාලීමෙහි පොහො

සත්වන්නේදැයි විචාළාහ භික්ෂුහුද එසේය ස්වාමීන්වහන්සැයි ප්‍රතිවචන දුන්නාහුය. මෙකී පරිදි සුදුසු කාලයනම් සිත උඩඟු කාලයයි ඒ කාලයට ඊට ප්‍රතිපක්ෂ ධර්මවැඩීමෙන් සිතට නිග්‍රහ කටයුතුයි එසේ නිග්‍රහකිරීම සමාධි සම්බොධ්‍යඞ්ගෝත්පාදයට හේතුවේ. "**සමයෙසම්පහංසනතා**,, යනු සුදුසුකල්හි සිත සතුටු කිරීමයි හේ කෙසේදයත්? යදස්සපඤ්ඤාපයොගමන්දතායවා උපසම සුඛානධිගමෙනවා නිරස්සාදං චිත්තං හොති තදනං අට්ඨසංවෙග වත්ථු පච්චවෙක්ඛණෙනසං වෙජෙති අට්ඨසංවෙග වත්ථුනිනාම—

ජාතිජරාව්‍යාධිචුති අපායා අතීත අප්පත්තකවට්ටදුක්ඛං
ඉදානි ආහාර ගවෙට්ඨි දුක්ඛං සංවෙගවත්ථූනි ඉමානි අට්ඨ—

බුද්ධ ධම්ම සඞ්ඝ ගුණානුස්සරණෙනචස්ස පසාදං ජනෙති එවං යස්මිං සමයෙ චිත්තං සම්පහංසිතබ්බං තස්මිං සමයෙ චිත්තං සම්පහංසෙති භාවය යම්කලෙක ඒ යෝගාවචරයාගේ ප්‍රඥා ප්‍රයෝගමද බැවින් හෝ සිත් එකඟකිරීමෙන් ලැබියයුතු සැපය නොලද බැවින් හෝ චිත්තය ආශ්වාද රහිතවේද එකල අටමහා සංවේග වස්තු ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙන් සිත සංවේගයට පමුණුවන්නේය සංවේගවස්තු අටනම් ජාතිදුකය ජරාදුකය ව්‍යාධිදුකය මරණ දුකය යන සතරහා පච්ඡිඩ බන්ධනාදි පස්වන අපායදුකද අතීත භවයෙහි සංසාරදුකය අනාගතයෙහි සංසාරදුකය වර්තමාන කාලයෙහි ආහාරසෙවීම මුල්කොට ඇති දුකයයන මේ අටවැදෑරුම් දුකවන්නේයි බුද්ධ ධර්ම සංඝ යන රත්නත්‍රයෙහි ගුණ මෙනෙහි කිරීමෙන් ඒ සිත පහද වන්නේය මෙසේ යම් සමයක සිත සතුටුකල යුතු වීනම් එසමයෙහි සතුටුකරන්නේයි උක්ත ප්‍රකාර සුදුසුකල්හි සිත සතුටුකිරීමත් සමාධිසම්බොධ්‍යඞ්ගය උපදවා ඒ මගින් රහත්ව නිවන් දක්නේය "**සමයෙ අජ්ඣුපෙක්ඛණතා**,,යනු සුදුසු කාලයෙහි මධ්‍යස්ථව බැලීමයි යම් සමයෙක සිත මැදහත්ව බැලියයුතුවීනම් එසමයෙහි සිත කෙසේ මැදහත්ව බැලියයුතුදයත්? යම්කලෙක සමාධිසම්බොධ්‍යඞ්ගය වැඩීමපිණිස පිළිපදින ඒ යෝගාවචරයාගේ සිත කුසීතභාවයෙහි පැතිරීමෙන් නොහැකුළුනේ හෝ වේද ඖද්ධත්‍යයෙහි හිමෙන් උඩඟුනුවූයේ හෝ වේද ප්‍රඥා ප්‍රයෝග සම්පත් ආදියෙන් නිරාශ්වාදනුවූයේවේද අරමුණෙහි සමව පවත්නේද සමාධි වීථියට පැමිණියේවේද එකල්හි ඒ සිත වැඩීමය නිග්‍රහකිරීමය සතුටුකරවීමය යන මෙහි උත්සාහයට නොපැමිණි මධ්‍යස්ථවන්නේය කුමක්මෙන්දයත්? රථයෙහි යොදනලද අසුන් සමව පවත්නාකල්හි නොතලා නොමෙහෙයා මැදහත්ව බලන්නාවූ රථාචාර්‍ය්‍යමෙනි මෙසේ යම්

සමයක සිත මැදහත්ව බැලියයුතුවීනම් එසමයෙහි මැදහත්ව
බැලීමත් සමාධිසම්බොධ්‍යඞ්ගය ඉපදීමට හේතුවන්නේයි "**අසමා
හිත පුග්ගල පරිවජ්ජනා**" යනු සමාහිතනුවූ හෙවත් එකඟනුවූ
සිත් ඇති පුද්ගලයන් දුරුකිරීමයි එසේ නොසන්හුන් පුද්
ගලයන් දුරුකිරීමනම් ධ්‍යාන ප්‍රතිපත්තියට නොපිළිපන්නාවූ
නොයෙක් කටයුත්තෙහි නියුක්තවූ විසිලිහරසිතැති පුද්ගලයන්
දුරින්ම දුරුකිරීමයි මෙසේ අසමාහිත සිතැති පුද්ගලයන් දුරින්ම
දුරුකිරීමත් සමාධිසම්බොධ්‍යඞ්ගොත්පාදයට හේතුවේ "**සමාහිත
පුග්ගල සෙවනතා**" යනු එකඟවූ සිතැති පුද්ගලයන් සෙවීමයි
එකඟවූ සිතැති පුද්ගලයන් සේවනය කිරීමනම් ධ්‍යානප්‍රතිපත්ති
යට පිළිපන්නාවූ සමාධිලාභිපුද්ගලයන්කරා කලින්කල එළඹීමයි.
ඔවුන්කරා එළඹ ඒ මගින් මේ යෝගාවචර පුද්ගලතෙමේද සමාධි
සම්බොධ්‍යඞ්ගය හෙවත් සතරමාගී ඥානාවබොධයට හේතුවූ යහ
පත් අඞ්ගයක්වූ චිත්තෛකාග්‍රතාවය වැඩීමෙන් නිර්වාණප්‍රාප්තවන්
නේය තදධිමුත්තතා ඊට නිම්න ප්‍රමාණවූ සිත් ඇති බවයි තද
ධිමුත්තතානාම සමාධි අධිමුත්තතා සමාධිගරු සමාධිනින්න සමාධි
පොණ සමාධිපබ්භාරතාති අත්ථො යනුහෙයින් තදධිමුත්තතා
නම් සමාධි උපදවනුකැමතිබවයි හෙවත් සමාධියම ගරුකොට
ගැන්ම හෝ සමාධියෙහිම නැමී පවත්නාබව හෝ සමාධියම පිරි
සිදු ස්ථානකොට ඇතිබව හෝ සමාධියට අභිමුඛව පවත්නාබව
හෝ යන අර්ථයි මෙසේ මේ යෝගාවචර පුද්ගලතෙමේ ඒකාදස
ආකාර හේතූන් කරණකොටගෙණ සමාධිය උපදවා ඒම පුනඃ
පුනාභිවර්ධනයකොට සතරමාගී ඥානාවබෝධයෙන් සියළු කෙලෙ
සුන් නසා සාන්ත සුඛලක්ෂණ නිර්වාණයට පැමිණ වාසයකරන්
නේයි.

'පංචධම්මා උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය සංවත්තන්ති
සත්තමජ්ඣත්තතා සංඛාරමජ්ඣත්තතා සත්තසංඛාරකෙලා යන
පුග්ගල පරිවජ්ජනතා සත්තසංඛාරමජ්ඣත්තපුග්ගල සෙවනතා
තදධිමුත්තතා"ති උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය ඉපදීම පිණිස සත්ව
මධ්‍යස්ථතාවය ආදි අඞ්ග පසක්වෙත් ඒ අඞ්ග පසක් හේතුකොට
ගෙණ උපදවාගත්තාවූ උපෙක්ෂාව සුන්දරවූ බොධ්‍යඞ්ගයක්වේ.
හෙවත් සතරමාගී ඥානාවබොධයට යහපත් අඞ්ගයක්වේ. උපෙ
ක්ෂාවනම් මධ්‍යස්ථභාවයයි හෙද දසාකාරවේ ඔහු කවරහුද? ඡළ
ඞ්ගු පෙක්ඛා බ්‍රහ්මවිහාරු පෙක්ඛා බොජ්ඣඞ්ගු පෙක්ඛා විරියු පෙ
ක්ඛා සඞ්ඛාරු පෙක්ඛා වෙදනු පෙක්ඛා විපස්සනු පෙක්ඛා තත්‍ර
මජ්ඣත්තු පෙක්ඛා ඣානු පෙක්ඛා පරිසුද්ධු පෙක්ඛාති යනු හෙයින්

ෂඩඞ්ගා පෙක්ෂාය බ්‍රහ්මවිහාරො පෙක්ෂාය බොධ්‍යඞ්ගා පෙක්ෂාය වීය‍්‍යෙෂා පෙක්ෂාය සංස්කාරො පෙක්ෂාය වෙදනො පෙක්ෂාය විදර්ශනොපෙක්ෂාය තත්‍ර මධ්‍යස්ථ පෙක්ෂාය ධ්‍යානො පෙක්ෂාය පාරිසුද්ධි උපෙක්ෂායයි දසවැදෑරුම් වන්නීය. ඒ දස විධ උපෙක්ෂාවන් අතුරෙන් මේ ශාසනයෙහි ක්ෂීණාශ්‍රව රහතුන්වහන්සේ ඇසින් රූපාරමුණක් දුක ඇළුම් වශයෙන් සොම්නස් හෝ නොකෙරෙද වෙෂවසයෙන් දොම්නස් හෝ නොකෙරෙද මධ්‍යස්ථව සිහිනුවනින් යෙදී වෙසේදැයි මෙසේ දක්වනලද්දාවූ ක්ෂීණා ශ්‍රව රහත්හුගේ චක්ෂුරාදී සදොරට රූපාදී ඉෂ්ටානිෂ්ට අරමුණු හමුවූකල්හි නිකෙලෙශී පිරිසිදු සවභාව අත්නොහරිණ ආකාරයෙන් පවත්නාවූ යම් උපෙක්ෂාවක්වේද ඒෂඩඞ්ගාපෙක්ෂානම්වන්නීය. උපෙක්ෂා සහගත චිත්තයෙන් එක් දිසාභාගයක් පතුරුවා වාසය කරන්නේයයි මෙසේ දක්වනලද සකල සත්වයන් කෙරෙහි මැදහත් ආකාරයෙන් පවත්නා යම් උපෙක්ෂාවක්වේද ඒ බ්‍රහම විහාරො පෙක්ෂා නම් වන්නීය. කෙලෙසුන් කෙරෙන් සිත වෙන්කිරීමයයි කියනලද විවෙකය නිසා පවත්නා උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය වඩන්නේයයි මෙසේ දක්වනලද සහජාත ධර්මයන් කෙරෙහි මැදහත් ආකාරයෙන් පවත්නා යම් උපෙක්ෂාවක් හෙවත් මාර්ග චිත්තයෙහි සම්ප්‍රයුක්තවූ ශ්‍රද්ධා ප්‍රඥාදී සෙසු ධර්මයන්ගේ අලීන අනුද්ධත අනිරාශවාද භාවය හේතුකොටගෙණැ ප්‍රග්‍රහන සම්ප්‍රහර්ෂනයෙහි උත්සාහයක් නැතුව පවත්නාවූ යම් මැදහත් ආකාරයක්වේද ඒ බොධ්‍යඞ්ගාපෙක්ෂා නම් වන්නේය. උපෙක්ෂාසංඛ්‍යාත මධ්‍යස්ථාකාරයෙන් පවත්නා වීය‍්‍ය නිමිත්තය කලින්කල මෙනෙහි කරන්නේයයි මෙසේ දක්වනලද අතිශයින් උත්සාහවත් නොකරණ ලද්දාවූද ඉතා ලිහිල් නොකරණ ලද්දාවූද වීය‍්‍යසංඛ්‍යාතවූ යම් උපෙක්ෂාවක් ඇත්තේවේද මේ වීය‍්‍යොපෙක්ෂා නම් වන්නීය.

.“යා කති සඞ්ඛාරුපෙක්ඛා? සමාධිවසෙන උප්පජ්ජන්ති, කති සංඛාරුපෙක්ඛා? විපස්සනා වසෙන උප්පජ්ජන්ති, අට්ඨ සංඛාරුපෙක්ඛා සමාධිවසෙන උප්පජ්ජන්ති දස සංඛාරුපෙක්ඛා විපස්සනා වසෙන උප්පජ්ජන්ති එවමාගතා නීවරණාදි පටිසඞ්ඛා සන්තිට්ඨනාගහනෙ මජ්ඣත්තභූතා උපෙක්ඛා අයං සංඛාරුපෙක්ඛානාම,,

යනු හෙයින් සමාධිවශයෙන් කෙතෙක් සංස්කාරො පෙක්ෂාවෝ උපදනාහුද විදර්ශනාවශයෙන් කෙතෙක් සංස්කාරො පෙක්ෂාවෝ උපදනාහුදයි යන ප්‍රශ්නයෙහි ප්‍රථමධ්‍යානාදී අෂ්ටසමාපත්තීන් විසින් ඔබාගන්නාලද නීවරණ විතර්ක විචාරාදී ධර්මයන්

ඒ ඒ ධර්මයන්ගේ ස්වභාව වශයෙන් පරීක්ෂාකොට මේ ධර්ම මේ
බඳු ස්වභාව ඇත්තාහයි සනිටුහන් කිරීම් වශයෙන් පවත්නා
අට්වැදෑරුම් ප්‍රඥව අෂ්ටවිධ සංස්කාරෝපෙක්ෂා නම සෝවාන්
සකෘදාගාමි අනාගාමි අර්හත් යන සතරමග සතරඵලය හා ශූන්‍ය
තා විහාරසමාපත්ති අනිමිත්තවිහාරසමාපත්තිය යන මේ දසවිධ
අධිගමසමාපත්තීන් ලැබීමපිණිස උපදවන්නාවූ දශවිධ විදර්ශනා
වනි පූර්වකර්ම ප්‍රත්‍යයෙන් මේ භවයෙහි පඤ්චස්කන්ධයන්ගේ උත්
පත්තියද උපන් පඤ්චස්කන්ධයන්ගේ පැවැත්මද කාරණාවශ
යෙන් වැටහෙණ සියළු ත්‍රෛභූමික සංස්කාරධර්මයද මතුභවයෙහි
උත්පත්තිය පිණිස රැස්කරන්නාවූ කර්මයද මතු භවයෙහි උත්
පත්තියද ප්‍රතිසන්ධි වශයෙන් උපදනා ගතියද ස්කන්ධයන්ගේ පහළවී
මද පහළවූ සත්වයාගේ විපාකප්‍රවෘත්තියද ජාතියද ජරාවද ව්‍යාධි
යද මරණයද සෝකයද පරිදේවයද උපායාසයද යන මෙතෙක්
ධර්මයන් ඒ ඒ ධර්මයන්ගේ ස්වභාව වශයෙන් පරීක්ෂාකොට දැන
මේ ධර්ම මෙබඳු ස්වභාව ඇත්තාහයි සනිටුහන් කිරීම් වශයෙන්
පවත්නා දසවැදෑරුම් ප්‍රඥව දසවිධ සංස්කාරෝපෙක්ෂා ඥාන නම්
වෙයි මෙසේ දක්වන ලද්දාවූ ප්‍රථමධ්‍යානාදියෙන් ඔබාගන්නා
ලද නීවරණාදී ධර්මයන් ස්වභාව වශයෙන් පරීක්ෂාකොට දැන
සනිටුහන් කිරීම් වශයෙන් පවත්නාවූද දක්නාලද ආදී නව ඇති
හෙයින් ඒ නීවරණාදීන් ඉපදීමෙහි මැදහත් ආකාරයෙන් බලන්
නාවූද යම් විදර්ශනා ප්‍රඥවක් ඇත්තේවේද මේ සංස්කාරෝපෙක්ෂා
නම් වන්නීය. යම් කලෙක උපෙක්ෂා සහගතවූ කාමාවචර කුසල
චිත්තය උපදින්නේවේදැයි මෙසේ ආවාවූ අදුක්ඛමසුඛ වෙදනා
නම්වූ යම් උපෙක්ෂාවක්වේද මේ වේදනොපෙක්ෂා නම් වන්නීය යම්
ස්කන්ධ පඤ්චකයෙක් ප්‍රත්‍යයෙන් හටගත් බැවින් භූතනම්වේද
යම් ස්කන්ධ පඤ්චකයෙක්හි අනිත්‍ය දුඃඛ අනාත්ම යන ලක්ෂ
ණත්‍රය ලැබේද ඒ ස්කන්ධ පඤ්චකයෙහි අනිච්චානුපස්සනාදී
භාවනා ක්‍රමයෙන් නිත්‍ය සංඥාදිය දුරුකරන්නාහු මනාකොට
දක්නාලද ආදී නාව ඇති හෙයින් ඒ පිළිබඳ ඇල්ම මතු ප්‍රති
සන්ධිය නොගන්නා පරිද්දෙන් ප්‍රති පත්තිය කරණකොටගෙණ
දුරුකරන්නේවේද මෙසේවූ යෝගාවචර මහණ එහි උපෙක්ෂාව
ලබන්නේයයි මෙසේ දක්වනලද අනිත්‍යාදී වශයෙන් සම්මර්ශ
ණය කිරීමෙහි මැදහත් ආකාරයෙන් පවත්නා යම් උපෙක්ෂා
වක්වේද මේ විදර්ශනොපෙක්ෂා නම් වන්නීය. ඡන්දචෛතසිකාදී
යෙවා පනත ධර්මයන් අතුරෙහි දක්වනලද්දාවූ තමාහා සම්ප්‍ර
යුක්ත ධර්මයන් සම්කොට අරමුණෙහි පිහිටුවන්නාවූ යම් උපෙක්ෂා

වක්වේද මේ තත්‍ර මජ්ඣත්තෝපෙක්ෂා නම් වන්නීය උපෙක්ෂකව වාසය කරන්නේය යනාදීන් ප්‍රකාශකරණ ලද්දාවූ අග්‍රවූ ධ්‍යාන සැපයෙහි යෙදුනාවූද ඒ සැපය අපක්ෂපාතව උපදවන්නාවූද යම් උපෙක්ෂාවක්වේද මේ ධ්‍යානොපෙක්ෂා නම් වන්නීය. උපෙක්ෂා සම්ප්‍රයුක්ත ස්මෘතියෙන් පිරිසිදුවූ චතුර්ථධ්‍යානයයි මෙසේ දක්වන ලද්දාවූ විතර්ක විචාරාදී සියළු ප්‍රතිවිරුද්ධ ධර්මයන්ගෙන් මිදුනුහෙයින් ප්‍රතිවිරුද්ධ ධර්මයන් සංසිඳුවීමෙහි නැවත උත්සාහ කටයුත්තක් නැත්තාවූ යම් උපෙක්ෂාවක්වේද මේ පාරිසුද්ධූපෙක්ෂානම් වන්නීයයි කියා මෙසේ උපෙක්ෂාව දස ආකාරවේ මේ දසවිධ උපෙක්ෂාවන් අතුරෙන් මෙහිදී අපවිසින් ගතයුතු උපෙක්ෂාව නම් බොජ්ඣඞ්ගුපෙක්ෂාවයි උපෙක්ෂාව බෝධිසංඛ්‍යාත සතරමාර්ග ඥානය අවබෝධ කරණ පුද්ගලයාට යහපත්වූ සුන්දර අඞ්ගයක්නුයි උපෙක්ෂා සම්බොජ්ඣඞ්ග නම්වේ විවේක නිශ්‍රිතාදිය යට කී පරිදිමැයි. මේ උපෙක්ෂා සම්බොජ්ඣඞ්ගොත්පාදයට හේතු වශයෙන් පවත්නා අංගපස අතුරෙන් පළමුවැනි අඞ්ගය නම් "සත්තමජ්ඣත්තතා" යනුයි. ප්‍රිය සත්වයන් කෙරෙහි මධ්‍යස්ථවීමයි.

"තත්ථ වීහාකාරෙහි සත්තමජ්ඣත්තතං සමුට්ඨාපෙති ත්වං අත්තනො කම්මෙන ආගන්ත්වා අත්තනොව කම්මෙන ගමිස්සසි එසොපි අත්තනො කම්මෙන ආගන්ත්වා අත්තනොව කම්මෙන ගමිස්සති ත්වං කංකෙලායසීති එවං කම්මස්සකතපච්චවෙක්ඛණෙන ච පරමත්ථතො සත්තාභාවතොපි සො ත්වං කං කෙලායසීති එවං නිස්සත්ත පච්චවෙක්ඛණෙනච"

යනු අටුවාහෙයින් ඒ පස්වූ ධර්මයන් අතුරෙන් සත්වමධ්‍යස්ථතාවය හෙවත් ප්‍රිය සත්වයන් කෙරෙහි මැදහත්වීම දෙයාකාරයකින් උපදවයි. ඒ කෙසේදයත්?

නුඹ තමන්ගේ කර්මයෙන්ම හෙවත් තමන් විසින් කරණලද කුසලා කුසල කර්ම හව්යාගේ හේතුවෙන්ම මිනිසත් බැව් සංඛ්‍යාත අප අතරට සම්ප්‍රාප්තව එහිදීත් තමන් විසින්ම කරණලද කුසලා කුසල කර්ම හේතුවෙන්ම උත්පත්ති වශයෙන් පර ලොව යන්නෙහිය මෙතෙමේත් තමන් විසින්ම කරණලද කර්ම හේතුවෙන් අවුත් තමන් විසින්ම කරණලද කර්ම හේතුවෙන් යන්නේය එබඳුවූ නුඹ දූත් මෙහිදී කවරෙක් ක්‍රීඩාකරවන්නෙහි දැයි කියා මෙසේ කම්මස්සකතාපච්චවෙක්ඛණ වශයෙන්ද හෙවත් කර්මය තමන්ට අයිතිබැව් නුවණින් සැලකීමෙන්ද පරමාර්ථ වශයෙන් සත්වයෙක් නැත එබඳුවූ ඔබ කවරෙකු සංචලනයකරන්

නෙහිද්දැයි මෙසේ නිස්සත්ත්වභාවය ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙන්ද යන දෙයාකාරයකින්ම සත්ත්වයන් කෙරෙහි මධ්‍යස්ථභාවය උපදවයි. මෙසේම දෙපරිද්දකින් සංස්කාර මධ්‍යස්ථතාවයද උපදවයි මෙහි සංස්කාර නම් අනින්ද්‍රිය ප්‍රතිබද්ධ චීවර පිණ්ඩපාත සේනාසන ගිලාන ප්‍රත්‍යය සංඛ්‍යාත චතුර්විධ ප්‍රත්‍යයද තදනුවර්තක අවශේෂ සංස්කාරද සංස්කාරනම් ඔවුන් කෙරෙහි පවත්නා දෙපරිදි මධ්‍යස්ථතාවය මෙසෙයි මේ චීවරය අනුපූර්ව භාවයෙන් වර්ණ විකාරත්වයට හා ජීර්ණත්වයට පැමිණ හෙවත් කිළුටුවීමට හා කඩ රෙදි වීමටද පැමිණ කෙළවර පාපිස්නාකඩක්වී සැරයටි කෙලවරින් ගෙණ බැහැර කටයුත්තක් වන්නේය ඉදින් වනාහි චීවර සංඛ්‍යාත මේ වස්ත්‍රයට ස්වාමියෙක් විද්‍යමාන වන්නේනම් මෙය මෙසේ විනාසවන්ට අවසර නොදෙන්නේයයි අස්වාමික භාවය ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙන්ද මේ චීවරය කල් පවතින්නක් නොවන්නේය එහෙයින් තාවකාලිකයයි තාවකාලිකත්වය ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙන්ද යන දෙපරිද්දෙනි.

“ද්වීහාකාරෙහි සඞ්ඛාරමජ්ඣත්තතං සමුට්ඨාපෙති ඉදං චීවරං අනුපුබ්බෙන වණ්ණවිකාරඤ්චෙව ජිණ්ණභාවඤ්ච උපගන්ත්වා පාදපුඤ්ඡන චොලකං හුත්වා යට්ඨිකොටියා ඡඩ්ඩනීයං භවිස්සති සචෙ පනස්ස සාමිකො භවිස්ස නාස්ස එවං විනාසිතුං දදෙය්‍යාති එවං අස්සාමිකභාව පච්චවෙක්ඛණෙනච” යනු මෙහි පාලියයි

**“සත්තසඞ්ඛාරකෙලායන පුග්ගල පරිවජ්ජනතා”** යනු නම් සත්ත්ව සංස්කාර දෙකෙහි ආසයම සඤ්චලනය කරන්නාවූ හෙවත් ඉන්ද්‍රිය ප්‍රතිබද්ධ සත්ත්වයන්හා අනින්ද්‍රිය ප්‍රතිබද්ධ චීවර පිණ්ඩපාත සේනාසන ගිලන ප්‍රත්‍යයාදිය මමත්වය කරණ පුද්ගලයන් දුරුකිරීමයි.

“එත්ථයො පුග්ගලො ගිහිවා අත්තනො පුත්තධීතාදිකෙ පබ්බජිතොවා අත්තනො අන්තෙවාසික සමානුපජ්ඣායාදිකෙ මමායති සහත්ථෙනෙවනෙසං කෙසච්ඡෙදන සූචිකම්ම චීවරධොවන රජනපත්තපචනාදීනි කරොති මුහුත්තම්පි අපස්සන්තො අසුකො සාමණෙරො කුහිං අසුකො දහරො කුහින්ති භන්තමිගොවිය ඉතො චිතො ච ඔලොකෙති අඤ්ඤෙන කෙසච්ඡෙදනාදීනං අත්ථාය මුහුත්තං තාව අසුකං පෙසෙථාති යාචමානොපි අම්හෙපි තං අත්තනො කම්මං නකරොමතුම්හෙ තං ගහෙත්වා කිලමිස්සථාති නදෙති අයං සත්තකෙලායනො නාම යො පන චීවර පත්ත ථාලකකත්තර යට්ඨි ආදීනි මමායති අඤ්ඤස්සහත්ථෙන පරාමසි

තුම්පි න දෙති තාවකාලිකං යාචිතො මයම්පි ඉමංධනං සන්තං න පරිභුඤ්ජාම කිං තුම්හාකං දස්සාමාති වදති අයං සංඛාර කෙලායනො නාම" යනු හෙයින් මේ සත්ත්ව සංස්කාර කෙලායන පුද්ගල පරිවර්ජන සංඛ්‍යාත කාරණයෙහි,

"පූතිසංඛාතමාහාරං ගලති අදති" යනු නිර්වචන බැවින් පූති සංඛ්‍යාත ආහාරය අනුභව කරණ යම් කිසි පුද්ගලයෙක් තෙමේ ගිහියෙක් හෝ වේවා නැතහොත් තමන්ගේ පුත්‍රධීතෘආදී ප්‍රව්‍රජිතයෙක් හෝ වේවා තමන්ගේ අතවැසි සමානොපාධ්‍යායාදීන් මමත්වය කෙරෙයිද ස්වහස්තයෙන් ඔවුන්ගේ කෙසච්ඡේදනය සූචිකර්මය චීවර ධෝවනය චීවර රජනය පාත්‍රා පිසීමය යනාදීකුදු මහත් කටයුතු අතිසය ප්‍රේමයෙන් කෙරෙයිද මොහොතක් නමුත් දර්ශන ප්‍රතිලාභය නොකරත්තේ නම් අහෝ අසවල් සාමණේර තැන කිනම් ප්‍රදේශයකට ගියේද අසවල් ළදරුවා කොතැන්හි ගියේදැයි යනාදී වශයෙන් භ්‍රාන්ත මෘගයෙකු පරිද්දෙන් හෙවත් සමෘති මෙව කල්‍යයට පත්ව වන ප්‍රදේශය මූඑල්ලෙහි සාරකැවෙමින් ත්‍රාසනවූ මෘගරාජයෙකුමෙන් ඔබ්මොබ අවලෝකනය කෙරෙයිද ශ්‍රමණාදි අනික් කෙනෙකු විසින් අපගේ කෙසච්ඡේදනය සඳහා අසවල් සාමණේරතැන හෝ අසවල් ළදරුවා මදවේලාව කට මෙහි එවනුමැනවයි ආචාර්යෝපාධ්‍යායාදීන් යදිනු ලබත් නම් අපිද ඒ කර්මය ඔහුලවා කරවා නොගන්නෙමු නෙපි ඔහු ගෙන්වාගෙණ කලාන්තකරන්නහුය යන භයින් කෙසච්ඡේදනාදිය සඳහා යාමට අවකාශ නොදෙයිද මෙබඳු ස්වභාවයෙන් යුත් පුද්ගලතෙමේ සත්ත්වකෙලායනනම් වෙයි හෙවත් සත්වයන් මමත්වය කරණ පුද්ගලයා නම් යම් කිසි පුද්ගලයෙක් වනාහි තමා අයත් චීවර පාත්‍ර තලි සැරයටි ආදිය මමත්වය කෙරෙයිද අනිකෙකුගේ හස්තයෙන් එබඳු චීවරාදිය පරාමර්ශනය කරන්නටත් නොදෙයිද එම චීවරාදිය තාවකාලික වශයෙන් ස්වල්පවේලාව කට නුමුත් යමෙක් ඉල්වන ලද්දේනම් එකල්හි අපිත් මෙය මමත්වය කරන්නමෝ පරිභෝගද නොකරමු එසේ ඇති කල්හි කිමෙක නොපට දෙන්නෙමුදැයි කථනය කෙරෙයිද මෙබඳු පුද්ගලයා සංස්කාරකෙලායන නම්වෙයි මෙපරිද්දෙන් සත්ත්ව සංස්කාර දෙකොට්ඨාසයම මමත්වය කරණ පුද්ගලයන් හාත්පසින් දුරු කිරීම උපෙක්ෂාසම්බෝධ්‍යඞ්ගය උපදවා ගැණීමට හේතුවූ තුන් වැනි අඞ්ගයවෙයි **"සත්තසංඛාර මජ්ඣත්තතා පුග්ගල සේවනතා"** යනු උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය උපදවා ගැණීමට හේතුවූ සතර වැනි අඞ්ගයයි.

සජ්ජානීතිසත්තා සංඛරියන්ති විනාසී යන්තීති සංඛාරා සත්තා ච සංඛාරා ච සත්ත සංඛාරා සත්තසංඛාරෙසු මජ්ඣත්තතා සත්ත සංඛාර මජ්ඣත්තතා තෙච තෙ පුග්ගලා චෙති සත්තසංඛාර මජ්ඣත්ත පුග්ගලා තෙසං සෙවනා භජනා සත්ත සංඛාර මජ්ඣත්ත පුග්ගල සෙවනා තාසං භාවො සත්ත සංඛාර මජ්ඣත්ත පුග්ගල සෙවනතා, සත්ව සංස්කාර දෙකොටසෙහි මධ්‍යස්ථවූ පුද්ගලයන් සෙවනය කරණ බව හෙවත් එබඳු පුද්ගලයන් භජනය පයිරුපාසණය කිරීම මේ බෝධ්‍යඞ්ගයට සතරවැනිවූ අඞ්ගයයි මෙසේ සේවනය භජනය පයිරුපාසණය කරණ යොගාවචර භික්ෂු තෙමේ සත්ව සංස්කාරයන් කෙරෙහි උදාසීන විය යුතුයි අධික මමත්වයට හා අධික සැහැල්ලු භාවයටද නොපැමිණීම උදාසීනත්වයයි "තදධිමුත්තතා" යනු නම් තදුත්පාදනය පිණිස නමිත ප්‍රවන ප්‍රාග්භාරවීම පස්වැනි අඞ්ගයයි උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය උපදවා ගැණීම පිණිස නම්‍රවූ සිත් ඇති පුද්ගලයාටද එය සමුඪිවේය යන අදහසයි සත්ව මධ්‍යස්ථභාවය ආදිකොට ඇති අඞ්ගපස ඇසුරුකරන්නාවූ පුද්ගලතෙමේ අර්හන්මාර්ග ඥානය දක්වා උපෙක්ෂා සම්බෝධ්‍යඞ්ගය වඩන්නේවෙයි ඒම ඵලයෙහි පිහිටි කල්හි වඩනු ලැබූ කෙනෙක්වූයේ වෙයි. මෙලෙසින් සතිසම්බොධ්‍යඞ්ගය ආදී සප්තවිධ බොධ්‍යඞ්ග ධර්ම්ය භාවනාවශයෙන් වඩන්නාවූ ආදි කර්මික කුලපුත්‍රතෙමේ සෝවාන් ආදි සතරමග සතර ඵල පිළිවෙලින් සාන්ත සුව ලක්ෂණ නිර්වාණ සම්පත්තිය ලබන්නේයි.

මෙසේ අති සංක්ෂෙපයෙන් සංග්‍රහ කරණලද

**බොධ්‍යඞ්ග ධර්ම විභාගය සමාප්තයි.**

පත්තීන් පිරීතිබෙයි. මුළුදඹදිව සත්වයො කැමති කැමති වස්ත්‍රා
භරණ ඉන්එක් කප්රුකකින් ගෙණ ගියත් අසූදහසක් අවුරුදුමුළුල්
ලෙහි ඇඳනිමවා ගතනොහැක්කේමය-ඒකේතුමතීනම් රාජධානි
යෙහි දණ්ඩන්පතින් කළ ගෙයක වසත්තාවූ එකද සත්වකෙනෙක්
නැත සත්රුවන් ගෙවල්වලම වාසයකෙරෙති දිව්‍යමයවූ උයන් හා
දිව්‍යමයවූ පොකුණෙන්ද ගැවසීතිබෙයි. එකල දඹදිවමුළුල්ලෙහි
සත්වයන් ගෙන් සාතාකෙනෙක් වපුරණකෙනෙක් වෙළඳාම්කරණ
කෙනෙක් බඩතිසාදුක්ගන්නා එකමසත්වකෙනෙක් වත් නැත පො
ලොව පලාගෙණ සවයංජාත හැල් පැනනැගෙයි ඒ කරල්වල
කුඩුනැතිව මුතුදල් සේසාල්ගෙණතිබෙයි එක්බිජුවටක් හුනුනැතින්
නැගි පඳුරෙහි කරල්කපා වැඩගත්කල දෙදහස් දෙසිය දෙසැත්තෑ
ගැලක් පුරාසොළසාමුණු අටලාසක් සාල්ඉරිව තිබෙයි ඒ සැල්මැ
ණික් උඳුනෙහි තබා බත් පැසුනුකල හැමදම හැමසත්වයෝම අනු
භවකෙරෙති.

ඒ නුවර සංඛනම් චක්‍රවර්ත්තිරජෙක්වෙයි ඒ රජහට නුවර මධ්‍ය
යෙහි පස්විසි යොදුන් රුවන් පහයෙක්වෙයි එකල්හී දඹදිව්තලය
දෙව්නුවරක්සෙයින් විසිතුරුවෙයි උතුරුකුරුදිවයිනසෙයින් සුල
භ අනහපාණවෙයි

එකල්හි මෛත්‍රයබෝසතාණෝ තුසීපුරයෙන් සැවඅවුත් කෙ
තුමතීනම් රාජධානියෙහි සංඛනම් චක්‍රවර්තිරජව අණියෙන් ධර්ම
යෙන් අනුශාසනාකරණ සුබ්‍රාහමණනම් පුරොහිතයා පිණිස බ්‍රහම
වතීනම් බිසවගේ කුසපිළිසිඳගෙණ දසමාසාවසානයෙහි අනෙක
ප්‍රකාර ප්‍රාතිහාර්‍යශත සහශ්‍ර දක්වමින් මව්කුසින් ප්‍රසූතව අජිතනාම්
කුමාරව වැඩිවිය පැමිණ නළුගණ පිරිස්පිරිවරා පොළොව පලාපැන
නැගී සිඩණීය චන්ද්‍රකය වඩ්ඪමානකය යන සත්රුවන් ප්‍රාසාදත්‍ර
යෙහි දිව්‍යමයවූ සම්පත් අනුභවකෙරෙමින් අටදහසක් අවුරුදු ගිහි
ගෙයි වාසයකොට චන්ද්‍රමුඛිනම් අගබිසව කුසින් බ්‍රහමවර්ධන නම්
පුත්රුවන උපන්ද චතුර්විධනිමිත්තදැක පැවිදිව සප්තාහයක් ප්‍රධාන
යොගකොට වජ්‍රමුඛිනම් අගබිසවදුන් කිරිපිඩු වළඳා රුවන්පහ
යෙන්මගොස් දකුණුදෙසෙන් නැගිතුන්යලක් පැදකුණුකොට අප
රාජිතස්ථානයේ පැනනැගී රිදීකඳක්සේ සුමට වට්වූ එක්සිය විසිරි
යන් කඳවෙයි එපමණ පළමහා සාඛාඇති සාඛාමණ්ඩලයවටින්
සත්සියවිසිරියන් පමණ ඉඳුනිල්මිණි සේසතක්සේ ඇමදුම සො
භාමත්කරන්නාවූ ඇමදුම විලිකුණ්ව වැගිරෙණ පතකුදු නැතමුහු
කලපත්ඉන්ද්‍රනීලමාණික්‍යමයවූ පැහැඇති අසුඅස්සෙහි ලියහා අංකු
ර ප්‍රවාලමය පැහැඇති මුලපටින් අගදක්වා මලින්සැදීසිටිනෝය.

දෙළොස් නැලියක් පැන්ගන්නාපමණ කැකුළුඇති පිපිකලමහනැල් සකක් පමණවෙයි එකි එකී මලෙහි නැලියක් නැලියක් පමණ රේනුවෙයි එදා පිපිමල් අසූදහසක් අවුරුදු පරනොවීතිබෙයි ඒ බුදුන්ගේ පිරිනිවීම හා සමග ඇම මල් පරවනවුවෙන් ගැලවී පෙනතකුත් බිම නොගිආකාශයෙන්ගොස් දරසෑයෙහි වැගිර ඒ බුදුන් හා සමග ආදහනවෙයි.

මෙබඳුවූ නාග ශ්‍රීබෝධියට පිටලා පැදුම්ලොවබලා වැඩහිඳ බුදුවෙති ඒ බුදුන්ට අශෝකය බ්‍රහ්මදේවය යන මහතෙරදෙදෙනෙක් අගසව්වෙති සිංහනම් මහතෙරකෙනෙක් අග්‍රඋපස්ථායක වෙයි ඇම දම දිවාරාත්‍රියෙහි පස්විසියොදුන් තැන්පැතිරසිටිනා බ්‍යාමප්‍රභාමණ්ඩලයවත්තේය. ඒ මෛත්‍රෙය බුදුන්ගේ බුඩකාය අසූටරියන් පමණවන්නේය.

ශ්‍රී පාදයෙහි පටන් ජානුමණ්ඩලයට දෙවිසිරියන් උසය ජානුමණ්ඩලයපටන් නාභිමණ්ඩලයට දෙවිසිරියන් උසය නාභිමණ්ඩලයපටන් අකුධාතුවට දෙවිසිරියන් උසය සිරොධාතුව පස්විසිරියනය දෙබැම සඟල පස් පස්රියනය දෙබැම පස් පස්රියනය නෙත්‍ර සඟල පස් පස් රියනය නාසිකාවසත්රියනය රන්වන්වූ කන්වැල් සඟල සත්සත් රියනය ශ්‍රීහස්තදෙක සතලිස්රියන් පමණවන්නේය එකි එකී අතුල් පස් පස් රියනය ශ්‍රීපාදදෙක තෙලෙස්රියන් එක් වියත් සාඟුල් පමණවන්නේය.
මේ ආදී දෙතිස්මහපුරුෂලක්ෂණයෙන් සමන්විතව සපරිවාරමාරපරාජයකොට දශසහශ්‍රී ලෝකධාතුව එකපැහැර කම්පාකරවමින් ලොවුතුරා බුදුවනසේක.

මෙසේ ඒ ශ්‍රීමත්වූ බුඩකායකින් දම්සක් පැවතුම් සූත්‍රදෙශනාකොට එතැන්පටන් තුන්ලෝවාසීන්ට සඩ්මාමෘත පානය කරවමින් සියළුසත්වයන් සංසාරසාගරයෙන් ගොඩනගා මෛත්‍රෙය බුදුහු අසූදහසක් අවුරුදු ආයුශ්‍රී වලඳනසේක.

ඒ මෛත්‍රෙය බුදුන් දක්නෝකවුරුද නොදක්නෝකවුරුද යතහොත් මාතෘඝාතක පිතෘඝාතක අර්හන්තඝාතක ලෝහිතුප්පාදක සංඝභෙදකයයි යන පංචානන්තරියකර්මයකළාහු ඒ මෛත්‍රෙය බුදුන් නොදක්නෝය.

මෙලොවනැත පරලොවනැත කම්නැත කම්ඵලනැත මව්නැත පියන්නැත කලාවූ කුසලයෙහි විපාකනැතැයිකියා මෙසේනියත මිථ්‍යාදෘෂ්ටිගෙණ අළුගා ඇවිදිනා සත්වයෝද ආර්‍ය්‍යොපවාද කලාවූසත්වයෝද නරකයෙහි ප්‍රෙතයෝනියෙහි අසුරකායෙහි අරූතල අසංඥතලයෙහි උපන්නාවූ සත්වයෝද ඉන්ද්‍රියවෛකල්‍යයට පැමිණිස

ත්වයෝද ප්‍රත්‍යන්තජනපදයෙහි උපන්සත්වයෝද නිගණ්ඨාදි පාෂාණ්ඩයොද බුදුන්සතුදෙය ධර්මයසතුදෙය සංඝසතුදෙය නොසඟින් ගන්න කැවෝද ඒ මෛත්‍රෙයබුදුන් නොදක්නෝමය.

වෙයින් පිටත් අවශේෂසත්වයන්ගෙන් දුගී මගී යාචකයන්ට හා මහණබමුණන්ට දන්දුන්නෝද ඒමෛත්‍රෙය බුදුන් දක්නෝමය.

පන්සිල් රක්ෂාකළෝද පෙහෙවස් රක්ෂාකළෝද බඹසරවස්රක්ෂාකලොද දාගැබ්කරවූවෝද බෝධිපිහිටෙව්වෝද පුස්පාරාම ඵලාරාමකරවූවෝද උයන් පොකුණුකරවූවෝද භෝජනශාලාකරවූවෝද ලින්කැපූවෝද පින් පැන්තැබූවොද බුදුසසුන් ඇතිකරන්ට වහල් වූවෝද ධර්මකථිකයන්ටමන්ඩපසාරවා පිළිගැන්වූවෝද ඒමෛත්‍රෙය බුදුන් දක්නෝමය.

ධර්මාසන කබලිවනවසුන් දුන්නෝද විජිනිපත් අතවඩසවාදුන්නෝද බනකියනගේ වියන්බැන්දෝද වියනෙහි මලලොඹුඑල්වූවෝද බනකියනගෙයි පහන්දැල්වූවොද බනට අඩගැසූවෝද ධර්මකථිකයන් පයසේදූවෝද යනමේ සියළුම එනාවන්ගොටනිමවා බනකියන් නන් ආචාර උපචාරයෙන් වඩාගෙනවුත් ධර්මාසනයෙන් වඩා හිඳුවා සත්කාරකොට බන පවත්වා බන ඇසූවෝද ඒමෛත්‍රෙය බුදුන්දක් නෝමය.

තවද ආමිසදාන ධර්මදානාදීන් සංඝයාවහන්සේට පූජාසත්කාරයෙලෝද මවුන්ටඋපස්ථානකලොද පියන්ට කුලදෙටුවන්ට උපස්ථාන කලොද ලාබත් පොහොබත් අවදිබත් දුන්නෝද දසපින්කිරියවත් පිරුවොද සඞ්ඝාරාමකෙරෙවූවෝද පිළිමගෙවල්කරවූවෝද පිළිම කරවා ඇස්තිබූවෝද ඒමෛත්‍රෙය බුදුන් දක්නොමය.

තවද ඒ මෛත්‍රෙයබුදුහු දක්නට්වඩිපතා යත්පිරිසෙයින් එක මලක් එකපහනක් එක බත්ආලෝපයක් පමණ දුන්නෝද ඒ මෛත්‍රෙය බුදුන්දක්නෝමය

අනුත්කලපින් සතුටුවනන්නෝද ඒ බුද්ධෝත්පාදයෙහිම උපදමෝ වයි පතා කුසල්කල ඒ දිව්‍යමනුෂ්‍යයෝ ඒමෛත්‍රෙය බුදුන් දක්නෝමය ඒ දිව්‍යමනුෂ්‍යයෝ ඒ මෛත්‍රෙය බුදුන්ගෙං බනඅසා මාර්ගඵලයට පැමිණෙන්නාහ.

මාර්ගඵලයට පැමිණෙන්ට අසමර්ථකෙනෙක් ස්වර්ගයෙහි උපදනාහ එබැවින් පින්වත් පුරුෂයෙනි නොපමාසිතුදු ධර්මශ්‍රවණාදිවශයෙන් අදමෙතැන්හි රැස්කරණලද කුසලධර්මයන් වෙන් වෙන්කොට සිතුකල ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ දැකීමට නියතවූ බොහෝ කුසලධර්මයක් වණබැවින් ධර්මශ්‍රවණයකිරීමෙහි සහ කරවීමෙහි නියැලීව වාසය කටයුත්තේය,

## මෛත්‍රෙය වර්ණනාව නිමි.

සුභමස්තු.

# ශුද්ධි පත්‍රය.

| පිට | පෙළ. | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 3 | 21 | විවේයකද | විවේකායද |
| ,, | 37 | බාබරෙ | බාහිරෙ |
| 4 | 27 | තදධිමුත්තතාණි"ති | තදධිමුත්තතා"ති |
| 6 | 33 | සීතෙ | ගතෙ සීතෙ |
| 7 | 3 | ප්‍රභතාය | ප්‍රභාතය |
| ,, | 27 | සම්බන්ධයෙහි | සකාශයෙහි |
| ,, | 34 | තාදීන් | යතාදීන් |
| ,, | ,, | ධර්මයෙහිටියගුණ | ධර්මයෙහි ගුණ |
| 9 | 20 | මෙසේ දක්වා | දක්වා |
| 10 | 16 | වුච්චන්ති | වුච්චති |
| ,, | 27 | සැපෙත්තාහු | සැපෙත්තාහු |
| 14 | 12 | කොඨාසයා | කොට්ඨාසයා |
| 15 | 14 | ශෙදපණස් | පණස් |
| 17 | 15 | අධ්‍යාත්මික | ආධ්‍යාත්මික |
| 18 | 12 | වස්තු | වස්තුව |
| 19 | 26 | අතාපතවූයේ | අතාප්තිවූයේ |
| 20 | 26 | කලාත්ත | කලාත්ත |
| 22 | 32 | වට්තා | වට්ටිතා |
| 25 | 20 | විපරිතාඥයෙකුද | විපරීතඥයෙකුද |
| 26 | 14 | විපස්සන | විපස්සනා |
| ,, | 15 | සමන්තතාපි | සමන්තාපි |
| 28 වෙනි පිටේ 19 පෙළ පටන් 22 පෙළ දක්වා | | අවිජ්ජානිරොධා රූප නිරොධොතණ්හා නි රොධා රූප නිරො ධො කම්ම නිරොධා රූපනිරොධොආහාර නිරොධා රූපනිරො ධො අවිජ්ජා සමුදයා | කම්මසමුදයාරූපසමු දයො ආහාරසමුදයා රූපසමුදයො අවිජ්ජා නිරොධා රූපනිරො ධො තණ්හා නිරො ධා රූප නිරොධො කම්මනිරොධා රූප |

| | | | |
|---|---|---|---|
| | | වෙදනා සමුදයො ඵ සස සමුදයා වෙදනා සමුදයො | නිරොධො ආහාර නිරොධා රූපනිරොධො අවිජ්ජා සමුදයා වෙදනා සමුදයො තණ්හා සමුදයා වෙදනා සමුදයො කම්ම සමුදයා වෙදනා සමුදයො ඵස්ස සමුදයා වෙදනා සමුදයො |
| 29 | 27 | මේවූ | මෙසේවූ |
| ,, | 28 | සේවනයට | සේවනය |
| ,, | ,, | සම්බොජ්ඣඞ්ගය | සබොජ්ඣඞ්ගයට |
| 34 | 5 | පිණ්ඩපාතායපවාතතා | පිණ්ඩපාතාපවායතතා |
| ,, | 12 | කාරණං | කාරා[illegible]ං |
| 35 | 18 | කැඩු සහ ලින් | *කුඩු සහ ලින් |
| 37 | 5 | එකාල | එකල |
| 40 | 37 | පටිබාහිරං | පරිබාහිරං |
| 41 | 7 | වෙත්ද | වේද |
| 42 | 31 | කත්ථක | කණ්ථක |
| 43 | 13 | වාදස | වාදස |
| 44 | 16 | නා | නතතා |
| 46 | 11 | සිනිඩපුගගලසෙවනතා | සිනිඩපුග්ගලසෙවනත |
| ,, | 19 | ඔක්කතිවා | ඔක්කමිත්වා |
| 49 | 23 | අජපාල | අපලාල |
| 53 | 30 | භවාය | භාවය |
| 56 | 12 | අභීත් එලාවබොධයෙන් | අභීත් එලාවබෝධයෙන් |
| ,, | 17 | ප්‍රත්‍යාත්පාදනය | ප්‍රීත්‍යාත්පාදනය |
| 61 | 8 | අපස්සද්ධි | පස්සද්ධි |
| ,, | 12 | අලලානිවෙව | අලලානීවෙව |
| ,, | 24 | බෞඩ්‍යාඞ්ගයන් | බොධ්‍යඞ්ගයන් |
| 63 | 15 | අටටමහා | අෂ්ටමහා |
| 64 | 15 | ප්‍රමාණවූ | ප්‍රවණවූ |
| ,, | 35 | තනු | තත්‍රු |

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු